# වයඹ පළාත් පාලන දෙපාර්තමේන්තුව

# වෙන්නප්පුව ප්‍රාදේශිය සභාව

## <u>2025 වර්ෂයේ/ 07 වන සභා වාරයේ මහා සභා රැස්වීම් වාර්ථාව</u>

## <u>2025.11.11</u>

<u>පැමිණීම</u>

1. ගරු  සභාපති ටී.බී.ඩී ඇන්ටනී කුමාර් මයා
2. ගරු උප සභාපති  එස්.ඒ.ඩී.ලාල් ප්‍රියන්ත සියඹලාපිටිය මයා
3. ගරු මන්ත්‍රි ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මයා
4. ගරු මන්ත්‍රි එල්.සුසන්ත ශ්‍රීනාත් ප්‍රනාන්දු මයා
5. ගරු මන්ත්‍රි කේ.වී.සුසන්ත පෙරේරා මයා
6. ගරු මන්ත්‍රි බී. ඇන්ටනී සුනිල් සාන්ත පෙරේරා මයා
7. ගරු මන්ත්‍රි ආර්.පී.අකිල ශිරංග රාජපක්ෂ මයා
8. ගරු මන්ත්‍රි ඩබ්.ඒ.ආර්.ෂවීන් ප්‍රනාන්දු මයා
9. ගරු මන්ත්‍රිනී අයි.නයෝමි රම්‍යලතා මිය
10. ගරු මන්ත්‍රිනී ජේ.කේ.දීපා මේරි අයිරාංගනී පෙරේරා මිය
11. ගරු මන්ත්‍රි ජී.ලලිත් ඔස්කා පෙරේරා මයා
12. ගරු මන්ත්‍රි කේ.ඩිලාන් මලිත් බ්‍රවුන්සන් ප්‍රනාන්දු මයා
13. ගරු මන්ත්‍රි කේ.බී.වරුණ පෙරේරා මයා
14. ගරු මන්ත්‍රි ඒ.ඒ. විමුත් සුසන්ත අප්පුහාමි මයා
15. ගරු මන්ත්‍රි ඩී.මනෝජ් ඉන්දික මධුෂාන් පෙරේරා මයා
16. ගරු මන්ත්‍රිනී වයි.ටෙක්ලා ජයම්පති විජේසේකර මිය
17. ගරු මන්ත්‍රි සී.ජූඩ්. ප්‍රියදර්ශන ප්‍රනාන්දු මයා
18. ගරු මන්ත්‍රි අයි.පී. ප්‍රගීත් ධර්මජීව මයා
19. ගරු මන්ත්‍රි ජී.එම්.සඳුන් මධුමාල් ගම්පහ මයා
20. ගරු මන්ත්‍රි ආර්.එම්.අජිත් උදයසිරි රණතුංග මයා
21. ගරු මන්ත්‍රි කේ.එල්.සමන් රෝහිත මයා
22. ගරු මන්ත්‍රිනී එල්.ජයංගා රුවනාරි ප්‍රනාන්දු මිය
23. ගරු මන්ත්‍රිනී පී.කේ.හසංකා සෙව්වන්දි දයාරත්න මිය
24. ගරු මන්ත්‍රි එම්.සුරංගා රනිල් ක්‍රිෂාන්ත ප්‍රනාන්දු මයා
25. ගරු මන්ත්‍රි ජගත් කීර්ති කුමාර අබේරත්න මයා
26. ගරු මන්ත්‍රිනී ඒ.එම්.මනෝරි එරන්දති මිය
27. ගරු මන්ත්‍රි ජේ.එම්.ජනක චමින්ද ජයසේකර මයා
28. ගරු මන්ත්‍රි කේ.අජිත් නිශාන්ත ප්‍රනාන්දු මයා
29. ගරු මන්ත්‍රි ඒ.ඒ.චොහාන් සන්දීප් මයා

30. ගරු මන්ත්‍රී කේ.එල්.ඩී.පී.සංජය අප්පුහාමි මයා
31. ගරු මන්ත්‍රිනී ඩී.කේ.ඩී.අයෝධා ගිත්මි මෙනවිය
32. ගරු මන්ත්‍රී ඒ.එච්.ගාමිණී රෙක්ස් ප්‍රනාන්දු මයා
33. ගරු මන්ත්‍රී ඩබ්.දිනේෂ් සංජීව ප්‍රනාන්දු මයා
34. ගරු මන්ත්‍රී ආර්.එම්.ශ්‍යාම් පෙරේරා මයා
35. ගරු මන්ත්‍රී ඩී.මලිත් සමීර පෙරේරා මයා
36. ගරු මන්ත්‍රී ජේ.පී.උපාලි සඳසිරි මයා
37. ගරු මන්ත්‍රී එස්.ඒ.අජිත් අමරජීව මයා
38. ගරු මන්ත්‍රිනී කේ.ඒ.ඩී.ශ්‍රීමාලි ඉන්ග්‍රිට් මිය
39. ගරු මන්ත්‍රිනී ජේ.ඒ.ඩී.ජසින්තා ඉන්ද්‍රානි මිය
40. ගරු මන්ත්‍රිනී ආර්.පී.මෙලනි චතුරිකා රන්තිලක මිය
41. ගරු මන්ත්‍රී සුධීර ප්‍රදීප් රණසිංහ මයා
42. ගරු මන්ත්‍රී එස්.ඒ.දීපාල් මයා
43. ගරු මන්ත්‍රී එම්.පී.බ්‍රයන් පෙරේරා මයා
44. ගරු මන්ත්‍රී ඩබ්.විමලසිරි පෙරේරා මයා

මෙදින පෙ.ව 9.00ට මහ සභා රැස්වීමේ කටයුතු ගරු සභාපති ටී.බී.ඩී. ඇන්ටනී කුමාර් මහතාගේ ප්‍රධානත්වයෙන් වෙන්නප්පුව ප්‍රාදේශිය සභා මහ සභා රැස්වීම් ශාලාවේදි ආරම්භ විය.

**1. 2025.10.14 දින පැවති මහ සභා රැස්වීම් වාර්තාව සම්මත කිරීම.**

2025.10.14 දිනැති මහ සභා වාර්තාව සත්‍යයක් බව ගරු උප සභාපති එස්.ඒ.ඩී.ලාල් ප්‍රියන්ත සියඹලාපිටිය මයා විසින් යෝජනා කල අතර එම යෝජනාව පහත සඳහන් සංශෝධන වලට යටත්ව ගරු මන්ත්‍රී ඩී.මනෝජ් ඉන්දික මධුෂාන් පෙරේරා මයා විසින් ස්ථිර කිරීමෙන් පසු සභා සම්මත විය.

**2025.10.14 දින පැවති මහ සභා රැස්වීම් වාර්ථාවේ සංශෝධන :-**

<u>යෝජනා අංක 2</u>
පෙර පැවති මහ සභා වාරයකදී මැටිකොටුව නෙළුම් උයන ප්‍රජා ශාලාවෙහි අගුලු කඩා අනවසරයෙන් ඇතුළු වී අනීතික කටයුත්තක් සිදු කල බව ගරු මන්ත්‍රී කේ.වී.සුසන්ත පෙරේරා මහතා මහ සභාවේදිම පැවසූ බව ප්‍රකාශ කරමින් ගරු මන්ත්‍රී ආර්.එම්.ශ්‍යාම් පෙරේරා මහතා විසින් ප්‍රකාශයක් සිදු කල නමුත් එය වාර්තාවේ සඳහන් වී ඇත්තේ එම අනීතික කටයුත්ත ගරු මන්ත්‍රී එල්.සුසන්ත ශ්‍රීනාත් ප්‍රනාන්දු මහතා විසින් සිදු කල බවයි. ඒ අනුව එම නාමයන් සංශෝධනය විය යුතු බව ගරු මන්ත්‍රී එල්.සුසන්ත ශ්‍රීනාත් ප්‍රනාන්දු මහතා විසින් පවසන ලදි.

පසුගිය සභා වාරයේදී අයවැය පිළිබද සාකච්ඡා කිරීමේදී අයවැය සඳහා කථා 06 බැගින් ආණ්ඩු පක්ෂයටත් සෙසු පක්ෂ වලටත් ලබා දීම සුදුසු බව තීරණය වූ නමුත් එය 2025.10.14 මහ සභා වාර්තාවේ සඳහන් වී නොමැති අතර එය සංශෝධනය විය යුතු බව ගරු මන්ත්‍රී ජේ.එම්.ජනක චමින්ද ජයසේකර මහතා විසින් පවසන ලදි.

2025.09.09 මහ සභා වාර්තාවේ "විපක්ෂයේ මන්ත්‍රිවරු" ලෙස සඳහන් වී ඇති නමුත් එය සංශෝධනය කර "පත් කර එවන ලද මන්ත්‍රිවරු" ලෙස සඳහන් කරන ලෙස පැවසූ නමුත් 2025.10.14 මහ සභා වාර්තාවේ එම සංශෝධනය නිවැරදි වී නොමැති අතර නැවත එය සංශෝධනය විය යුතු බව ගරු මන්ත්‍රී එම්.පී.බ්‍රයන් පෙරේරා මහතා විසින් පවසන ලදි.

රීති අංක 6 (ඇ) යටතේ රීතියක් ඉදිරිපත් කල බව පුලපුලා පැවසුවද එම රීති අංකය සඳහන් කර නොමැති අතර එය සංශෝධනය විය යුතු බව ගරු මන්ත්‍රී එම්.පී.බ්‍රයන් පෙරේරා මහතා විසින් පවසන ලදි. එමෙන්ම රීති පිළිබඳ ඉදිරිපත් කල මොහොතේ ගරු මන්ත්‍රී ආර්.එම්.ශ්‍යාම් පෙරේරා මහතා ද විවාදයකට එක් වූ අවස්ථාවේ ගරු සභාපතිතුමා විසින් එම අවස්ථාවේ විවාද කල නොහැකි බවට පැවසුවත් එම කතිකාවත මහ සභා වාර්තාවේ සඳහන් වී නොමැති බවද පවසන ලදි.

<u>යෝජනා අංක 4</u>
මෙතෙක් පැවති ක්‍රමවේදයට අනුව සංක්ෂිප්ත වාර්තාවක් ලබා **නොදී ඇත්තේ** නොව **දිය නොහැක්කේ** යනුවෙන් සංශෝධනය විය යුතු බව ගරු මන්ත්‍රී එම්.පී.බ්‍රයන් පෙරේරා මහතා විසින් පවසන ලදි.

<u>යෝජනා අංක 22</u>
2025.10.12 දින ඇමතිතුමා විසින් යම් ලිපියක් වට්ස්ඇප් හරහා යොමු කලේ නම් ක්ෂණිකවම සියලුම මන්ත්‍රිවරුන්ව දැනුවත් කිරීමට හැකියාව තිබූ නමුත් නීතිමය නොවන අයුරින් කටයුතු නොකරන ලෙස පැවසූ බව වාර්තාගත වී නොමැති අතර එය සංශෝධනය විය යුතු බව ගරු මන්ත්‍රී එම්.පී.බ්‍රයන් පෙරේරා මහතා විසින් පවසන ලදි.

**<u>2025.09.24 දින පැවති පොදු පහසුකම් සංවර්ධන හා ආපදා කළමනාකරණ කාරක සභාව.</u>**
සියලු යෝජනා ගැටලු ලැබෙන දාතම යටතේ පෙළගැස්වීමක් සිදු කල යුතු බව පැවසුවද එය වාර්තාවේ සඳහන් වී නොමැති බව ගරු මන්ත්‍රී එම්.පී.බ්‍රයන් පෙරේරා මහතා විසින් පවසන ලදි.

**<u>2025.09.17 දින පැවති ප්‍රජා සංවර්ධනය පිළිබඳ කාරක සභාව.</u>**
ගරු මන්ත්‍රිනී ජේ.ඒ.ඩී.ජසින්තා ඉන්ද්‍රානි මිය විසින් ශුද්ධවූ පවුලේ ආදි ශිෂ්‍යාවන්ගේ සංගීතමය වැඩසටහනට අනුග්‍රහය ලබා නොදීමට හේතුව විමසා සිටි අතර එය ආදි ශිෂ්‍යාවන් විසින් සිදු කරන නමුත් පාසලේ දරුවන්ගේ අධ්‍යාත්මික ගුණාත්මකභාවය දියුණු කිරීම අරමුණු කොට ගනිමින් සිදු කරන බව පවසන ලදි. ගරු මන්ත්‍රී ඒ.ඒ.වොහාන් සන්දීප් මහතා පවසා සිටියේ අදාල ඉල්ලීම් ලිපියෙහි අනුග්‍රකත්වයක් ඉල්ලා සිටි නමුත් කිසිදු අයෙකුට අනුග්‍රහකත්වයන් ලබා නොදෙන බවයි. මීට පෙර සියලු ඉල්ලීම් සම්බන්ධයෙන් විනෝද බද්ද ලිහිල් කිරීම හෝ මුදල් නිදහස් කිරීමක් සිදු කල අතර අනුග්‍රහයන් ලබා නොදුන් බව පවසන ලදි. ගරු මන්ත්‍රිනී ජේ.ඒ.ඩී.ජසින්තා ඉන්ද්‍රානි මිය පවසා සිටියේ එය එම ඉල්ලීම් ලිපියෙහි සිදු වී ඇති අතපසුවීමක් බවත් මෙය දරුවන් වෙනුවෙන් සිදු කරන බැවින් ලිපියෙහි අනුග්‍රහක් ලබා දීම පිළිබදව සඳහන් වී තිබීම වැරදීමක් බවත් පැවසූ අතර මෙය කාලීන අවශ්‍යතාවයක් වන බවත් පවසන ලදි. ඒ අනුව ගරු සභාපතිතුමා පවසා සිටියේ මෙම කරුණ සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් සමඟ එළැබෙන ප්‍රජා සංවර්ධන කාරක සභාවට යොමු කිරීම සුදුසු බවයි.ඒ අනුව ඉහත කතිකාවත 2025.10.14 මහ සභා වාර්තාවේ සඳහන් නොවී ඇති අතර එය සංශෝධනය විය යුතු බව ගරු මන්ත්‍රිනී ජේ.ඒ.ඩී.ජසින්තා ඉන්ද්‍රානි මිය විසින් පවසන ලදි.

ගරු මන්ත්‍රිනී අයි.නයෝමි රම්‍යලතා මිය පවසා සිටියේ ප්‍රාදේශිය සභාව සතු යන්ත්‍රෝපකරණ පන්සල් වලට ලබා දීමට විපක්ෂයේ මන්ත්‍රිවරුන් කැමති අතර යන්ත්‍රෝපකරණ පන්සල් වලට ලබා දීම සම්බන්ධයෙන් යම් කිසි තීරණයක් ගෙන තිබේ නම් හොර රහසේ යන්ත්‍රෝපකරණ ලබා නොදී, ගෙන ඇති තීරණයට අනුව කටයුතු කිරීම සුදුසු බව පැවසූ අතර එලෙස හොර රහසේ යන්ත්‍රෝපකරණ ලබා දීමෙන් ගම්‍ය වන්නේ විපක්ෂයේ මන්ත්‍රිවරුන් පන්සල් වලට යන්ත්‍රෝපකරණ ලබා දීමට අකමැති බව පැවසූ අතර එම අදහස් නිවැරදි ලෙස වාර්තාවේ සංශෝධනය විය යුතු බව පවසන ලදි.

ගරු මන්ත්‍රී ඩී.මලිත් සමීර පෙරේරා මහතා පවසා සිටියේ මීට පෙර ඉදිරිපත් කල යෝජනා අදාල කාරක සභා වෙත ඉදිරිපත් කිරීම වෙනුවෙන් ස්තූතිය පුද කල අතර මීළඟ සභා වාරයේදි ගරු සභාපතිතුමාගේ යහපත් ප්‍රතිචාරයක් ඒ සම්බන්ධයෙන් බලාපොරොත්තු වන බව පැවසුවද ඒ පිළිබදව මහ සභා වාර්තාවේ සඳහන් වී නොමැති අතර එය සංශෝධනය විය යුතු බවයි.

**2. ගරු සභාපතිතුමාගේ විශේෂ නිවේදන**

i. වෙන්නප්පුව ප්‍රාදේශිය සභාවේ උපායමාර්ගික සැලසුම් සඳහා යෝජනා කැඳවනු ලැබේ. ඒ සඳහා ඔබේ යෝජනා ලබා දී ඇති ආකෘති පත්‍රය අනුව සකස් කර 2025.11.14 දිනට ප්‍රථම ලබා දෙන ලෙස ඉල්ලා සිටිමි.

ii. ලෝක නගර දිනයට සමගාමීව නාගරික සංවර්ධන අධිකාරිය නගර නිර්මාණ ශිල්පීන්ගේ ආයතනය සමඟ එක්ව ක්‍රියාත්මක කල වැඩසටහන සාර්ථක කර ගැනීමට සහයෝගය ලබා දුන් සියලු දෙනා වෙත ස්තූතිය පුද කර සිටිමි.

iii. වෙන්නප්පුව ප්‍රාදේශිය සභාවට අයත් පෙර පාසල් 15ක දරුවන් 725 ක් වෙනුවෙන් පැවති පෙර පාසල් ක්‍රීඩා උත්සවය සාර්ථක කර ගැනීමට සහයෝගය ලබා දුන් ප්‍රජා සංවර්ධන කමිටු සභාපතිතුමන් හා මන්ත්‍රිමණ්ඩලය වෙතත් කාර්ය මණ්ඩලය සියලු දෙනා වෙතත් ස්තූතිය පුද කර සිටිමි.

ගරු මන්ත්‍රී එම්.පී.බ්‍රයන් පෙරේරා මහතා කතා කරමින්, සභාවේ න්‍යාය පත්‍රයට එකඟ විය නොහැකි බව පවසන ලදි. එයට හේතුව රටේ පවතින නීතියට අනුව ගැසට් කර ඇති දෙයක් ඉවත් කිරීමට ගරු සභාපතිතුමාට බලයක් නොමැති බව පවසන ලදි. එමෙන්ම පෙත්සම් පැමිණිලි ඉදිරිපත් කිරීමට සියලු දෙනාට අවස්ථාවක් ලබා දිය යුතු නමුත් න්‍යාය පත්‍රයට එම අවස්ථාව ඇතුලත් නොකිරීම පිළිබඳ විමසන ලදි.

ගරු මන්ත්‍රිනී අයි.නයෝමි රම්‍යලතා මිය කතා කරමින්, “පිස්සෝ වගේ හැසිරෙනවා” යන වචනය පිටුපස ආසන පෙළෙන් භාවිතා වූ බව පවසන ලදි. එතුමා ජනතා නියෝජනයක් තුලින් පැමිණි මන්ත්‍රීවරයෙක් වූ බැවින් එවැනි වචන මහ සභාවක් තුල පැවසීමට ඉඩ නොතබන ලෙස ගරු සභාපතිතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටින ලදි. එමෙන්ම එක් එක් මන්ත්‍රීවරුන් විවිධ වූ බුද්ධි මට්ටම්වල හා අධ්‍යාපන මට්ටම් වල සිටින බැවින් එවැනි ප්‍රකාශයන් සිදු කිරීම වැරදි බවත් ගරු මන්ත්‍රී එම්.පී.බ්‍රයන් පෙරේරා මහතා ඉදිරිපත් කරන ප්‍රශ්න තුලින් එතුමා පිස්සෙක් ලෙස නොහැගෙන බවත් පවසන ලදි. එමෙන්ම ආණ්ඩු පක්ෂය විසින් පැවසූ එම වචනය තරයේ හෙලා දකින බව එතුමිය පවසන ලදි. එමෙන්ම ගරු මන්ත්‍රී එම්.පී.බ්‍රයන් පෙරේරා මහතා තරුණ නවක මන්ත්‍රීවරයෙක් වන අතර යම් යම් අඩුපාඩුකම් සිදු වුවහොත් ඒවා නිවැරදි කර ගනිමින් ඉදිරියට යාම සුදුසු අතර “පිස්සා” වන වචනය එම මන්ත්‍රීවරයා වෙනුවෙන් භාවිතා කිරීම සම්බන්ධයෙන් විරුද්ධ වන බවද පවසන ලදි.

**3. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න**

<u>ගරු මන්ත්‍රී ඩී.මනෝජ් ඉන්දික මධුෂාන් පෙරේරා මහතා විසින් ඉදිරිපත් කර ඇති ප්‍රශ්නය :</u>

වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවට අයත් ලුණුවිල ප්‍රදීපා ක්‍රීඩාංගනයේ මීට වසර කිහිපයකට පෙර සුවතා මංතීරුවක් ලෙස හඳුන්වන කොටසක් ඉදි කර ඇත. එම සුවතා මංතීරු ඒකකය අවිධිමත් ආකාරයෙන් ඉදිරිකර ඇති බවටත් එහි වැඩ කටයුතු නිසි පරිදි අවසන් කර නොමැති බවටත් ලුණුවිල ප්‍රදීපා ක්‍රීඩා සමාජයේ සහ අවට ප්‍රදේශවාසීන්ගේ නිරන්තරයෙන් මැසිවිලි ඉදිරිපත් කරමින් සිටි.

i. මෙම සුවතා මංතීරුව ඉදි කරන ලද්දේ කිනම් වර්ෂයේද?
   - 2021 වර්ෂයේදි

ii. ඒ සඳහා වැය වූ මුදල කොපමණද?
   - වැට් රහිත මුදල් - රු.674,987.00
     වැට් මුදල - රු. 53,999.00
     මුළු මුදල - රු. 728,986.00

iii. සුවතා මංතීරුවේ වැඩකටයුතු සැලසුම් කල පරිදි අවසන් කර තිබේද?
   - ඔව්

iv. සැලසුම් කර ඇති පරිදි අවසන් කර නොමැතිනම් ඊට හේතු කවරේද?

<u>ගරු මන්ත්‍රී එම්.පී.බ්‍රයන් පෙරේරා මහතා විසින් ඉදිරිපත් කර ඇති ප්‍රශ්නය :</u>

i. 1988 ප්‍රාදේශීය සභා රීති 06 (ඇ) යටතේ 2025.10.14 දින මහ සභා වාරයේදි එම්.පී.බ්‍රයන් පෙරේරා සභිකයාට රීති 6(ඇ) සඳහන් පිරිදි ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාව ඉදිරියේ තැබීමට ඇති අයිතිය ලබා නොදුන්නේ ඇයි?

- මේ දක්වා පෙත්සම්,පැමිණිලි, සංදේශ ලැබී නොතිබුනු බැවින් න්‍යාය පත්‍රයට ඇතුලත් කර නොමැත. එහෙත් ඉදිරි සභා වාරයේ සිට ඇතුලත් කිරීමට කටයුතු කරමි. ඉදිරිපත් කරන පෙත්සම්, සංදේශ, පැමිණිලි සභාවට අදාල කරුණු සඳහන් විය යුතුයි. ඒ පිළිබද ලේකම්තුමාගේ විමසීමෙන් පසු මුලසුනට යොමු කරනු ලැබේ.

ගරු මන්ත්‍රි එම්.පී.බ්‍රයන් පෙරේරා මහතා කතා කරමින්, ප්‍රාදේශිය සභාව අමතා එවන ලද සංදේශ පැමිණිලි පෙත්සම් සභාව ඉදිරියේ තැබිය යුතුය යන්න රීති වල සඳහන් වී තිබුනද එවැනි අවස්ථාවක් ලබා නොදීම පිළිබද විමසන ලදි. මීට පෙර පැවති පාලන කාලයන් තුල පැවති මහ සභා වාර්තා සලකා බැලීමේදි පෙත්සම් පැමිණිලි තිබුනත් නැතත් එම අවස්ථාව න්‍යාය පත්‍රයෙහි වෙන් කර තිබූ නමුත් වර්තමානයේදි මෙම අවස්ථාව වෙන් කර නොමැත්තේ මන්දැයි විමසන ලදි.

මේ පිළිබද පැහැදිලි කිරීම සඳහා ලේකම් තුමාට අවස්ථාවක් ලබා දීමට මහ සභා අවස්ථාව කාරක සභා අවස්ථාවක් බවට පත් කිරීම සඳහා ගරු මන්ත්‍රි එම්.පී.බ්‍රයන් පෙරේරා මහතා යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී එස්.ඒ.දීපාල් මහතා විසින් ස්ථිර කරන ලදි. ඉන්පසු ලේකම් තුමා විසින් මේ පිළිබද පැහැදිලි කරන ලදි. නැවත කාරක සභා අවස්ථාව මහ සභා අවස්ථාවක් පවට පත් කිරීම සඳහා ගරු මන්ත්‍රී කේ.ඩිහාන් මලිත් බ්‍රවුන්සන් ප්‍රනාන්දු මහතා යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ඩී.මනෝජ් ඉන්දික මධුෂාන් පෙරේරා මහතා විසින් ස්ථිර කරන ලදි.

ii. පොදු පහසුකම් හා සංවර්ධන ආපදා කළමනාකරණ කාරක සභාව වෙත පැවරෙන බලතල ප්‍රකාරව කමිටු සභාපතිතුමා විසින් සභාව සතු වාහන යන්ත්‍රෝපකරණ සේවයට යොදා ගැනීම පිළිබඳව සොයා බලා ඒ පිළිබද නිර්දේශ ගරු සභාපතිතුමා වෙත යොමු කර තිබේද?
    - යොමු කර තිබේ.

iii. මෙතෙක් එකී නිර්දේශ සඳහා ගෙන ඇති පියවර මොනවාද?

    අවශ්‍යතාවය හා කමිටු නිර්දේශ මත පහත පියවර ගෙන තිබේ.

    - වීදි පහන් නඩත්තුව
    - සතිපොළ සංවර්ධන කටයුතු
    - ආපදා කටයුතු සඳහා පෙර සූදානම

iv. එසේ නම් එකී යෝජනා ගණන කීයද?

    - කමිටු මඟින් කර ඇති යෝජන - 17
    - අවශ්‍යතා මත ඉල්ලීම් ඉදිරිපත් වන පිරිදි ඉටු කරනු ලැබේ.

v. වාහනවල සේවා කාලය වැඩ පැය ගණන (යන්ත්‍රෝපකරණවල) කීයද?

    - ට්‍රැක්ටර් රථ සඳහා මී.පැ.250
    - කැබ් සහ ටිපර් රථ සඳහා කි.මී.5000
    - බැකෝලෝඩරය සහ මෝටර් ග්‍රේඩරය සඳහා මී.පැ.250 සහ සම්පූර්ණ සේවාව මී.පැ.1000

vi. සංවර්ධන කටුයුතු හෝ ආපදා සම්බන්ධව පොදු පහසුකම් හා සංවර්ධන ආපදා කළමනාකරණ කාරක සභාවට පිටින් ප්‍රාදේශිය සභා මඟින් ව්‍යාපෘති ක්‍රියාත්මක වන්නේ ඇයි? එයට හේතුව

- හදිසි අවශ්‍යතාවයන් මත පදනම් වූ කරුණු හැරුණු කොට කමිටුවට පිටින් ව්‍යාපෘති ක්‍රියාත්මක නොවේ.

vii. දැනට සිදු කල ඇළ මාර්ග පිරිසිදු කිරීම් ආදි ව්‍යාපෘති සිදු කරන්නේ කුමන කමිටුවේ නිර්දේශ මතද?
- කමිටු නිර්දේශය හා හදිසි අවශ්‍යතාවය මත

viii. 2025.06.28 දාතම සහිතව ඉදිරිපත් කල බටහිර බණ්ඩිරිප්පුව ඇල මාර්ගයේ අවහිරතා ඉවත් කිරීම, ප්‍රතිසංස්කරණය කිරීම මාතෘකාව යටතේ පාතිමා වත්ත ජල ගැලීම් ප්‍රදේශය තුල තිබෙන ආපදා සහිත ඇළ ප්‍රතිසංස්කරණය හෝ පිරිසිදු කිරීමකට පියවර නොගන්නේ ඇයි?

ix. 2025 .08.04 දින බණ්ඩරිප්පුව ගාලවත්ත ජනපදය ආශ්‍රිතව ඇල මාර්ගය පිරිසිදු කිරීම මාතෘකාව යටතේ ඉල්ලා ඇත ලිපියට අනුව ජන ජීවිතයට බලපෑම් කරන එකී ඇළ පිරිසිදු නොකරන්නේ ඇයි?
- ඉහත viii හා ix ප්‍රශ්න දෙකෙහිම අරුත සමාන වන බැවින් ප්‍රශ්න දෙකටම එක් පිළිතුරක් ලබා දෙන ලදි.

  සභාව සතු යන්ත්‍රෝපකරණ ධාරිතාව සහ ප්‍රජාවගේ අවශ්‍යතාවය මත ප්‍රමුඛතාවය ලබා දෙමින් කටයුතු කරන අතර ඉදිරියේදි ප්‍රජාවගේ සියලු අවශ්‍යතා යන්ත්‍රෝපකරණ සහ සේවක ධාරිතාව මත කමිටු මඟින් සිදු කරනු ලැබේ.

x. ඉහත ඉල්ලීම් වලට අමතරව 2025.06.20 සිට වෙන්නප්පුව ප්‍රාදේශිය සභාව වෙත පත්කර එවන ලද සභිකයන් 19 දෙනා කරනු ලැබූ ඉල්ලීම් යෝජනා ලිපි කොපමණද? කීයක් ඉටු කර තිබේද?
- සභාවේ 44 දෙනෙකු සභාවේ සිටින බැවින් මන්ත්‍රිවරුන් 19 දෙනා කවුරුන්ද යන්න නම් කර නොමැති බැවින් පිළිතුරක් ලබා නොදිය හැකි බව ගරු සභාපතිතුමා විසින් පවසන ලදි.

ගරු මන්ත්‍රි එම්.පී.බ්‍රයන් පෙරේරා මහතා විමසා සිටියේ පත් කර එවන ලද මන්ත්‍රිවරුන් හා පත් වූ මන්ත්‍රිවරුන් කවුරුන්ද යන්න ගරු සභාපතිතුමා නොදනීද යන්නයි.

ගරු මන්ත්‍රි ආර්.පී.අකිල ශිරංග රාජපක්ෂ මහතා පවසා සිටියේ ගැසට් පත්‍රයේ පත් වූ මන්ත්‍රිවරුන් සහ පත් කර එවන ලද මන්ත්‍රිවරුන් ලෙස සඳහන් කර ඇති අතර විපක්ෂයේ මන්ත්‍රිවරුන් 19 දෙනා පත් කර එවන ලද මන්ත්‍රිවරුන්ගේ කාණ්ඩයට අයත් වන බව පවසන ලදි.

ගරු සභාපතිතුමා පවසා සිටියේ සියලු මන්ත්‍රිවරුන් එක හා සමාන බවත් සියලු දෙනාටම සමාන අයිතිවාසිකම් ඇති බවත් පවසන ලදි.

ඒ අනුව ඉහත පැනයට පිළිතුරු වශයෙන් ගරු සභාපතිතුමා පවසා සිටියේ සියලු මන්ත්‍රිවරුන් යෝජනා ලබා දෙන බැවින් ඒ අතරින් මන්ත්‍රිවරුන් 19 දෙනෙකුගේ යෝජනා පිළිබඳ විමසීමේදි එම මන්ත්‍රිවරුන් 19 දෙනා කවුරුන්ද යන්න තෝරා ගත නොහැකි අතර නම් වශයෙන් ලබා දුන්නේ නම් මේ සම්බන්ධයෙන් නිවැරදි පිළිතුරක් ලබා දීමට හැකි වනු ඇතැයි පවසන ලදි. මෙම පැනයට පිළිතුරු ලබා දීමට නිලධාරින්ටද අපහසු වූ අතර නම් වශයෙන් ලබා දුන්නේ නම් ගැටලුවක් නොවන බව පවසන ලදි.

**4. යථා පරිදි කල් දී ඇති යෝජනා**

1) 05 වන පරිපූරක ඇස්තමේන්තුව සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ඩී.මනෝජ් ඉන්දික මධුශාන් පෙරේරා මහතා විසින් ස්ථිර කරන ලදි. ඉන්පසු මෙම යෝජනාව ඡන්ද විමසීමකින් තොරව සභාවේ රැඳී සිටි සියලුම මන්ත්‍රිවරුන්ගේ හා මන්ත්‍රිවරියන්ගේ එකඟතාවයෙන් සම්මත විය.

| ආදායම් උපයා ගන්නා අය විෂය | | | | ප්‍රතිපාදන වෙන් කරන වැය විෂය | | | |
|---|---|---|---|---|---|---|---|
| වැඩසටහන | අය විෂය | අය විෂය විස්තරය | ආදායම් ඇස්තමේන්තුව රු. ශත | වැඩසටහන | වැය විෂය | වැය විෂය විස්තරය | වියදම් ඇස්තමේන්තුව රු. ශත |
| සුභ සාධක සේවා | 281-06-00-00-81-i (පළාත් සභා ප්‍රාග්ධන ආධාර) | පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන (වෙනත් පළාත් පාලන සේවා ) | 1,000,000.00 | සුභ සාධක සේවා | 281-06-02-00-09-01- | අංගම්පිටිය පෙර පාසල් ගොඩනැගිල්ල ඉදි කිරීම. ( දෙවන අදියර) | 1,000,000.00 |
| භෞතික සැළසුම් | 281-03-00-00-72-i (පළාත් සභා සේවා ආධාර) | පළාත් පාලන දෙපාර්තමේන්තු ප්‍රදාන ( නඩත්තු ක්‍රියාකාරී සැලැස්ම 2026) | 500,000.00 | භෞතික සැළසුම් | 281-03-00-00-04-07 | මංමාවත් /පදික වේදිකා පාලම් කාණු අළුත්වැඩියාව (තෝප්පුතොට දුම්රියපොළ පාලම් අසල වයික්කාල පරණ පාර සංවර්ධනය කිරීම) | 500,000.00 |
| එකතුව | | | **1,500,000.00** | | | | **1,500,000.00** |

ගරු මන්ත්‍රී එම්.පී.බ්‍රයන් පෙරේරා මහතා පවසා සිටියේ 05 වන පරිපූරක ඇස්තමේන්තුව සඳහා ගරු සභාපතිතුමාගේ අත්සන නොදා තිබූ බවයි. ඒ පිළිබඳව වගකීමෙන් යුතුව කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමාට පවසන ලදි.

මෙහි පිළිබඳ පැහැදිලි කිරීමට ලේකම්තුමාට අවස්ථාව ලබා දීම සඳහා මහ සභා අවස්ථාව කාරක සභා අවස්ථාවක් බවට පත් කිරීමට ගරු මන්ත්‍රී අයි.පී. ප්‍රගීත් ධර්මජීව මහතා යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී සී.ජුඩ්. ප්‍රියදර්ශන ප්‍රනාන්දු මහතා විසින් ස්ථිර කරන ලදි. ඉන්පසු ලේකම් තුමා විසින් මේ පිළිබඳ පැහැදිලි කැන ලදි. නැවත කාරන සභා අවස්ථාව මහ සභා අවස්ථාවක් බවට පත් කිරීම සඳහා ගරු මන්ත්රී ආර්.පී.අකිල ශිරංග රාජපක්ෂ මහතා යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ඩී.මනෝජ් ඉන්දික මධුෂාන් පෙරේරා මහතා විසින් ස්ථිර කරන ලදි.

2) පළත් පාලන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ ඉදි කිරීමට යෝජිත ඇල්බට් ඇෆ් පීරිස් ක්‍රීඩාංගනයේ වාහන අංගනය, ක්‍රීඩා භාණ්ඩ අලෙවිසැල හා ආපනශාලාව ඉදි කිරීමේ රු.23,500,000.00ක ඇස්තමේන්තුව අනුමත කිරීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී කේ.ඩිහාන් මලිත් බ්‍රවුන්සන් ප්‍රනාන්දු මයා විසින් ස්ථිර කරන ලදි. ඉන්පසු මෙම යෝජනාව ඡන්ද විමසීමකින් තොරව සභාවේ රැදී සිටි සියලුම මන්ත්‍රීවරුන්ගේ හා මන්ත්‍රීවරියන්ගේ එකඟතාවයෙන් සම්මත විය.

3) 2025 නත්තල් වැඩසටහන සඳහා රු.69,000.00ක වියදම් ඇස්තමේන්තුව අනුමත කිරීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ජේ.එම්.ජනක චමින්ද ජයසේකර මයා විසින් ස්ථිර කරන ලදි. ඉන්පසු මෙම යෝජනාව ඡන්ද විමසීමකින් තොරව සභාවේ රැදී සිටි සියලුම මන්ත්‍රීවරුන්ගේ හා මන්ත්‍රීවරියන්ගේ එකඟතාවයෙන් සම්මත විය.

4) නත්තල් උත්සවයට සමගාමීව පවත්වන ආගමික වැඩසටහන් වලට අදාල රු.100,000.00ක වියදම් ඇස්තමේන්තුව අනුමත කිරීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී අයි.පී. ප්‍රගීත් ධර්මජීව මයා විසින් ස්ථිර කරන ලදි. ඉන්පසු මෙම යෝජනාව ඡන්ද විමසීමකින් තොරව සභාවේ රැදී සිටි සියලුම මන්ත්‍රීවරුන්ගේ හා මන්ත්‍රීවරියන්ගේ එකඟතාවයෙන් සම්මත විය.

5) පුස්තකාල කාර්ය මණ්ඩලයේ අධ්‍යන චාරිකාවට අදාල රු.88,000.00ක වියදම් ඇස්තමේන්තුව අනුමත කිරීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී

ඒ.ඒ.වොහාන් සංදීප් මයා විසින් ස්ථිර කරන ලදි. ඉන්පසු මෙම යෝජනාව ඡන්ද විමසීමකින් තොරව සභාවේ රැදී සිටි සියලුම මන්ත්‍රීවරුන්ගේ හා මන්ත්‍රීවරියන්ගේ එකඟතාවයෙන් සම්මත විය.

ගරු මන්ත්‍රිනී අයි.නයෝමි රමාලතා මිය කතා කරමින්, මෙම කාර්යමණ්ඩලයට ලබා දී ඇති මෙම අවස්ථාවට කිසිදු විරුද්ධත්වයක් නොමැති බව ප්‍රථමයෙන් පවසන ලදි. එතුමිය විමසා සිටියේ පුස්තකාල කාර්ය මණ්ඩලය චාරිකාව යන ස්ථානය කුමක්ද සහ 18 දෙනෙකුට රු.70,000.00ක මුදලක් බස් රථය වෙනුවෙන් වෙන් කර ඇත්තෙ කුමක් නිසාද යන්නයි.

ඒ අනුව මේ පිළිබද පැහැදිලි කිරීමට ප්‍රජා සංවර්ධන කමිටු සභාපති ගරු මන්ත්‍රී ඒ.ඒ.වොහාන් සන්දීප් මහතාට අවස්ථාව ලබා දෙන ලදි.

ගරු මන්ත්‍රී ඒ.ඒ.වොහාන් සන්දීප් මහතා කතා කරමින්, පූර්ව අත්දැකීම් සහිතව මෙය ඇස්තමේන්තුවක් ලෙස ඉදිරිපත් කල අතර ඉහත අගය සත්‍ය අගය නොවන බව පවසන ලදි. මීට පෙරදීත් පෙර පාසල් පාලිකාවන් දකුණු පළාතේ අධ්‍යයන චාරිකාවක් ගිය අතර පුස්තකාල කාර්ය මණ්ඩලයද එම මාටින් වික්‍රමසිංහ ගත් කතුවරයාගේ පළාතේ අධ්‍යන චාරිකාවක නිරත වීමට අදහස් කර ඇති බව පවසන ලදි. ඒ අනුව ඉහත දළ ඇස්තමේන්තු මුදල අඩු හෝ වැඩි විය හැකි බව පවසන ලදි.

ගරු මන්ත්‍රිනී අයි.නයෝමි රමාලතා මිය පවසා සිටියේ පෙර දේවල් සංසන්දනය කිරීම මතම නොවී වත්මන් තත්වය පිළිබඳවද සොයා බලා තීන්දු තීරණ ගන්නා ලෙසයි. එලෙසම මේ සම්බන්ධයෙන් ඔවුන් කිසිඳු අකමැත්තක් නොමැති අතර එය විය යුතු කාරණයක් බවද පවසන ලදි. ඒ අනුව මේ පිළිබද සොයා බලා අවශ්‍ය වියදම වෙන් කරන ලෙස ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටින ලදි.

ඒ අනුව ගරු සභාපතිතුමා පවසා සිටියේ එය දළ ඇස්තමේන්තුගත මුදලක බවත් නිශ්චිත මිල ගණන් කැදවීමෙන් පසු කාරක සභා හරහා සියලු දෙනාට ඉදිරිපත් කරන බවයි.

6) වෙන්නප්පුව ප්‍රාදේශිය සභාවේ වර්ෂ අවසාන සේවක අභිප්‍රේරණ වැඩසටහනට අදාල රු.999,760.00ක ඇස්තමේන්තුව අනුමත කිරීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු උප සභාපති එස්.ඒ.ඩී.ලාල් ප්‍රියන්ත සියඹලාපිටිය මයා විසින් ස්ථිර කරන ලදි. ඉන්පසු මෙම යෝජනාව ඡන්ද විමසීමකින් තොරව සභාවේ රැදී සිටි සියලුම මන්ත්‍රීවරුන්ගේ හා මන්ත්‍රීවරියන්ගේ එකඟතාවයෙන් සම්මත විය.

| | කාර්යය | සංඛ්‍යාව | මුදල |
|---|---|---|---|
| 01 | උදෑසන කෙටි ආහාර<br>එක් අයෙකුට -රු.290<br><br>• කිරි පැකට් -රු.110<br>• සැන්විච් -රු100<br>• රෝල්ස් -රු.80 | 320 | රු.92,800 |
| 02 | දිවා ආහාරය<br>එක් අයෙකුට -රු.600 | 320 | රු.192,000.00 |
| 03 | ශාලාවේ භාවිතය සඳහා ස්ටෑන්ඩ් ෆෑන් - රු.7000 | 5 | රු.35,000.00 |
| 04 | මල් සැරසිලි හා වෙනත් වියදම් සඳහා | 1 | රු.40,000.00 |
| 05 | ශබ්ද විකාශන | 1 | රු.25,000.00 |
| 06 | සේවක ඇගයීම් තිළිණ මිලදි ගැණීමට -<br>එක් අයෙකුට -රු.1700 | 320 | රු.544,000.00 |
| 07 | ආරාධිත අමුත්තන් ගරු මන්ත්‍රී මණ්ඩලය -රු.890 | 64 | රු.56,960.00 |

| | | | |
|---|---|---|---|
| | උදෑසන කෙටි ආහාර -රු.290<br>දිවා ආහාරය -රු.600 | | |
| 08 | අවිනිශ්චිත වියදම් | - | රු.14,000.00 |
| | **එකතුව** | | රු. **999,760** |

7) කිරිමැටියාන සහ දුම්මලදෙනිය කසල අංගනවල ප්‍රතිචක්‍රීකරණ ද්‍රව්‍ය අලෙවි ආදායමෙන් 75%ක් ඊට සම්බන්ධ කම්කරුවන් හා නිලධාරින් වෙත බෙදා දීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී අයි.පී. ප්‍රගීත් ධර්මජීව මයා විසින් ස්ථිර කරන ලදි. ඉන්පසු මෙම යෝජනාව ඡන්ද විමසීමකින් තොරව සභාවේ රැඳී සිටි සියලුම මන්ත්‍රිවරුන්ගේ හා මන්ත්‍රිවරියන්ගේ එකඟතාවයෙන් සම්මත විය.

8) සෙන්දිරියාමුල්ල කොම්පෝස්ට් අංගන භූමියේ එළවළු පළතුරු ආදායමෙන් 75%ක් සේවක පිරිස් හා නිලධාරින් වෙත බෙදා දීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී කේ.බී.වරුණ පෙරේරා මයා විසින් ස්ථිර කරන ලදි. ඉන්පසු මෙම යෝජනාව ඡන්ද විමසීමකින් තොරව සභාවේ රැඳී සිටි සියලුම මන්ත්‍රිවරුන්ගේ හා මන්ත්‍රිවරියන්ගේ එකඟතාවයෙන් සම්මත විය.

9) ටෙන්ඩර් කමිටු සාමාජිකයින් සංඛ්‍යාව සංශෝධනයට අදාලව ගරු උප සභාපති එස්.ඒ.ඩී.ලාල් ප්‍රියන්ත සියඹලාපිටිය මහතා විසින් යෝජනාවන් ඉදිරිපත් කල අතර ටෙන්ඩර් කමිටුව සදහා සෙසු පක්ෂ මන්ත්‍රිවරුන් ඉල්ලා සිටි පරිදි එක් සාමාජිකයෙකු පත් කර ගැනීමට යෝජනා කරන ලදි. එම යෝජනාව මන්ත්‍රී කේ.ඩිහාන් මලිත් බ්‍රවුන්සන් ප්‍රනාන්දු මහතා විසින් ස්ථිර කරන ලදි.

ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා කතා කරමින්, පසු ගිය සභා වාරවල ටෙන්ඩර් කමිටු සාමාජිකයින් පත් කිරීම පිළිබද ඉල්ලීමක් කල නමුත් එහි විනිවිදභාවය පෙන්වීමට ඇති අවස්ථාව ආණ්ඩු පක්ෂය විසින් අතහැර දැමූ බව පවසන ලදි. එහෙත් මේ මොහොතේ නැවත විනිවිදභාවය මතක් වූයේ ඇයි විසමන ලදි. එමෙන්ම මේ වන විට යම් කිසි අක්‍රමිකතාවයන් සිදු වී ඇතැයි හදවත් තුලට හැඟෙනවාද යන්න විමසන ලදි. මෙම ඉල්ලීම විපක්ෂය නියෝජනය කරන සියලුම මන්ත්‍රිවරුන් ඉල්ලා සිටි නමුත් එම අවස්ථාව නොලැබුනු බව පවසන ලදි. නමුත් මේ මොහොතේ ගිලෙන්නට යන නැවේ එල්ලීමට සූදානම් නොවන බව පවසන ලදි. එමෙන්ම සෑම කටයුත්තක්ම විනිවිදභාවයකින් සිදු කරන අතර මීට පෙර සිටි පාලකයන් සොරකම් කර ඇති බව වත්මන් ගරු සභාපතිතුමා ඇතුළු ආණ්ඩු පක්ෂය විසින් ජනතාවට පැවසූ බව ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා සිහිපත් කරන ලදි. එහෙත් අල්ලා ගත් සොරකමක් මේ වන තෙක් නොමැති බවත් පවසන ලදි. ඒ අනුව සියලු දේ පවසා සිටියදිත් මේ මොහොතේ නැවත ටෙන්ඩර් කමිටුවට සෙසු පක්ෂ සාමාජිකයන් පත් කිරීමට තරම් ආදරයක් ඇති වීම කෙරෙහි සැකයක් ඇති බව පවසන ලදි. විපක්ෂයද පක්ෂ කිහිපක් නියෝජනය කරන බැවින් ටෙන්ඩර් කමිටුව සඳහා අවස්ථා 04ක් ලබා දීමට හැකි නම් ඉහත යෝජනාවට එකග වන අතර අවස්ථාව ලබා දීමට නොහැකි නම් ඉහත යෝජනාවට විරුද්ධ වන බව ප්‍රකාශ කරන ලදි.

ගරු මන්ත්‍රී ඩී.මලිත් සමීර පෙරේරා මහතා කතා කරමින්, ආණ්ඩු පක්ෂයේ 24 දෙනෙකුම නවක මන්ත්‍රිවරුන් වන අතර විපක්ෂයේද බහුතරයක් නවක මන්ත්‍රිවරුන් බැවින් එතුමන්ලාගේ උවමනාව වූයේ සභාව හොඳ මාර්ගයක රැගෙන යාම බවත් එම අරමුණ සියලු දෙනාගේම අරමුණක් බවත් පවසන ලදි. එහෙත් සියලුම මන්ත්‍රිවරුන් මහ සභාව තුල සාකච්ඡා කරමින් පොදු එකඟතාවයකට පැමිණියත් ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රිවරුන්ගේ හදවත් තුල ටෙන්ඩර් කමිටුව සම්බන්ධයෙන් ගත් තීරණය වැරදි බව හැගෙන්නට ඇතැයි පවසන ලදි. පෙර මහ සභාවකදි ගරු මන්ත්‍රී ඒ.ඒ.වොහාන් සංදීප් මහතා විසින් කිරි කලයට ගොම දැමීම යනුවෙන් අදහසක් විපක්ෂය වෙනුවෙන් ඉදිරිපත් කල අතර ගරු මන්ත්‍රී ඩී.මලිත් සමීර පෙරේරා මහතා ඇතුළු විපක්ෂයේ නවක මන්ත්‍රිවරුන් පිළිබද එවැනි අදහසක් ඉදිරිපත් කිරීම පිළිබද කණගාටු වන බව පැවසූ අතර

නවක මනිත්‍රිවරුන් ලෙස කිසිදු වංචා දූෂණයකට සම්බන්ධ වී නොමැති බවද පවසන ලදි. එහිදි පෙර සිටි මන්ත්‍රිවරුන්ව පත් කිරීමටවත් ඔවුන් යෝජනා නොකල බැවින් එවැනි ප්‍රකාශක් ඔවුන් සම්බන්ධයෙන් සිදු කලේ කෙසේද යන්න ගැටලුවක් පවතින බව පවසන ලදි. එම මොහොතේ ගරු සභාපතිතුමාද ඉතාම අන්තගාමී සිතුවිල්ලකි සිටි අතර ගරු සභාපතිතුමාට පෙර පැවති පාලන කාලයන් තුල සිදු වූ කෙනෙහිලිකම් පිළිබඳ ප්‍රකාශ කරමින් සිටි බවද පවසන ලදි. එහෙත් එම සියලු දෑ අමතක කරමින් කටයුතු කරන අතර එකල පාලන කාලය තුල කුමක් සිදු වූවාද යන්න අදාල නොවන අතර එකල වර්තමානයේ සිටින නවක මන්ත්‍රිවරුන් කිසිවෙක් නොසිටි නමුත් වර්තමාන ගරු සභාපතිතුමන්ට ඔවුන් ගරු කරන බව පවසන ලදි. එහෙත් ගරු සභාපතිතුමා දේශපාලනයට පැමිණීමට පෙර එක පාසලක ඉගෙන ගනිමින් සහෝදරයන් සේ සිටි සමයේ ප්‍රජාතාන්ත්‍රවාදි ලෙස කතා කල ගරු සභාපතිතුමා වර්තමානයේ අදහස් ඉදිරිපත් කරන අකාරය පිළිබඳ තමන් පුදුම වූ බව ගරු මන්ත්‍රී ඩී.මලිත් සමීර පෙරේරා මහතා විසින් පවසන ලදි. ඒ අනුව ටෙන්ඩර් කමිටුව සඳහා ඉදිරිපත් කර ඇති ඉහත යෝජනාව පිළිබඳ සැකයක් ඇති අතර මීට පෙර පැවති ආකාරයට ටෙන්ඩර් කමිටුවට මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව සම්බන්ධ කර ගනීම සුදුසු බවට යෝජනා කරන ලදි. ටෙන්ඩර් කමිටුව යනු විනිවිදභාවයක් තිබිය යුතු දෙයක් වන අතර එය සභාවේ හදවත බදු වූ දෙයක් වන බැවින් මෙය අවුල්සහගත වූවහොත් මුළු සභාවටම අභිමානයක් නොව කැළලක් වන බව පවසන ලදි. එම නිසා සියලු දෙනා එක් වී මෙම ගැටලුව විසඳා ගත යුතු අතර මේ සම්බන්ධයෙන් රණ්ඩු ඇති නොකර කටුයුතු කිරීම සුදුස වන අතර මෙයින් කිසිවත් රැගෙන නොයන අතර ජනතාවට සේවය කිරීම සියලු දෙනාගේම අරමුණ වන බව පවසන ලදි.

ගරු මන්ත්‍රී එම්.පී.බ්‍රයන් පෙරේරා මහතා කතා කරමින්, 2025.06.13 දින පැවති විශේෂ මහ සභා යෝජනා අංක 03 යටතේ ටෙන්ඩර් මණ්ඩලය වෙත බලය පැවරීම සහ ටෙන්ඩර් මණ්ඩලය පත් කිරීම සිදු කල අතර එම අවස්ථාවේදි 1988 මූල්‍ය පරිපාලන රීති අංක 178 යටතේ මහ සභාවක් ලෙස ටෙන්ඩර් මණ්ඩලයට බලය පැවරීමක් සිදු කරන්නේ සභාව වෙත ලැබෙන ටෙන්ඩර් පත්‍ර / ලංසු අයදුම් පත්‍ර විවෘත කිරීම, ලංසු ඇගයීම සඳහා ඇගයීම කමිටු පත් කිරීම, ලංසු ඇගයීම් කමිටු නිර්දේශ අනුමත කිරීම හා මිළ ගණන් පත් / ටෙන්ඩර් පත් අනුමත කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීම යන කාරණ සඳහා පමණක් බව පවසන ලදි. මේ වන වට් කාරණා 03ක් ඇති අතර උදාහරණයක් ලෙස ඇල්බට් ඇෆ් පීරිස් ක්‍රීඩාංගනයේ ගස් කැපීම පවා ටෙන්ඩර් මණ්ඩලයෙන් එහා ගොස් එක් එක් අභිමතයන් පිරිදි සිදු කරන බව පවසන ලදි. එමෙන්ම මෙවැනි යෝජනාවක් ඉදිරිය බලා ගෙන ඒම පිළිබඳව ගරු උප සභාපති එස්.ඒ.ඩී.ලාල් ප්‍රියන්ත සියඹලාපිටිය මහතාට ස්තුතිය පුද කරන ලදි. යම් කිසි කටයුත්තක් සිදු වූ පසු නැවත සභාව විසින් සොයා බැලීමක් සිදු නොකරන බව පවසන ලදි. ඒ පිළිබඳ සොයා බැලීමට කටයුතු කරන නිසා පිස්සා යන නාමයන් ඇසීමට සිදු වී ඇති බවද පවසන ලදි. ගරු සභාපතිතුමාව මන්ත්‍රිවරයෙකු ලෙස සිටි කාලයේදි සෑම දෙයක් පිලිබදව සොයා බලා ඇති බවද පවසන ලදි. මෙ වන විට ටෙන්ඩර් මන්ඩලය නියෝජනය කරන ගරු සභාපපතිතුමා, ගරු උප සභාපති එස්.ඒ.ඩී.ලාල් ප්‍රියන්ත සියඹලාපිටිය මහතා සහ ගරු මන්ත්‍රී ඒ.එච්.ගාමිණී රෙක්ස් ප්‍රනාන්දු මහතා හොරු නොවන නමුත් සමාජය හෝ කවුරුන් විසින් හෝ හොරු බවට පත් කිරීමට උත්සාහ කලොත් විපක්ෂයේ කණ්ඩාමට නිහඩ වීමට සිදු වන බව පවසන ලදි. එයට හේතුව ටෙන්ඩර් මණ්ඩලයට බලය පවරා ඇති දෙයින් ඔබ්බට ගිහින් කටයුතු කර තිබීමයි. එම නිසා මේ පිළිබඳ සුදුසු ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙස පවසන ලදි.

ගරු මන්ත්‍රී අයි.පී.ප්‍රගීත් ධර්මජීව මහතා කතා කරමින්, ප්‍රජාතන්ත්‍රවාදිව සෙසු පක්ෂයේ ඉල්ලීම මත අවස්ථාවක් ලබා දී ඇති අතර එම අවස්ථාව ප්‍රතික්ෂේප කරන්නේ නම් ඡන්ද විමසීමක් අවශ්‍ය බව ඉල්ලා සිටින ලදි.

ගරු සභාපතිතුමා කතා කරමින්, අත්දැකීම් බහුල, පෙර සභා වාරවල වාද විවාද කල ජේෂ්ඨ මන්ත්‍රිවරුන් මහ සභාව තුල ඇති අතර ඔවුන් එක් වී කණ්ඩායම් රැස්වීම් පවත්වන බවත් එකට එක් වී සංවාද සිදු කරන බවත් පවසන ලදි. සමහර ඔලු වෙනස් වූවත් කඳවල් වෙනස් වී නොමැති බවද පැවසූ අතර ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා පැවසූ විනිවිදභාවය පිළිබඳ කිසිදු සැකයක් සහ ගැටලුවක් නොමැති බව ප්‍රකාශ කරන ලදි. ගරු මන්ත්‍රී එම්.පී.බ්‍රයන් පෙරේරා මහතා පැවසූ ආකාරයේ ටෙන්ඩර් ක්‍රියා පටිපාටිය

පිළිබද ගැටලුවක් පවතී නම් එම ලිපිය පළාත් පාලන දෙපාර්තමේන්තුවට යවා ඇති අතර පෙර මහ සභාවේදි ගරු මන්ත්‍රී කේ.වී.සුසන්ත පෙරේරා විසින් ඉල්ලා සිටි විමර්ෂණ වාර්තාවද ලබා දීමට කටයුතු සිදු කර ඇති බවත් පවසන ලදි. මීට පෙර ගත් තීරණයට අනුව ටෙන්ඩර් මණ්ඩලයේ අවමය සාමාජිකයන් 03ක් වූ අතර එම නෛතික බලය එතුමන්ලාට හිමි බව පවසන ලදි. එමෙන්ම කිසිදු විටක නෛතික රාමුවෙන් පිටත කටයුතු සිදු කර නොමැති බව පවසන ලදි. පසු ගිය සභා වාරයන් තුල විපක්ෂයේ මන්ත්‍රිවරුන්ගේ ටෙන්ඩර් මණ්ඩල සාමාජිකයන් පිළිබද සාධනීය ඉල්ළීමක් තිබූ අතර එහිදි සෙසු පක්ෂ නියෝජනය කරමින් එක් එක් අයට සාමාජිකත්වය ලබා නොදි සියලුම සෙසු පක්ෂ නියෝජනය කරමින් එක් සාමාජිකයෙකුට අවස්ථාව ලබා දීම සඳහා ගරු උප සභාපතිතුමා මෙම යෝජනාව ගෙන එන්නට ඇතැයි සිතන බව පවසන ලදි. ඒ අනුව එම යෝජනාවට යටත් වෙමින් හොඳ පෞරුෂයක් සහිත කෙනෙක් සිටි නම් එම යෝජනාවට පක්ෂ වී භාර ගැනීමට පුලුවන් බවද ප්‍රකාශ කරන ලදි. එලෙස අභියෝගයක් භාර ගැනීමට නොහැකි නම් සහ ටෙන්ඩර් මණ්ඩලයට සම්බන්ධ වීමෙන් කිසියම් අගතියක් වේ යැයි සැකයක් පවතී නම්, පවත්වාගෙන ආ ආකාරයට ටෙන්ඩර් කමිටුව සිදු කරන අතර සෙසු පක්ෂයේ විරෝධතාව ගැටලුවක් නොවන බවද පවසන ලදි. ඒ අනුව ටෙන්ඩර් මණ්ඩලය විසින් ගනු ලබන තීරණ සම්බන්ධයෙන් ගැටලුවක් පවති නම් ඕනෑම අවස්ථාවක විගණන අංශය හෝ විමර්ෂණ අංශ වෙත ඕනෑම දෙයක් ඉදිරිපත් කරමින් ප්‍රශ්න කිරීමට හැකියාව ඇති අතර ඒ සියලුම දේ සඳහා නව පාලනය යටතේ විවෘත කර ඇති අතර අප රටේ ගරු ජනාධිපතිතුමාගේ පාර්ලිමේන්තුවේ සිට සියලු පළාත් පාලන ආයතන වලට මේ රටේ ජනතාව ලබා දුන් ජන වරමට ඉඩ දී ඇති අතර ඕනෑම අයෙකුට නීතිය ඉදිරියට යා හැකි බව පවසන ලදි. එම අයිතිය දේශපාලන ව්‍යාපාරයක් ලෙස සියලු දෙනාටම හිමි කර දී ඇති බවද පවසන ලදි.

ගරු මන්ත්‍රී එම්.පී.බ්‍රයන් පෙරේරා මහතා කතා කරමින්, පෞරුෂය  පිළිබද සිදු කල ප්‍රකාශය තමාට භාර ගත හැකි වූවත් නවක මන්ත්‍රිවරුන්ට වඩා ඉදිරියෙන් සිටි ජ්‍යේෂ්ඨ මන්ත්‍රිවරුන් කණ්ඩායමක් සිටින බව සිහිපත් කරන ලදි.

ගරු මන්ත්‍රී එල්.සුසන්ත ශ්‍රීනාත් ප්‍රනාන්දු මහතා කතා කරමින්, විශේෂ මහ සභාව පැවතියදි මිත්‍රත්වයේ දෑත් දිගු කරමින් ගරු උප සභාපතිතුමා තම කථාව ආරම්භ කල අතර දූරකථනය ඔස්සේ සංවාද කරමින් කාරක සභා සඳහා සාමාජිකයින් සංඛ්‍යාව සංශෝධනය කර ගනිමින් 15කට බෙදා ගත් බව පවසන ලදි. එහෙත් මීට පෙර පැවති ටෙන්ඩර් මණ්ඩලය මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවට සම්බන්ධ වී තිබූ බවද පවසන ලදි. එමෙන්ම එතුමා 1991 සිට ප්‍රාදේශි සභාවේ කටුයුතු සිදු කරමින් පැමිණි අතර ටෙනඩර් මණ්ඩලය සඳහා පක්ෂ විපක්ෂ නියෝජනයන් තිබූ නමුත් වර්මානයේ නව ආණඩුව බලයට පැමිණියේ ජනතාගේ සහ රටේ පැවති ප්‍රශ්න හා දූෂණය වලට විරුද්ධව බව පවසන ලදි. එලෙස පැමිණි කණ්ඩායම ටෙන්ඩර් මණ්ඩලයේ කටයුතු සිදු කිරීමට පමණක් තනි තීරණ ගනු ලබන්නේ කෙසේද සහ විපක්ෂයේ මන්ත්‍රිවරුන්ව හරස් කල් මන්ද සහ ඒ සඳහා ලත් තීන්දුව කුමක්ද යන්න ගැටලුවක් පවතින බව පවසන ලදි. එසේත් නොමැති නම් දේශපාලන හස්තයකින් ආණ්ඩු පක්ෂය මෙහෙයවා මෙසේ සිදු කිරීමට කිසියම් නියෝගයක් ලබා දෙනවාද යන්න සැකයක් ඇති බවද පවසන ලදි. එසේ නොමැති නම් ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රිවරුන් 25 දෙනාට විපක්ෂයේ මන්ත්‍රිවරුන්ව ටෙන්ඩර් මණ්ඩලය සඳහා  පමණක් යොදා ගැනීමට නොහැකි ගැටලුවක් මතු වූයේ කෙසේද යන්න විමසන ලදි. එම නිසා මේ පිළිබද සාධාරණ සැකයක් ඇති අතර මෙමගින් හිතවත් අය සඳහා ටෙන්ඩර් ලබා දීමට කටයුතු සිදු කරනු ඇතැයි සිතිය හැකි බව පවසන ලදි. එහිදි ටෙන්ඩර් මණ්ඩල සාමාජිකත්වය ඉල්ලා සිටියදි විපක්ෂයේ මන්ත්‍රිවරුන් යනු හොරු, වංචාකාරයෝ ලෙස මඩ ගැසූ අතර අතර මහ සභාව තුල කතා නොකල යුතු වචන පවා යොදා ගනිමින් කතා කල බව පවසන ලදි. එකල හෙක්ටර් අප්පුහාමි මහතා විපක්ෂ නායක ලෙස සහ ට්‍රෙවින් ප්‍රනාන්දු මහතා ගරු සභාපති වී සිටියදි සංවාද කරමින් කටුයුතු කලද මහ සභාවක් තුල හැසිරිය යුතු ආකාරය සමූහ රැස්වීම් තුලින් කියා දුන් බව සිහිපත් කරන ලදි. එහෙත් නව මන්ත්‍රිවරුන් ලෙස පැමිණි විට ආණ්ඩු බලය අයිති කර ගනිමින් සදාකාල අයිතිකරුවන් සේ සිතුවද කිසි දිනක හෝ පරාජය වන බව පැවසූ අතර මීට වඩා බලය තිබූ රජයවල් පරාජය වූ බවද පවසන ලදි. එම නිසා එය සිහියේ තබා ගනිමින් සියලු මන්ත්‍රිවරුන්ට ගරු කරමින්ඉදිරියට යායුතු බව පවසන ලදි. එසේ නොමැති වුවහොත් අතීතයේ හැසිරීම් පිළිබද අනාගතයේදි කණගාටු වීමට සිදු වනු ඇතැයි බව ප්‍රකාශ කරන

ලදි. ඒ අනුව පෙරදි එලෙස කතා කරමින් ටෙන්ඩර් මණ්ඩලයට සම්බන්ධ කර නොගත් නිසා නොදකින දෙයක් අනුමත කිරීමට නොහැකි බැවින් දිගින දිගටම විරුද්ධ වූ අතර විගණන ගැටලුද විසදා ගැනීමටද ඉඩ දුන් බව පවසන ලදි. එහෙත් නැවත මෙසේ යෝජනාවක් ගෙන ඒමට හේතුව දේශපාලන මණ්ඩලයෙන් සෙසු පක්ෂවලින් එක් සාමාජිකයෙක් සම්බන්ධ කර ගැනීමට තීන්දුවක් ලැබුනාදෝ යන්න හැගෙන බව ප්‍රකාශ කරන ලදි. අතීතයේ තිබූ විපක්ෂය දැන් වෙනස් වී ඇති අතර එකල තනි තීරණයක් ගැනීමට හැකි වූවත් වර්තමානයේ එසේ තනි තීරණ ගැනීමට නොහැකි වී අතීතයේ මෙන් නොව වර්තමානයේ විපක්ෂයක් ලෙස තීරණ ගැනීමේදි අනෙකුත් විපක්ෂ කණ්ඩායම් සමඟ සාකච්ඡා කරමින් තීරණ ගැනීමට සිදු වී ඇතැයි පවසන ලදි. එයට හේතුව ඔවුන් පැමිණ සිටින්නේ ආසනයේ ආසන මන්ත්‍රිවරු 19 දෙනෙක් වන අතර ආසනයට වග කීමට සිදු වන අතර පක්ෂයේ මන්ත්‍රිවරුන්ව කොට්ඨාසයේ මැතිවරණ කොමසාරිස්තුමා විසින් පත් කරනු ලැබුවද ඔවුන්ව පත් කරනු බලන්නේ පක්ෂයේ මහ ලේකම්ගේ නිර්දේශය අනුව මැතිවරණ කොමසාරිස්තුමා විසින් බව ප්‍රකාශ කරන ලදි. මීට පෙර මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව ටෙන්ඩර් කමිටුව වී තිබූ බැවින් ඉහත යෝජනාව පිළිබද ඉදිරියේද සාකචඡා කර පිළිතුරක් ලබා දෙන බව පවසන ලදි. එමෙන්ම මිත්‍රත්වයේ දෑත් දුගු කිරීමට සූදානම් වූ මොහොතේ ආණ්ඩු පක්ෂය විසින් එය භාර නොගත් බවද පවසන ලදි.

ගරු සභාපතිතුමා පවසා සිටියේ තරහ වී සිට නැවත යහලු වීමට කතා කල පසු විපක්ෂයේ මන්ත්‍රිවරුන් බිය වී ඇති බවයි.

ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා විමසා සිටියේ එවැනි ආදරයක් හදිසියේ ඇති වූයේ කේසේද යන්නයි. එවිට ගරු සභාපතිතුමා පවසා සිටියේ ආදාරය යනු හදිසියේ ඇති වන්නක් බවයි.

ගරු උප සභාපති එස්.ඒ.ඩී.ලාල් ප්‍රියන්ත සියඹලාපිටිය මහතා කතා කරමින්, ටෙන්ඩර් කමිටුව විනිවිදභාවයකින් යුතුව සිදු කරමින් යන අතර සාමාජිකයින් 03ක් දැනට සිටින බැවින් තවත් එක් අයෙකුට අවස්ථාව ලබා දීමට අවස්ථාව ලබා දීමට සෙසු පක්ෂ වලට ආරාධනා කල බව පැවසූ අතර ඒ මොහොතේ විපක්ෂය ලෙසද ආමන්ත්‍රණය කලද එදා සභිකවරුන්ගේ යනුවෙන් හැදින්වූන් වූ බව සිහිපත් කරන ලදි. එමෙන්ම ගරු සභාපතිතුමා අදාල කණ්ඩායම බලාපොරෝත්තු වන්නේ විපක්ෂයක් නොවන අතර තවත් එක් සාමාජිකයෙක් පමණක් වන බව පවසන ලදි. ආසන 25ම ජයග්‍රහණය කර සිටින ආණ්ඩු පක්ෂයෙන් සාමාජිකයින් 03ක් සිටින ස්ථානයට තවත් එක් සාමාජිකයෙකු ලබ් දෙන ලෙස ඉල්ලා සිටින ලදි. එමෙන්ම පෙර කිසිදු දිනක විපක්ෂයක් ලෙස විග්‍රහ නොකල අතර එක් ක්ණ්ඩායමක් ලෙස සභිකයින් වශයෙන් සිටින බැවින් එක් අයෙක් ලබා දීමේ හැකියාව සෙසු කණ්ඩායමට ඇති බව පවසන ලදි.

ගරු මන්ත්‍රී ඩී.මලිත් සමීර පෙරේරා මහතා විමසා සිටියේ ටෙන්ඩර් මණ්ඩලයේ සාමාජිකයින් වැඩි වීම පිළිබද පවතින ගැටලුව කුමක්ද යන්නයි.

ගරු සභාපතිතුමා පවසා සිටියේ කණ්ඩායම වැඩි වීම පිළිබඳ ගැටලුවක් නොමැති නමුත් කර්යය කරගෙන යාමේ අපහසුතාවයක් ඇති බවයි.

ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා පවසා සිටියේ ගැසට් පත්‍රයට අනුව අවමය සාමාජිකයින් 03ක් වන අතර උපරිමය සීමාවක් නොමැති බවයි. ඒ අනුව ගරු සභාපතිතුමා ඇතුළු කණ්ඩායමට විනිවිදභාවයක් අවශ්‍ය නම් සීමා කල නොහැකි බව පවසන ලදි. ඒ අනුව ගරු සභාපතිතුමා පවසා සිටියේ විනිවිදභාවය පෙන්වීමට එක් අයෙක් ප්‍රමාණවත් වන බවයි.

ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා පවසා සිටියේ සෙසු පක්ෂ 04ක් ඇත් බැවින් එක් අයෙක් පමණක් ටෙන්ඩර් මණ්ඩලයට සහභාගි කර ගැනීමෙන් ඔවුන්ගේ ආදාරය නැති වී යාමට ඉඩ ඇති බවයි. ඒ අනුව ගරු සභාපතිතුමා පවසා සිටියේ ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා, හර්ෂ ද සිල්වා මන්ත්‍රිතුමා මෙන් සත්‍ය පැවසූ බවයි. එමෙන්ම විශේෂ මහ සභා රැස්වීමේදි ටෙන්ඩර් මණ්ඩලය සම්බන්ධයෙන් බෙදීමක් ඉල්ලා නොසිටි නමුත් 2වන මහ සභා වාරයේදි බෙදීමක් ඉල්ලමින් එම කාරණාව

ස්ථිර කර ගත් බව පවසන ලදි. ඒ අනුව ගරු උපසභාපතිතුමා විසින් ටෙන්ඩර් මණ්ඩලයට සෙසු පක්ෂ වලින් එක් සාමාජිකයෙකු සම්බන්ධ කර ගැනීමට යෝජනාවක් ඉදිරිපත් කර ඇති බව පවසන ලදි.

ගරු මන්ත්‍රී එල්.සුසන්ත ශ්‍රීනාත් ප්‍රනාන්දු මහතා පවසා සිටියේ එදා තිබූ ටෙන්ඩර් කමිටුව වර්තමානයේ මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව බවට නැවත පත් කිරීම සුදුසු බවයි. එමෙන්ම ඒ සඳහා ඡන්ද විමසීමක් අවශ්‍ය බවද පවසන ලදි.

ඉන්පසු ටෙන්ඩර් කමිටු සාමාජිකයින් සංඛ්‍යාව සංශෝධනයට අදාලව ගරු උප සභාපති එස්.ඒ.ඩී.ලාල් ප්‍රියන්ත සියඹලාපිටිය මහතා විසින් ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් ඡන්ද විමසීමක් සිදු කරන ලදි. ඒ අනුව ඉහත යෝජනාවට පක්ෂව ගරු සභාපති ටී.බී.ඩී.ඇන්ටනි කුමාර් මහතා, ගරු උප සභාපති එස්.ඒ.ඩී.ලාල් ප්‍රියන්ත සියඹලාපිටිය මයා, ගරු මන්ත්‍රී කේ.ඩිලාන් මලිත් බ්‍රවුන්සන් ප්‍රනාන්දු මයා, ගරු මන්ත්‍රී කේ.බී.වරුණ පෙරේරා මයා, ගරු මන්ත්‍රී ඒ.ඒ. විමුත් සුසන්ත අප්පුහාමි මයා, ගරු මන්ත්‍රී ඩී.මනෝජ් ඉන්දික මධුෂාන් පෙරේරා මයා, ගරු මන්ත්‍රිනී වයි.ටෙක්ලා ජයම්පති විජේසේකර මිය, ගරු මන්ත්‍රී සී.ජූඩ්. ප්‍රියදර්ශන ප්‍රනාන්දු මයා , ගරු මන්ත්‍රී අයි.පී. ප්‍රගීත් ධර්මජීව මයා, ගරු මන්ත්‍රී ජී.එම්.සඳුන් මධුමාල් ගම්පහ මයා, ගරු මන්ත්‍රී ආර්.එම්.අජිත් උදයසිරි රණතුංග මයා, ගරු මන්ත්‍රී කේ.එල්.සමන් රෝහිත මයා, ගරු මන්ත්‍රිනී එල්.ජයංගා රුවනාරි ප්‍රනාන්දු මිය, ගරු මන්ත්‍රිනී පී.කේ.හසංකා සෙව්වන්දි දයාරත්න මිය, ගරු මන්ත්‍රී එම්.සුරංගා රනිල් ක්‍රිෂාන්ත ප්‍රනාන්දු මයා, ගරු මන්ත්‍රී ජගත් කීර්ති කුමාර අබේරත්න මයා, ගරු මන්ත්‍රිනී ඒ.එම්.මනෝරි එරන්දති මිය, ගරු මන්ත්‍රී ජේ.එම්.ජනක චමින්ද ජයසේකර මයා, ගරු මන්ත්‍රී කේ.අජිත් නිශාන්ත ප්‍රනාන්දු මයා, ගරු මන්ත්‍රී ඒ.ඒ.වොහාන් සන්දීප් මයා, ගරු මන්ත්‍රී කේ.එල්.ඩී.ජී.සංජය අප්පුහාමි මයා, ගරු මන්ත්‍රිනී ඩී.කේ.ඩී.අයෝධා ගිත්මි මෙනවිය, ගරු මන්ත්‍රී ඒ.එච්.ගාමිණි රෙක්ස් ප්‍රනාන්දු මයා, ගරු මන්ත්‍රී ඩබ්.දිනේෂ් සංජීව ප්‍රනාන්දු මයා සහ ගරු මන්ත්‍රී ආර්.එම්.ශ්‍යාම් පෙරේරා මයා ඡන්දය ප්‍රකාශ කල අතර යෝජනාවට විරුද්ධව ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මයා, ගරු මන්ත්‍රී එල්.සුසන්ත ශ්‍රීනාත් ප්‍රනාන්දු මයා, ගරු මන්ත්‍රී කේ.වී.සුසන්ත පෙරේරා මයා, ගරු මන්ත්‍රී බී.ඒ.එස්. සාන්ත පෙරේරා මයා, ගරු මන්ත්‍රී ආර්.පී.අකිල ශිරංග රාජපක්ෂ මයා, ගරු මන්ත්‍රී ඩබ්.ඒ.ආර්.ෂවීන් ප්‍රනාන්දු මයා, ගරු මන්ත්‍රිනී අයි.නයෝමි රම්‍යලතා මිය, ගරු මන්ත්‍රිනී ජේ.කේ.දීපා මේරි අයිරාංගනී පෙරේරා මිය, ගරු මන්ත්‍රී ජී.ලලිත් ඔස්කා පෙරේරා මයා, ගරු මන්ත්‍රී ඩී.මලිත් සමීර පෙරේරා මයා, ගරු මන්ත්‍රී ජේ.පී.උපාලි සඳසිරි මයා, ගරු මන්ත්‍රී එස්.ඒ.අජිත් අමරජීව මයා, ගරු මන්ත්‍රිනී කේ.ඒ.ඩී.ශ්‍රීමාලි ඉන්ග්‍රීට් මිය, ගරු මන්ත්‍රිනී ජේ.ඒ.ඩී.ජසින්තා ඉන්ද්‍රානි මිය, ගරු මන්ත්‍රිනී ආර්.පී.මෙලනි චතුරිකා රන්තිලක මිය, ගරු මන්ත්‍රී සුධීර ප්‍රදීප් රණසිංහ මයා, ගරු මන්ත්‍රී එස්.ඒ.දීපාල් මයා, ගරු මන්ත්‍රී එම්.පී.බ්‍රයන් පෙරේරා මයා සහ ගරු මන්ත්‍රී ඩබ්.විමලසිරි පෙරේරා මයා ඡන්දය ප්‍රකාශ කරන ලදි. ඒ අනුව ඉහත යෝජනාවට පක්ෂව ඡන්ද 25ක් ලැබුණු අතර විපක්ෂව ඡන්ද 19ක් ලැබුණි.

10) පවතින ස්ථාවර තැන්පතු මුදල් නව පොලී අනුපාත කැඳවා නැවත වැඩිම පොළි අනුපාතයක් ලබා දෙන බැංකුවක ආයෝජනය කිරීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ඒ.ඒ. විමුත් සුසන්ත අප්පුහාමි මයා විසින් ස්ථිර කරන ලදි. ඉන්පසු මෙම යෝජනාව ඡන්ද විමසීමකින් තොරව සභාවේ රැඳී සිටි සියලුම මන්ත්‍රීවරුන්ගේ හා මන්ත්‍රීවරියන්ගේ එකඟතාවයෙන් සම්මත විය.

ගරු මන්ත්‍රී එල්.සුසන්ත ශ්‍රීනාත් ප්‍රනාන්දු මහතා පවසා සිටියේ වැඩි පොළි වෙනුවෙන් මුදල් පිටට ලබා දීමට නොහැකි අතර මුදල් පිළිබඳ ස්ථාවරත්වයක් ඇති බැංකුවක් තෝරා ගත යුතු බවයි. ඒ අනුව ගරු සභාපතිතුමා පවසා සිටියේ පැවති පොළියට වඩා වැඩි පොළි මුදලක් ලබා ගත හැකි රාජ්‍ය බැංකුවක් සොයා බැලිය යුතු බවයි.

11) නව ස්ථාවර තැන්පතුවක මුදල් ආයෝජනය කිරීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී සී.ජූඩ්. ප්‍රියදර්ශන ප්‍රනාන්දු මයා විසින් ස්ථිර කරන ලදි. ඉන්පසු මෙම

යෝජනාව ඡන්ද විමසීමකින් තොරව සභාවේ රැඳී සිටි සියලුම මන්ත්‍රීවරුන්ගේ හා මන්ත්‍රීවරියන්ගේ එකඟතාවයෙන් සම්මත විය.

ගරු මන්ත්‍රී එම්.පී.බ්‍රයන් පෙරේරා මහතා කතා කරමින්, මේ පිළිබඳව මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවට යොමු කර තිබුනේ කොටි 17ක් වුවත් ඉතිරි මුදල ඇත්තේ කොහේද යන්න විමසන ලදි.

ගරු සභාපතිතුමා පවසා සිටියේ එම මුදල් ඇති අතර දැනට කල් පිරෙන මුදල් ප්‍රමාණය පිළිබඳ තීරණයක් ගැනීමට ඉහත යෝජනාව ඉදිරිපත් කල අතර ඉතිරි මුදලට කල් පිරීමට දින ඇති අතර ඒ සම්බන්ධයෙන් ඉදිරියේදී තීරණයක් ගැනීමට කටයුතු කල හැක බව පවසන ලදි.

12) සෙන්දිරියාමුල්ල පිහිටි සෙන්දිරියාමුල්ල ස්වේට් ඉඩමේ අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීමට අදාල යෝජනාව යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල අතර මේ පිළිබඳ පැහැදිලි කිරීමට ගරු උපසභාපතිතුමාට අවස්ථාව ලබා දෙන ලදි.

ගරු උප සභාපති එස්.ඒ.ඩී.ලාල් ප්‍රියන්ත සියඹලාපිටිය මහතා කතා කරමින්, එම ඉඩමේ පදිංචිකරුවන් අවුරුදු 20ක් පමණ කාලයක් පදිංචිව සිටි නමුත් එය ගැටලුවක් වී ඇත්තේ එම ස්ථානයේ ජනපදයක් පවතින නිසා බව පවසන ලදි. එහි පොදු ඉඩමක් නොමැති අතර එම ජනපදයේ ජනතාවට ප්‍රජාශාලාවක්වත් නොමැති බව පවසන ලදි. එම ජනපදයට ප්‍රජාශාලාවක අවශ්‍යතාවය තදින්ම ඇති අතර සෙන්දිරියාමුල්ල ස්වේට් පදිංචිකරුවන් ඉවත් කිරීමට වඩා අවශ්‍ය වනනේ දැනට තනා ඇති ප්‍රජා ශාලාවේ වහලය සාදා ගැනීම බව පවසන ලදි. නමුත් එම ප්‍රජාශාලාවට යාබදව නිවසක් ඇති බැවින් මේ වන විට පවතින ප්‍රධානම ගැටලුව එම නිවස බව පවසන ලදි. ඒ අනුව එම ප්‍රජා ශාලාව ඉදි කිරීමට අවශ්‍ය වාතාවරණය සකසා දී ඉදිරි පියවර ගැනීම සුදුසු බව පවසන ලදි.

ගරු මන්ත්‍රී එම්.පී.බ්‍රයන් පෙරේරා මහතා කතා කරමින්, අවුරුදු 21ක් මුළුල්ලේ මෙම පදිංචිකරුවන් එහි පදිංචිව සිටින අතර මේ පිළිබඳව නීතිඥ මහතෙකුගේ උපදෙස් පැතීම සුදුසු බව පවසන ලදි. එමෙන්ම ඉහත කාරණාවට අදාල ලිපියෙහි දේශපාලන මැදිහත්වීමක් සඳහන් කර ඇති නමුත් දේශපාලන මැදිහත් වීමක් තිබුනේ නම් කිසිදු ඔප්පුවක් හෝ ලියවිල්ලක් ලබා නොදී ඇති බැවින් මෙය දේශපාලන මැදිහත් වීමක්ද යන්න තහවුරු කර ගැනීමට නොහැකි වන බව පවසන ලදි. එම නිසා ඉහත යෝජනාවට එකඟ විය නොහැකි අතර මේ සම්බන්ධයෙන් ඡන්ද විමසීමක් අවශ්‍ය බව පවසන ලදි.

ගරු සභාපතිතුමා පවසා සිටියේ මෙහි ඇත්තේ දේශපාලන මැදිහත්වීමක් වන අතර එම පදිංචිකරුවන් ළඟ එයට අදාල ලිපියක් ඇති බවත් එම ලිපියට අනුව අදාල පදිංචිකරුවන් එහි පදංචි වී ඇති බව පවසන ලදි. ඒ අනුව මෙහා දේශපාලන මැදිහත් වීමක් ඇති බව ස්ථිර වශයෙන්ම කිව හැකි බව පවසන ලදි.

ගරු මන්ත්‍රී එම්.පී.බ්‍රයන් පෙරේරා මහතා පවසා සිටියේ ඉහත යෝජනාව අසම්පූර්ණ යෝජනාවක් වන අතර අවශ්‍ය ලිපි ලේඛන ඉදිරිපත් කර නොමැති බව පවසන ලදි. එම නිසා මේ සඳහා අනුමැතිය ලබා දිය නොහැකි බව පැවසූ අතර ඒ සම්බන්ධයෙන් ඡන්ද විමසීමක් අවශ්‍ය බව පවසන ලදි.

ගරු මන්ත්‍රී ආර්.එම්.ශ්‍යාම් පෙරේරා මහතා කතා කරමින්, ඇතැම් අයට සිංහල කියවා තේරුම් ගැනීමේ අවබෝධය අඩු අතර ඉහත යෝජනාවට අදාල ලිපිය කියවීමේදි ප්‍රජා මූල සංවිධානයක් විසින් ජලනල පහසුකම් ලබා දී ඇති බව වැටහෙන බව පවසන ලදි. මෙවැනි දෑ දේශපාලන මැදිහත්වීමක් නොමැතිව සිදු වන්නේ කෙසේද යන්න මහ සභාවෙන් විමසන ලදි. එසේ නම් පළාත් පාලන දෙපාර්තමේන්තුව බොරු පවසා අපට එවා ඇතිද යන්න විමසන ලදි. ගරු මන්ත්‍රී එම්.පී.බ්‍රයන් පෙරේරා මහතාට කියවා අවබෝධ කර ගැනීමෙ හැකියාව නොමැති නම් සභාවේ කාලය නාස්ති නොකරන ලෙස ඉල්ලා සිටින ලදි. එමෙන්ම විදුලිය නොමැති තැන් වලට විදුලිය ලබා දුන් අවස්ථා බොහෝ දැක් ඇති අතර ඉහත යෝජනාවට අදාල ලිපියෙහි

ලිඛිතව මෙම ඉඩම එම පදිංචිකරුවන්ට ලබා දී ඇති බව සඳහන් වී ඇති බව පවසන ලදි. ඒ අනුව පැහැදිලිවම ඉහත ඉඩමට සම්බන්ධ ලේඛනය සභාගත කර ඇති බව පැවසූ අතර එම ලේඛනයෙහි පැහැදිලිවම සිදු වී ඇත්තේ කුමක්ද යන්න තේරුම්ගත හැකි බව ප්‍රකාශ කරන ලදි.

ඒ අනුව මේ පිළිබඳ ලේකම්තුමාගෙන් පැහැදිලි කිරීමක් අවශ්‍ය බැවින් මහ සභා අවස්ථාව කාරක සභා අවස්ථාවක් බවට පත් කිරීමට ගරු මන්ත්‍රී ආර්.එම්.ශ්‍යාම් පෙරේරා මහතා යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී කේ.ඩිහාන් මලිත් බ්‍රවුන්සන් ප්‍රනාන්දු මහතා විසින් ස්ථිර කරන ලදි. ඉන්පසු ලේකම්තුමා විසින් ඉහත කරුණ සම්බන්දයෙන් පැහැදිලි කරන ලදි. නැවත කාරක සභා අවස්ථාව මහ සභා අවස්ථාවක් බවට පත් කිරීම සඳහා ගරු මන්ත්‍රී අයි.පී. ප්‍රගීත් ධර්මජීව මහතා යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ජී.එම්.සඳුන් මධුමාල් ගම්පහ මහතා විසින් ස්ථිර කරන ලදි.

ගරු මන්ත්‍රී එල්.සුසන්ත ශ්‍රීනාත් ප්‍රනාන්දු මහතා කතා කරමින්, දංකොටුව හා දුම්මලකොටුව ප්‍රදේශවල ප්‍රාදේශීය සභාවේ සේවය කරන සේවකයින් සිටින අතර පෙර පැවති කාරක සභාවකදී එම ඉඩම්වල පදිංචිකරුවන්ට එම ඉඩම් ලබා දීමට නොහැකි බවට නීතිමය ගැටලුවක් ඇති බව සාකච්ඡා කල අතර ඉහත යෝජනාවත් ඉහත ගැටලුවට සමාන ගැටලුවක් වන බැවින් කොමසාරිස්තුමිය මෙම ගැටලුව මන්ත්‍රී මණ්ඩලය කරපිට තබා ඇති අතර මන්ත්‍රී මණ්ඩලයට සභාවේ දේපල බෙදා දීමට අහිතියක් නොමැති බව පවසන ලදි. එසේ කලහොත් මන්ත්‍රී මණ්ඩලයට ඒ සඳහා අධිභාර ගෙවීමට සිදු වේයැයි පවසන ලදි. ඒ අනුව ඉහත ගැටලුව මානුෂිකව ගත් කල එම පදිංචිකරුවන්ව භූමියෙන් ඉවත් කිරීමට නොහැකි අතර එම ඉඩම් කවුරුන් විසින් හෝ ලබා දුන් නමුත් මේ වන විට එම ඉඩම් තුල නිවස්, වැසිකිලි සාදා ගනිමින් එහි මිනිසුන් ඒවා භුක්ති විඳින බැවින් එම භූමිය ඔවුන් සතු දෙයක් ලෙස පරිහරණය කරනු ඇතැයි පවසන ලදි. එමෙන්ම රජයේ කිසියම් වැඩපිළිවෙලක් ඔවුන් වෙනුවෙන් පවතී නම් ගැටලුවක් නොවන අතර එසේ නොමැති නම් දැන් තිබෙන තත්වයෙන්ම පවත්වාගෙන යාමට ඉඩ ලබා දිය යුතු අතර මේ සඳහා මහ සභා අනුමැතියක් ලබා දීමට නොහැකි බව පවසන ලදි.

ගරු සභාපතිතුමා කතා කරමින්, වසර 20ක් රටේ ප්‍රධාන දේශපාලන පක්ෂ හා විවිධ සභාපතිවරු මුලසුන දැරූ අතර එතෙක් මෙම ජනතාවට එම ඉඩම බදු දීමට හෝ රටේ ගෞරවාන්විත පුරවැසියෙක් ලෙස ජීවත් වීමට ඉඩක් ලබා නොදුන් බව පවසන ලදි. පෙර වාද විවාද කල සියලු දෙනා මෙම ගැටලුව දිගටම ගෙන යාමට සූදානම් වුවත් එසේ කිරීමට නව ආණ්ඩු පක්ෂයට අවශ්‍ය නොවන අතර එම පදිංචිකරුවන්ට මේ රටේ මහ පොළොවේ අයිතියක් ලබා දිය යුතුය යන අදහස ප්‍රතිපත්තියක් ලෙස ආණ්ඩු පක්ෂයේ සියලු දෙනා තුල ඇති බව පවසන ලදි. ඒ අනුව එම පදිංචිකරුවන් සමඟ සාකච්ඡා කල යුතු අතර මේ සම්බන්ධයෙන් පළාත් පාලන කොමසාරිස්තුමියට දොස් පැවසීම සුදුසු නොවන බවද පවසන ලදි. එමෙන්ම මේ පිළිබඳව විමර්ෂණ නිලධාරින් යොදවා ක්‍රියාත්මක කරනු ලබන්නේ නීතිය වන බව පවසන ලදි. මෙය නෛතික අවශ්‍යතාවයක් වන අතර මෙලෙස අවභාවිතා කරනුයේ රජයේ දේපලක් වන බවද පවසන ලදි. එම අනීතික ක්‍රියාව සඳහා වසර 20ක් පෙනී සිටි පාලකයින් ඉඩ දී ඇති බවද ප්‍රකාශ කරන ලදි. නමුත් ගරු සභාපතිතුමා ඇතුළු කණ්ඩායම එසේ සිදු නොකර ජනතාවට ගෞරවාන්විත ආකාරයෙන් පිළිතුරක් ලබා දීමට උත්සාහ කරන බව පවසන ලදි. ඒ අනුව මෙයට පිළිතුරක් සෙවීම සංකීර්ණ වන අතර එම ජනතාව පාරට ඇද දැමීමට නොහැකි බවට සියලු දෙනාම ස්ථිරවරයක සිටින නමුත් තව දුරටත් එම ජනතාව අසරණ කිරීමට නොහැකි අතර ඔවුන්ට ගෞරවාන්විත ආකාරයේ හිමිකමක් ලබා දෙන්නේ කෙසේද යන්න සොයා බැලිය යුතු බව පවසන ලදි. එමෙන්ම වසර 20ක් ඒ වෙනුවෙන් ක්‍රියාත්මක නොවී ලිපියක් මඟින් ඉඩම් ලබා දී ඇත්නම් ඔවුන් වෙනුවෙන්ද නීතිය ක්‍රියාත්මක කල යුතු අතර ඒ වෙනුවෙන්ද මහ සභාව තුල තීරණයක් ගත යුතු බව පවසන ලදි. එමෙන්ම මීළඟ ගැටලුව වන්නේ එය ජනපදයක් වීම සහ එහි පොදු ඉඩම් කොටසක් තිබීම බව පැවසූ අතර එම අයිතිය ජනපදයේ මිනිස්සුන්ටද ලබා දීම නෛතික අයිතියක් බව පවසන ලදි. ඒ අනුව යම් කාලයක් ගත වුවත් එම පදිංචිකරුවන්ට යම් කාලයක් සහ නිවාසයක් ලබා දීමට යෝජනා කරන ලදි. එසේ

කිරීමෙන් ඉහත ඉඩම නිදහස් කර ගැනීමට හැකි වන බව පැවසූ අතර මෙය ඉතා සංකීරණ මෙන්ම විශාල මුදලක් වැය වුවත් මෙ කිරීම අත්‍යවශ්‍ය බව පවසන ලදි.

ගරු මන්ත්‍රී එල්.සුසන්ත ශ්‍රීනාත් ප්‍රනාන්දු මහතා පවසා සිටියේ දංකොටුව ප්‍රදේශයේ අප ප්‍රාදේශිය සභාවේ සේවය කරන කම්කරුවන් පදිංචි වී සිටින අතර වැඩි අනුකම්පාවක් එම කම්කරුවන් සඳහා ලබා දිය යුතු බවයි. එයට හේතුව නම් සැම කසල කොටසක්ම එම කම්කරුවන් විසින් පිරිසිඳු කරන බැවින් එම මිනිසුන්ට සාධාරණයක් ඉටු කර දිය යුතු බව පවසන ලදි.

ගරු මන්ත්‍රී ඩී.මලිත් සමීර පෙරේරා මහතා කතා කරමින්, මේ පිළිබඳ විධිමත් සොයා බැලීමක් සිදු කල යුතු අතර මේ අකාරයෙන් සභාවේ අනෙකුත් ඉඩම්වල පදිංචිකරුවන් සිටිය හැකි බැවින් මෙම ගැටලුවට සමාන ගැටලුවක් මැදිකැලේ ගම්මානයේ ඇති අතර සභාවට වෙන් කල කොටසේ විශාල වටිනාකමකින් යුතු තාප්පයක් තනා ගේට්ටු දමා ඇති බව පවසන ලදි. ඒ පිළිබඳ කොමසාරිසිතුමා දැනුවත් කර ඇති අතර ඒ පිළිබඳ නඩු තත්වයකට ගොස් ඇති බවද පවසන ලදි. ඒ අනුව ගරු සභාපතිතුමා විසින් කල යෝජනාවට තමා විරුද්ධ නොවන නමුත් මේ පිළිබඳ වැඩි දුරටත් සොයා බලා තීරණයක් ගැනීම සුදුසු බව පවසන ලදි.

ඒ අනුව විමර්ෂණයක් සිදු කිරීමෙන් පසු අභ්‍යන්තර තත්වය සොයා බලා තීරණයක් ගැනීමට සුදුසු කාලයක් ඉල්ලා කොමසාරිස්තුමියට ලිපියක් යැවීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී සී.ජූඩ්. ප්‍රියදර්ශන ප්‍රනාන්දු මහතා විසින් ස්ථිර කරන ලදි. ඉන්පසු මෙම යෝජනාව ඡන්ද විමසීමකින් තොරව සභාවේ රැදී සිටි සියලුම මන්ත්‍රිවරුන්ගේ හා මන්ත්‍රිවරියන්ගේ එකඟතාවයෙන් සම්මත විය.

ගරු සභාපතිතුමා කතා කරමින්, මිනිසුන් අනවසරයෙන් පදිංචි වී සිටින ඉඩම් සම්බන්ධයෙන් එකල සිටි පාලකයින් වසර 15-20ක් කිසිදු පියවරක් නොගත් හේතුව ඉදිරිපෙල විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙන් විමසා සිටින ලදි. සියලු ප්‍රශ්න ආණඩු පක්ෂය විසින් විසඳාගෙන යන අතර ජනතාව මේ රට භාර දුන්නේ මෙම ගැටලු නිරවුල් කිරීමට වන අතර මේ වන විට සභාව සතු ඉඩම් මොනවාද යන්න ලේඛනගත කල නමුත් ලේඛනගත වී නොමැති පොදු ඉඩම් සොයා ගැනීමට හැකි වූ බව පවසන ලදි. මෙය නූල් බෝලයක් ලෙස පැටලී ඇති අතර මෙය විසඳා ගත යුතු බව පවසන ලදි. ඒ අනුව දැනට අනවසරයෙන් පදිංචිකරුවෙක්ට සිටීමට ලබා දී ඇති සභාව සතු ඉඩම්, වැට මායිම් ගසා ඇති ඉඩම්, එක් එක් ලියවිලි මත රවට්ටමින් ලබා දී ඇති ඉඩම් මොනවාද යන්න මීළඟ මහ සභාවේදි ලබා දෙන බව පවසන ලදි. එමඟින් මෙය කෙතරම් දුරට ව්‍යාකූලද යන්න තේරුම්ගත හැකි බව පවසන ලදි. ඒ අනුව සභාව සතුව මුදල් නොමැති වුවහොත් මධ්‍යම රජයෙන් හෝ මුදල් ලබාගෙන ඉඩමක් මිලදී ගෙන එම ජනතාවට ඉඩම් කොටස් ලබා දීමට බලාපොරොත්තු වන බව පවසන ලදි.

13) වෙන්නප්පුව ප්‍රාදේශිය සභාවේ සේවයේ නියුතු සෞඛ්‍ය කම්කරුවන් සඳහා කුසලතා වර්ධන පුහුණුව හා අධ්‍යන චාරිකාවක් සඳහා ඉදිරිපත් කර ඇති රු. 200.000.00 ක වියදම් ඇස්තමේන්තුව අනුමත කිරීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ඒ.ඒ. විමුත් සුසන්ත අප්පුහාමි මයා විසින් ස්ථිර කරන ලදි. ඉන්පසු මෙම යෝජනාව ඡන්ද විමසීමකින් තොරව සභාවේ රැදී සිටි සියලුම මන්ත්‍රිවරුන්ගේ හා මන්ත්‍රිවරියන්ගේ එකඟතාවයෙන් සම්මත විය.

14) වෙන්නප්පුව ප්‍රාදේශිය සභාවේ සේවයේ නියුතු කසල කම්කරුවන්, මාර්ග කම්කරුවන්, විදුලි අංශවල කම්කරුවන් හා ට්‍රැක්ටර් රථ රියදුරන් අතරින් හොඳම සේවකයා තේරීමේ අභිප්‍රේරණ වැඩසටහනට අදාලට ඉදිරිපත් කර ඇති රු.100,000.00 ක වියදම් ඇස්තමේන්තුව අනුමත කිරීම අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල අතර එම යේජනාව ගරු මන්ත්‍රිනී වයි.ටෙක්ලා ජයම්පති විජේසේකර මිය විසින් ස්ථිර කරන ලදි. ඉන්පසු මෙම යෝජනාව ඡන්ද විමසීමකින් තොරව සභාවේ රැදී සිටි සියලුම මන්ත්‍රිවරුන්ගේ හා මන්ත්රිවරියන්ගේ එකඟතාවයෙන් සම්මත විය.

15) වෙන්නප්පුව ප්‍රාදේශිය සභාවේ සේවයේ නියුතු සෞඛ්‍ය කම්කරු, රියදුරු හා මාර්ග කම්කරුවන්ගේ දරුවන් සඳහා පාසල් උපකරණ ලබා දීමට අදාලව අදාලට ඉදිරිපත් කර ඇති රු.300,000.00 ක වියදම් ඇස්තමේන්තුව අනුමත කිරීම අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී එම්.සුරංග රනිල් ක්‍රිෂාන්ත ප්‍රනාන්දු මයා විසින් ස්ථිර කරන ලදි. ඉන්පසු මෙම යෝජනාව ඡන්ද විමසීමකින් තොරව සභාවේ රැදී සිටි සියලුම මන්ත්‍රිවරුන්ගේ හා මන්ත්‍රිවරියන්ගේ එකඟතාවයෙන් සම්මත විය.

16) ජාත්‍යන්තර ක්‍රිකට් තරඟාවලියක් සඳහා ශ්‍රී ලංකා අභියෝගතා සහිත වූවන්ගේ ක්‍රිකට් සංගමය විසින් නොවැම්බර් 14,15 සහ 16 යන දිනවල ඇල්බට් ඇෆ් පීරිස් ක්‍රීඩාංගනය නොමිලේ වෙන් කරවා ගැනීමට ඉදිරිපත් කර ඇති ලිපිය සම්බන්ධයෙන් තීරණයක් ගැනීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ජගත් කීර්ති කුමාර අබේරත්න මයා විසින් ස්ථිර කරන ලදි. ඉන්පසු මෙම යෝජනාව ඡන්ද විමසීමකින් තොරව සභාවේ රැදී සිටි සියලුම මන්ත්‍රිවරුන්ගේ හා මන්ත්‍රිවරියන්ගේ එකඟතාවයෙන් සම්මත විය.

17) 2025 දෙසැම්බර් 12 සහ 13 දිනවල වෙන්නප්පුව ප්‍රාදේශිය සභා ශ්‍රවනාගාරය සහ පහත බිම් මහල ලබා දෙන ලෙස සරණි ගොවි කාන්තා සමිතිය විසින් ඉදිරිපත් කර ඇති ලිපියට අනුව මුළු මුදලින් 50%ක් අය කිරීම සුදුසු බව ගරු සභාපතිතුමා විසින් යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී බී.ඒ.එස්. සාන්ත පෙරේරා මයා විසින් ස්ථිර කරන ලදි. ඉන්පසු මෙම යෝජනාව ඡන්ද විමසීමකින් තොරව සභාවේ රැදී සිටි සියලුම මන්ත්‍රිවරුන්ගේ හා මන්ත්රිවරියන්ගේ එකඟතාවයෙන් සම්මත විය.

18) මහජන ආරක්ෂාව සඳහා පහත සඳහන් මංසන්ධිවල උත්තල දර්පණ සවි කිරීමට ෆූජි ඔටෝ ෆ්ලෑෂ් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනය විසින් ඉදිරිපත් කර ඇති ලිපියට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.විමලසිරි පෙරේරා මයා විසින් ස්ථිර කරන ලදි. ඉන්පසු මෙම යෝජනාව ඡන්ද විමසීමකින් තොරව සභාවේ රැදී සිටි සියලුම මන්ත්‍රිවරුන්ගේ හා මන්ත්‍රිවරියන්ගේ එකඟතාවයෙන් සම්මත විය.

i. විද්‍යාල මාවතේ පළමු වංගුව
ii. වයික්කාල තඹරවිල මංසන්ධිය

19) 2026 අයවැය කෙටුම්පත අනුමැතියට ඉදිරිපත් කිරීම.

ගරු සභාපතිතුමා කතා කරමින්, වෙන්නප්පු බල ප්‍රදේශයේ ජනතාව ඡන්ද කොට්ඨාස 25ක්ම ජයග්‍රහණය කරමින් ජාතික ජනබල වේගයට වෙන්නපුව ප්‍රාදේශීය සභාවේ සමස්ත බලය හිමි කර දුන් අතර එම හිමිකර දීම තුළ සියලුම ආණ්ඩු පක්ෂ මන්ත්‍රීවරුන් දැවැන්ත වගකීමක් උරමත තබාගෙන ඒ සම්බන්ධයෙන් ඉතාම හොඳ සිහියකින් හා අවබෝධයකින් ජනතාවගේ අවශ්‍යතා ඉෂ්ට කිරීමට අවශ්‍යය කටයුතු පිළිබඳව කල්පනා කරමින් මෙම අයවැය සකස් කළ බව පවසන ලදී. ප්‍රාදේශීය සභාවේ පාලනය භාරගෙන මේ මොහොත වන විට මාස 06ක පමණ කාලයක් වන බැවින් මෙම මංගල අයවැය ඉදිරිපත් කරන මෙම මොහොතේ ඔවුන් සිටින්නේ සංක්‍රාන්ති සමයක බව පවසන ලදී. මාස හයක අයවැයක් මාස හයක දූර කාලයක් තුළින් රටේ දැවැන්ත වෙනස්කම් ප්‍රමාණයක් සිදුකරමින් නිෂ්පාදන ආර්ථිකයට මේ රට ගෙනයාමට අවශ්‍ය දායකත්වයන් දීමට අවශ්‍ය ප්‍රතිසංස්කරණය සිදු කරමින් පවතින මොහොතක් බව සිහිපත් කරන ලදී. මෙම රටේ දශක හතක දේශපාලන ඉතිහාසය තුළින් පසුගිය ජනාධිපතිවරණයේදී ජාතික ජන බලවේගය දැවැන්ත වෙනසක් කිරීමට අප රටේ ජනතාව අනුර කුමාර දිසානායක මහතාව ගරු ජනාධිපති ලෙස තෝරාපත් කළ අතර එතැනින් නොනැවතී පසුගිය මහා මැතිවරණයේදී 159 ක අති විශේෂ ජයග්‍රහණයක් අප රටේ ජනතාව ලබා දුන් බව පවසන ලදී. එමෙන්ම පළාත් පාලන මැතිවරණය තුළ බහුතර පළාත් පාලන ආයතන ප්‍රමාණයකින් බලය හිමිකර ගැනීමට ආණ්ඩු පක්ෂයට හැකි වූ බව පවසන ලදී. දේශපාලනය ව්‍යාපාරයක් ලෙස දශක ගණනාවක් මාරුවෙන් මාරුවට කරගෙන ගිය දේශපාලනයට තිත තබමින් රටේ ජනතාව නව දේශපාලන

සංස්කෘතියක් බලාපොරොත්තුවෙන් අපේ රටට නව ජනවරමක් ලබා දුන් අතර එම ජනවරම පිළිබඳව හොඳින් කියවමින් ඒ සඳහා ජනතාව නොරවටන නිවැරදි විද්‍යාත්මක දත්ත මත යෝජනා සකස් කරමින් සිටින මොහොතක මෙම අයවැය ඉදිරිපත් කළ බවට පවසන ලදී. එමෙන්ම පැවැති දේශපාලන සංස්කෘතිය තුල වත්මන් ගරු සභාපතිතුමා 2018 වර්ෂයේ මන්ත්‍රීවරයකු ලෙස සිටින කාලයේ දී කම්වු මන්ත්‍රීවරුන් ප්‍රභූත්වයන් ආරුඪ කර ගනිමින් සිටි අතර එකල සේවය කළ නිලධාරීන් මන්ත්‍රීවරුන්ට අනවශ්‍යාකාරයෙන් ගරු බුහුමන් දැක්වූ අතර වර්තමානයේ දී නිලධාරීන්ට ස්වාධීනව සේවය කිරීමට හැකියාව ලැබී තිබීම පිළිබඳ නිලධාරීන් තමන්ට පැවසූ බව ගරු සභාපතිතුමා පවසන ලදී. එම පාදඩ දේශපාලන සංස්කෘතිය කෙටි කාලයක් තුළින් අවසන් කිරීමට මේ වන විට හැකි වී ඇති අතර ඉහළ සිට පහළට ඇති දේශපාලනය සඳළුතලයෙන් බිමට බස්සා ජනතාවට වග කියන ජනතාව සමඟ එකට උරෙන්නුර ගැටෙමින් වැඩ කරන සාමාන්‍ය පොදු ජනතාව සමග මන්ත්‍රීවරයා තවදුරටත් ප්‍රභූවරයකු නොව, ජනතා සේවයකයෙක් යන කාරණාව මහපොළොවේ යථාර්ථයක් බවට පත් කිරීමට හැකිවී ඇති බව පවසන ලදී. එමෙන්ම දේශපාලන සංස්කෘතිය වෙනස් කිරීමට වර්තමාන ආණ්ඩුවට හැකි වී ඇති අතර දැඩි අධිෂ්ඨානයකින් යුතුව මේ රටේ පමණක් නොව වෙන්නප්පුව බල ප්‍රදේශයේ සමස්ත ජනතාව සහ ජනතාවගේ හීන හා බලාපොරොත්තු වලට අරුතක් එක් කිරීමට බලාපොරොත්තු වන බවට පවසන ලදී. එම නිසා ලංකා ඉතිහාසයේ පළමුවරට මත්ද්‍රව්‍ය තුරන් කිරීමේ දැවැන්ත මෙහෙයුමක් ආරම්භ කර ඇති බවට ප්‍රකාශ කරන ලදී. එම නිසා ඉතිහාසය පළමුවරට අයිස් කන්ටේනර් සමග මන්ත්‍රීවරුන් හා ජාවාරම්කරුවන් අත්අඩංගුවට ගනිද්දි ඔවුන් ඉලක්ක කර සිටියේ තරුණ ප්‍රජාව බව පවසන ලදී. එම උවදුරෙන් තරුණ ප්‍රජාව සහ දරුවන් බේරා ගැනීමට ජාතික ජන බලවේගය ලෙස ඔවුන් වෙන්නප්පුව බල ප්‍රදේශය තුල නීතිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සහයෝගය ලබා දෙමින් දේශපාලන නායකත්වය ලබා දෙමින් සිටින බව පවසන ලදී. ඒ අනුව 2026 අයවැය යෝජනාව සියලු දෙනාට ඉදිරිපත් කරන ලදී.

“පොහොසත් රටක් - ලස්සන ජීවිතයක් රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශයට සමගාමීව ව්‍යවස්ථාපිත ආදායම් සහ රජයේ ප්‍රධාන (වැටුප් ප්‍රතිපූර්ණ) මතම යැපීමෙන් මිදී සේවා සහ නිෂ්පාදන අංශයන් දෙකෙන්ම ආදායම් උත්පාදන ව්‍යාපෘති ක්‍රියාත්මක කරමින් දත්ත තොරතුරු මත සංවර්ධන සැලසුම් සකස් කර විද්‍යාත්මක පදනම මත පිහිට වූ ආදායම් උත්පාදිත ක්‍රියාවලියකට අවතීර්ණ වීම 2026 වර්ෂයට මාගේ ප්‍රධානම අරමුණ සහ අභිලාෂයයි.

එමගින් **"පහසුකම් සපිරි යහපාලිත පුරවරයක්"** යන වෙන්නප්පුව ප්‍රාදේශිය සභාවේ දැක්ම වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම යථාර්ථයක් බවට පත් කරමින් 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන, රීති සහ අතුරු ව්‍යවස්ථා ප්‍රකාරව සියළු පහසුකම් වලින් පූර්ණ සුබවිහරණයක් සහිත සෞඛ්‍ය සම්පන්න සමාජ ජීවිතයක් බල ප්‍රදේශයේ ජනතාවට ලබාදීම පමණකින් නොනැවතී අල්ලස/ දූෂණය/ වංචාව මුලිනුපුටා දමා කාර්යක්ෂමව, විනිවිදභාවයෙන් යුත් සුහදශීලි ගෞරවණීය සේවාවක් ලබාදීමට අදිටන් කර ඇත්තෙමි.

තවද ප්‍රාදේශීය සභාවේ කාර්යාලීය සහ ක්ෂේත්‍ර කටයුතු නව තාක්ෂණය සමඟ මුසුකර යාවත්කාලීන කර ආයතනය සතු මානව සහ භෞතික සම්පත කළමනාකරණය මගින් නාස්තිය පිටුදැක අරපිරිමැසුම්දායක ක්‍රියාවලියකට අවතීරණ කරවීමට පියවර ගනිමි.

පළාත් පාලන ආයතන ස්වයංව නැගී සිටුවීමේ රජයේ ප්‍රතිපත්තිමය වෙනස්කම් සඳහා අනුගත වෙමින්,

- ❖ සිංද්‍රාත්‍රිය/ වෙල්ලමංකරය/ උල්හිටියාව වෙරළ උද්‍යාන නවීකරණය
- ❖ නොදිරන කසළ සඳහා දාහකය ඉදිකිරිම.
- ❖ මළ අපද්‍රව්‍ය පිරිපහදු ඒකකය ආරම්භ කිරිම.
- ❖ ඇල්බට් පීරිස් ක්‍රීඩාංගනයේ රථගාල ඉදිකිරිම.
- ❖ වෙන්නප්පුව/දන්කොටුව සතිපොළ භූමිය දෛනික ක්‍රියාවලියට අවතීරණ කරවීම වැනි සංවර්ධන ව්‍යාපෘති මඟින් නව ආදායම් උත්පාදනය කිරිම 2026 වසරට අපේක්ෂා කරමි.

2025 වර්ෂයේ රජය මගින් රුපියල් මිලියන 34.8 ක මුදලක් ලබා දී ඇති අතර, 2026 වර්ෂයට ප්‍රාදේශීය සභාවේ දියුණුව සඳහා පළාත් පාලන අමාත්‍යාංශය මගින් ආදායම් උත්පාදනය කළ හැකි බල ප්‍රදේශයට අනන්‍ය වූ නව ව්‍යාපෘති සඳහා පමණක් නොව යන්ත්‍රෝපකරණ ද ලබා ගැනීමට අවශ්‍ය තොරතුරු පළාත් පාලන දෙපාර්තමේන්තුව මේ වන විටත් ලබා ගෙන අවසන් බව සතුටින් ප්‍රකාශ කර සිටිමි.

තවද 2026 කසළ කළමනාකරණය, වීථි ආලෝකකරණය, මාර්ග පද්ධතිය සංවර්ධනය, ප්‍රජා දායක වැඩසටහන් මගින් ප්‍රජාව ආකල්පමය සහ ආර්ථික වශයෙන් සවිබල ගැන්වීමට බලාපොරොත්තු වෙමි.

2026 වර්ෂයේ මුළු අයභාරය රුපියල් **454,646,300** කි. එම වර්ෂයේ මුළු පුනරාවර්තන වියදම රුපියල් **424,497,440** හා මුළු ප්‍රාග්ධන වියදම රුපියල් **30,100,770** කි. එහි අතිරික්තය රුපියල් **48,090.00** කි මෙහි විස්තරාත්මක අයවැය කෙටුම්පත ඔබ වෙත ලබා දී ඇති අතර, එහි සඳහන් ආදායම් කාර්යක්ෂම ලෙස අයකර ගැනීමට හා එහි සඳහන් වියදම් ඵලදායි ලෙස යෙදවීමට ඔබ සැමගේ සහයෝගය අපේක්ෂා කරමු.

මාගේ කාර්යය මණ්ඩලය පිළිබඳ තව දුරටත් වඩා විශ්වාසය තබමින් දශක ගණනාවක් අහිමි කර තිබූ වෘත්තීය නිදහස, සතුටින් වැඩ කිරිම සහ වෘත්තියේ ගෞරවයත්, නිහතමානී අභිමානයත් ඔවුන් හට ප්‍රමුඛකර දෙන අදිටනින් වෙන්නප්පුව බල ප්‍රදේශයේ සුළු, මධ්‍යම, මහා පරිමාණ වෙළඳ ව්‍යාපාරිකයින්, ධීවරයින් ඇතුළු සියළුම වෘත්තිකයන් හා ප්‍රජාවගේ දැනුම පමණක් නොව බෞද්ධ ස්වාමීන්වහන්සේලා, කතෝලික සභාවේ හලාවත අප රදගුරුතුමන්, පියතුමන්ලා, ඇතුළු සියළුම ආගමික නායකයින්ගේ අවවාද අනුශාසනා සමගින් බල ප්‍රදේශයේ ප්‍රජාවගේ සුබවිහරණය සඳහා කටයුතු කිරිමට දැඩි අධිෂ්ඨානයකින් පසුවන අතර, ඒ සඳහා බල ප්‍රදේශයේ සමස්ථ ප්‍රජාවගේ සහයෝගය බලාපොරොත්තු වෙමි.

තවද. මෙම අයවැය කෙටුම්පත සකස් කිරිම  සඳහා අදහස් හා යෝජනා ලබා දුන් ඔබ සැමටත්, බල ප්‍රදේශයේ ජනතාවටත්, වෙන්නප්පුව ප්‍රදේශීය සභාවේ කාර්ය මණ්ඩලයටත් ස්තූතිය පුද කර සිටිමි. තවද මෙම අයවැය කෙටුම්පත සකස් කිරිමට දායකත්වය ලබා දුන් ලේකම් මහතාටත්, විෂය භාර නිලධාරින් සියලු දෙනාටත් මාගේ ස්තූතිය පුද කර සිටින අතර, 2026 අයවැය කෙටුම්පත සඳහා ඔබ සැමගේ අනුමැතිය ගෞරවයෙන් අපේක්ෂා කරමි.”

ඉන් පසු අයවැය පිළිබඳ විවාදය ආරම්භ කරන ලදී.

ගරු මන්ත්‍රී කේ.වී සුසන්ත පෙරේරා මයා කතා කරමින්, මීට පෙර කාලවලදී වෙනම සභාවක් පවත්වා සභාපතිතුමා විසින් අයවැය පණිවිඩය කලින් ලබා දුන් අතර වර්තමාන ගරු සභාපතිතුමා විසින් එය මහ සභාව මොහොතේ ලබා දුන් බැවින් එය කලින් ලබා දුන්නේ නම් මීට වඩා අර්ථවත් වන්නට තිබුණා යනුවෙන් පවසන ලදී. 2026 වර්ෂයට ලබා දී ඇති අයවැයෙහි උත්පාදිත ආදායම කෝටි 45.5 ක් වන අතර මීට වඩා බල ප්‍රදේශයක් වශයෙන් බදු  මුදල් ලැබෙන සභාවක් ලෙස වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව අර්තකථනය කරන ලදි. ආණ්ඩුවේ අසාර්ථකත්වය සමඟ ඉහළට යාමට නොහැකි තත්වයක් අයවැය ලේඛනය තුළින් පෙන්නුම් කරන බව පැවසු අතර නිවැරදි උපදේශනයක් නැති වීම මෙයට හේතුවක් වී ඇති බවද ප්‍රකාශ කරන ලදී. එමෙන්ම වර්තමාන ආණ්ඩු පක්ෂයට ලබා දුන්නේ අභිමානවත් සභාවක් වන අතර කෝටි පහළොවක ඉතුරුවක් සමග සියලු වැඩ කටයුතු සංවිධානය කර ක්‍රියාත්මක කළ සභාවක් නව ආණ්ඩුවට දායාද කළ බව පවසන ලදී. එමෙන්ම කොළඹ පළාත් පාලන ආයතනය විසින් වෙන්නප්පුව ප්‍රාදේශිය සභාව බාණ්ඩ කර තිබුනේ කුඩා අමාත්‍යාංශයක් ලෙස වන අතර වාද විවාද කරමින් ජනතාවගේ බදු මුදල් වලට සාධාරණයක් කරමින් කටයුතු සංවිධනය කළ බව පවසන ලදි. විශේෂයෙන්ම 5 වන විධායක ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාගේ කාලය තුල පළාත් පාලන ආයතන වලට නොපැකිලිව ප්‍රතිපාදන ලබා දුන් අතර මග නැගුම,දැයට කිරුළ, මහණැගුම හා නෛතික සම්පත් ගොඩනැගීම ආදිය සියළුම පළාත් පාලන ආයතන වලට අයවැයට කලින් ලබාදීමට කටයුතු කළ බව ප්‍රකාශ කල අතර රජයේ ප්‍රාග්ධන ආදායම් මගින්  ප්‍රාදේශිය සභා ගොඩනැගිල්ල, කිරිමැටියාන කසල අංගනය හා ඇල්බට් ඇෆ් පීරිස් ක්‍රීඩාංගනයේ පිහිනුම් තටාකය ආදිය ඉදි කිරීමට හැකි වූ බව පවසන ලදි. විශේෂයෙන් ග්‍රාමීය තත්වය නගා සිටුවීම සඳහා ලබා දුන් උසාවි දඩ මුදල් ලැබුනු බවද පවසන ලදි. මෙම වියදම් නිසි අයුරින් කළමනාකරණය

නොකලහොත් 2025 වර්ෂයේ මාස 06ක් පමණ ගත වූ පසු වැය ශිර්ෂවල කතා කිරීමට දෙයක් නොමැති වන බව පවසන ලදි. IMF සංකල්පයක් වූයේ සියළුම පළාත් පාලන ආයතන ස්වාධීන කල යුතුයි යනුවෙන් වූ අතර එය එකවර සිදුකළ නොහැකි අතර එය ක්‍රමානුකූලව සිදුකළ යුතු බව පැහැදිලි කරන ලදී. මාරවිල, වෙන්නපුව, දන්කොටුව හා කොස්වත්ත යන පොලිස් වසම් මගින් ග්‍රාමීය සංවර්ධනයට උසාවි දඩ මගින් විශාල දායකත්වයක් ලැබුණු බව පවසන ලදී. එම මුදල් ප්‍රමාණය යම්කිසි ආකාරයකින් බැහැර වන්නේ නම් ඒ සඳහා ක්‍රමයක් යෝජනා කළ යුතුව අතර මේ වනවිට ආණ්ඩුව එය අත්පත් කර ඇති බවද පවසන ලදි. මිනිසුන් දුක් මහන්සි වී හම්බකරන බදු මුදල් වලට සාධාරණයක් ඉටු නොවේ නම් ඵලක් නොමැති අතර ජනතාවගේ සිතුම් පැතුම් අනුව වැඩ කිරීමට වර්තමාන ආණ්ඩුවට නොහැකි වී ඇති බව පැවසූ අතර එය අසාර්ථක වී ඇති බවද පවසන ලදි. එමෙන්ම 125,000කට ආසන්න ජනතාවක් මෙම බල ප්‍රදේශය තුළ ජීවත්වන බැවින් අයවැය පණිවිඩය තුළ ජනතාව වෙනුවෙන් කිරීමට සූදානම් දෑ ඇතුළත් නොමැති බව පවසන ලදි. විශේෂයෙන් සිරිගම්පල බල ප්‍රදේශයේ ජල යෝජනා ක්‍රමය ස්ථිරයෙන් කල යුතු නමුත් අද වන විට කළුවච්චිමුල්ල හා ලිහිරියාගම ජල යෝජනා ක්‍රමය අසාර්ථක වන අතර ඒවා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සහයෝගය වත්මන් ආණ්ඩුව විසින් ලබා නොදෙන බව පවසන ලදි. එමගින් සභාවේ අකාර්යක්ෂමතාවය පිළිබිඹු වන බව පැවසූ අතර උසාවි දඩ මුදල් ගත් කළ ලක්ෂ 400ක පමණ මුදලක් අහිමි වී ඇති බැවින් එය රජය විසින් මංකොල්ල කා දමා ඇති බව පවසන ලදි. එමෙන්ම වයඹ අභිමානය නමින් විරුදාවලිය ලැබූ ස්වයංපෝෂිත සභාවක් බාර දුන් අතර ජනපද රාශියක් ප්‍රාදේශීය සභාවට අයිති අතර ඒවාට අවශ්‍ය ජල පහසුකම් වැසිකිලි හා ප්‍රජාශාලා පහසුකම් ලබා දිය යුතු බව පවසන ලදි. ඒ අනුව නඩත්තු කටයුතු කිරීමට පමණක් ජනතාවගේ මුදල් වැය කිරීම මගින් ඉදිරියේදී අයවැය පිළිබඳ කතා කිරීමට දෙයක් නොමැති වන බව පවසන ලදි. ප්‍රදේශය සභාවේ දරුවන් විශාල ප්‍රමාණයක් ඇති අතර පෙර පාසල් ගත් කළ අප බල ප්‍රදේශයට අයත් පෙර පාසල් පමණක් නොව වයඹ පූර්ව ළමා පෙර පාසල්වල පවා සිටින්නේ අපගේ දරුවන් බව ප්‍රකාශ කරන ලදී. පෙර පැවති කොරෝනා වසංගතය හමුවේ පෙර පාසල් ගුරුවරුන් සහ දරුවන් පිළිබඳව ද අවධානය යොමු කළ අතර එම දරුවන් වෙනුවෙන් ද ඇගයීමක් කල අතර 2026 වර්ෂයේ අයවැය තුළ දරුවන් වෙනුවෙන් මුදලක් වෙන් කර ඇති බවක් දක්නට නොලැබුණු බව පවසන ලදී. වෙන්නප්පුව ජනතාව පසුගිය ඡන්දය කාලවකවානුව තුළ එතුමන්ව අමතක කළ නමුත් එකල ජනතාව වෙනුවෙන් විශාල වැඩ කොටසක් සිදුකළ බව පවසන ලදි. කොරෝනා වසංගතය හමුවේ ප්‍රාදේශීය සභාව විසින් මූලිකත්වය ගනිමින් ජනතාව රැක බලා ගත් බව සිහිපත් කල අතර 2026 අයවැය අසාර්ථක අයවැයක් වන අතර ජනතාවගේ මුදල් මංකොල්ල කෑ ජනතාවගේ සිතුම් පැතුම් ඉෂ්ඨ නොකළ අයවැයක් වන අතර විපක්ෂයක් ලෙස එතුමන්ලා විරෝධතාවය පළ කරන බව පවසන ලදී

ගරු උප සභාපති එස්.ඒ.ඩී.ලාල් ප්‍රියන්ත සියඹලාපිටිය මහතා කතා කරමින්, වසර තුන හතරකට පෙර මේ රට බංකොලොත් රටක් වී තිබූ අතර පෝලිම්වල මිනිසුන් මියගිය අතර දූෂණය වංචාව ඉහවහ ගිය කාලවකවානුවක් පැවති බව පවසන ලදී. ඒ සියලු දේ සමඟ රට විපර්යාසයකට භාජනය වී ජාතික ජන බලවේගය රජයක් ලෙස පැමිණීමට මාර්ගය සැලසුන බව පවසන ලදි. ඉන්පසු මන්ත්‍රී 159 දෙනෙකුගේ යුත් පාර්ලිමේන්තු බලයක් ලබා ගත් අතර මේ රට තිබූ බංකොලොත්භාවයෙන් මිදී අලුත් වැඩපිළිවෙළකට අවතීර්ණ වී ශීඝ්‍ර දියුණුවක් කරා ළඟාවෙමින් පවතින බව ප්‍රකාශ කරන ලදි. එමෙන්ම උද්ධමනය සෘණ අගයක තිබූ අතර එයද තනි ධන අගයක් බවට පත් වී ඇති බව පවසන ලදි. එමෙන්ම ජාතික ජන බලවේගය හරහා ගරු සභාපතිතුමාගේ නායකත්වයෙන් වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ බලය ලබාගත් බවද පවසන ලදී. ඒ අනුව කොට්ඨාස 25 ම ජයග්‍රහණය කරමින් වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ බලය ලබා ගැනීමට හැකි වූ බව පවසන ලදී. ඒ අනුව මංගල අයවැය සිදුකරන පළමු අවස්ථාව මෙය වන අතර ආදායම ලෙස රු.454,646,300.00 ක් පෙන්වා දී ඇති බව පවසන ලදී. මෙහි ස්වයං උත්පාදිත ආදායම 24% ක් පමණ වන අතර මෙම උත්පාදිත ආදායම වැඩි කර ගැනීමේ ක්‍රම රාශියක් මේ වන විටත් සැලසුම් කර ඇති අතර ඒවා මේ වන විට ක්‍රියාත්මක කර ඇති බව පවසන ලදී. ඒ හරහා වෙරළ උද්‍යාන දෙකක් මේ වන විට ක්‍රියාත්මක වෙමින් පවතින අතර 2026 වසර වන විට එමඟින් ආදායම් ලබා ගැනීමේ හැකියාවක් පවතින බව පවසන ලදී. එමෙන්ම ගලි ට්‍රීට්මන්ට් ප්ලාන්ට් එකක් සාදමින් පවතින අතර එමගින් පවා ආදායමක් ලබා ගැනීමට හැකි නමුත් එහි කටයුතු තවම අවසන් කර නොමැති බැවින් එහි ආදායම අයවැයට ඇතුළත් කර නොමැති

බව පවසන ලදී. එපමණක් නොව කසල දායකයක් ස්ථාපිත කර ඇති අතර එහි වැඩ කටයුතුද ගරු සභාපතිතුමාගේ දායකත්වයෙන් සිදුකරමින් යන බව පවසන ලදී. මෙමඟින් ස්වයං උත්පාදිත ආදායම වැඩිවන අතර ඉදිරියේදී විශාල වැඩ කොටසක් කිරීමට ආදායම් ලැබෙන බව පවසන ලදි. එමෙන්ම පුනරාවර්තන වියදම් 90%ක් ඇති බව පවසන ලදී. ගරු මන්ත්‍රී කේ.වී.සුසන්ත පෙරේරා මහතා විසින් මාර්ගවල වළවල් ඇති බවත් මාර්ග නිසි ලෙස නඩත්තු වී නොමැති බවත් පැවසූ නමුත් එසේ වීමට හේතුව පෙර පාලන සමයේ මාර්ගයන් නිසි ප්‍රමිතියකින් තොරව සාදා තිබීම වන බව පවසන ලදී. ඒ අනුව මේ පිළිබඳ තාක්ෂණික නිලධාරීන් සමඟ සාකච්ඡා කළ අතර ඉදිරියේදී මාර්ග නඩත්තු කිරීමේදී ඒවා දිගු කල් පවතින ආකාරයට සෑදීමට පියවර ගන්නා බව පවසන ලදී. ආණ්ඩු පක්ෂය බලයට පත්වීමෙන් පසු මාර්ග විශාල ප්‍රමාණයක් අලුත්වැඩියා කර ඇති බව පවසන ලදී. එමෙන්ම ප්‍රාග්ධන වියදම් සඳහා කෝටියක මුදලක් පමණ ලැබී ඇති අතර එය ප්‍රමාණවත් නොවන බව පවසන ලදී. එහෙත් මුදල් රැස් කර ගත හැකි පරිදි නව යෝජනා ක්‍රියාත්මක කළ අතර එමගින් ලැබෙන ආදායමෙන් ප්‍රාග්ධන වියදම් වලට මුදල් ලබාගත හැකි බව පවසන ලදී. එමෙන්ම රජය විසින් විශාල මුදලක් වෙන්කර ඇති අතර එම මුදල් පළාත් පාලන ආයතන වෙත ගලා එන බැවින් හැම වසමකටම මිලියන 2ක් වැනි මුදලක් වෙන්වී ඇති බව පවසමින් කතාව අවසන් කරන ලදි.

ගරු මන්ත්‍රී එම්.පී.බ්‍රයන් පෙරේරා මහතා කතා කරමින්, 2024 වර්ෂයේදි රු.454,646,300.00 මුදලකට වඩා රු.85,321,333.00ක මුදලක් ගරු රනිල් වික්‍රමසිංහ මහත්තා ජනාධිපති වී සිටි අවධියේදී ලේකම්තුමා විසින් ඉදිරිපත් කළ අයවැයේ ඇති බව පැවසූ අතර 2025 වර්ෂයේදී එය රු.324,488,800.00ක් වැනි තිබියදි අද වන විට රු.454,646,300.00ක් ලෙස අඩු වී ඇති බව පවසන ලදී. මෙහිදි ආදායම් ලබා ගැනීම සම්බන්ධයෙන් වරිපනම් බදු යන තේමාව යටතේ සලකා බැලීමේදී ව්‍යාපාර බදු රු.268,800.00ක් අඩු වීමක් සිදු වී ඇති බව පවසන ලදි. එහෙත් රජයේ 159 දෙනෙකු සිටියදිත් නීති හරි ආකාරයෙන් ක්‍රියාත්මක වූවා නම් එම මුදල ලබා ගැනීමට හැකි වන්නට තිබුනා යන මතය ඉදිරිපත් කරන ලදි. එමෙන්ම කර්මාන්ත බදු රු.11000කින් අඩු වී ඇති අතර රජය සමග ඒකබද්ධ වී ප්‍රදේශයේ කර්මාන්ත පහල යමින් පවතින බව පවසන ලදි.එමෙන්ම ඉඩම් කට්ටි රු.3,100,000.00 වැඩි වී ඇති අතර එමගින් විශාල මුදලක් ලබා ගැනීමට හැකි බව ආණ්ඩු පක්ෂය විසින් නිගමනය කලත් එදා අරගලය මොහොතේ ආණ්ඩු පක්ෂය විසින් වැපිරූ දේ “පත්තු” වෙමින් පවතින බව පවසන ලදි. එමෙන්ම ප්‍රාග්ධන වියදම් වශයෙන් යන්ත්‍රෝපකරණ කුලියට දීමෙන් රු.500,000.00 උපයා ගැනීමට හැකි බව සඳහන් කර ඇති නමුත් නිතරම අබලන්වන යන්ත්‍රෝපකරණ මඟින් ඉහත මුදල උපයා ගත හැකිද යන්න විමසන ලදි. ඒ අනුව මෙම අයවැය බොරුවක් බව ප්‍රකාශ කරන ලදි. එමෙන්ම සුභසාධන සේවා වෙනුවෙන් ක්‍රීඩා පිටි කුලියට ලබා දී රු.139,500.00 උපයා ගැනීමට බලාපොරොත්තු වන නමුත් වර්තමානයේ ගාලවත්ත මොන්ටිකාලෝ ක්‍රීඩා පිටිය සහ බොරලැස ක්‍රීඩා පිටිය වැනි ක්‍රීඩා පිටි රාශියක් ඇති බැවින් 2026 වර්ෂයේදීවත් එය සිදු කිරීමට තරම් මුදලක් වෙන් කර තිබෙද යන්න සැකයක් ඇති බව පවසන ලදි. එමෙන්ම වරෙන්තු සහ දඩ මුදල් අඩු වී ඇති බැවින් මෙය උත්පාදනය කිරීමට දැක්මක් තිබිය යුතු බව පවසන ලදී. එයට විසඳුමක් ලෙස ගෙන ඇත්තේ වයඹ අභිමානය බල්ලට ගොස් බල්ලන් වයඹ අභිමානයට පැමිණියා වැනි දෙයක් බව පවසන ලදි. රු.700,000.00ක් උපයා ගැනීමට උත්සාහ කරන නමුත් මීළඟ ඡන්දයට ලියාපදිංචිය සිදු කරනවාද යන්න විමසන ලදී. එමෙන්ම තවත් ආදායම් ලබා ගැනීමේ ක්‍රමවේදයක් ලෙස බලපත්‍ර ගාස්තු යටතේ පජවකරිම ආදායම් ලබා ගැනීමට සූදානම් වුවත් මෙය සංශෝධනය විය යුතු බව පවසන ලදි. එයට හේතුව මෙමගින් සමාජයට වැරදි අර්ථකථනයක් යා හැකි බව පවසන ලදි. රු.1000 බැගින් සම්භාහන මධ්‍යස්ථාන 600ක් ස්ථාපික කිරීමට සූදානම් කරනවාද යන්න විමසන ලදි. එමෙන්ම ගාලවත්ත, සීනෝර් කොලනිය වැනි ඉතා දුගී දුප්පත් ජනතාව සිටින ප්‍රදේශවලින් කැලිකසල ලෙස විශාල මුදලක් ඉපැයීමට ආණ්ඩු පක්ෂය සූදානම් වන බව පවසන ලදි. එමෙන්ම සැපයුම අඩුවීම තුළ නිමැවුම අඩුවෙන් ලැබෙන අතර එය ආර්ථික විද්‍යාවේ සිද්ධාන්තයක් වන බව පැවසූ අතර අලුත්වැඩියා කටයුතු සඳහා යොදවා ඇති මුදල අඩු වී ඇති බව පවසන ලදී. ජීවන දීමනාව රු.922,400.00කින් අඩුකර ඇති අතර වෙනත් දීමනා රු.466,800.00කින් අඩුකර ඇති අතර ගැලපුම් දීමනාව බිංදුවක් වන බව පවසන ලදී. එම දීමනාවන් අඩු කරමින් සේවකයින්ගේ උදව් උපකාර නැතිව යාමට සූදනම් වන්නේ කුමන ආකාරයේ ගමනක්ද යන්න විමසන ලදි. එමෙන්ම අසරණ මිනිසුන්ගේ කැලිකසළවලට පවා බදු මුදල් අයකර කුමන ආකාරයේ සුභසාධනයකට යා හැකිද යන්න විමසන ලදී. එමෙන්ම පෙර තිබූ තත්ත්වයන් වලටත් අඩුවෙන්

සුභසාධනයක් ඇති බව පැවසූ අතර කිරිමැටියාන සහ තවත් තැන්වල ආදාහනාගාර ඇති බැවින් එම ආදානාගාරවලට යොමු කර ඇති ඉන්ධන හා ගෑස් යොමු කිරීම තුළ එදා තිබූ ප්‍රතිඵලයට යෑමට විශාල යෙදවුමක් දැමූ අතර එම යෙදවුම අඩුකර විශාල කාර්යක්ෂමතාවයකින් ගත හැකිද යන්න පවසන ලදී. එම වැඩි කිරීම ළඟා කර ගැනීමට නම් යම්කිසි අලුත්වැඩියාවක් හෝ යම්කිසි නිර්මාණශීලී දෙයක් සිදුකළ යුතු අතර ඒ සඳහාවත් ප්‍රාග්ධන වියදම් වශයෙන් යොමු කර නොමැති අතර මෙම අයවැය සම්පූර්ණයෙන්ම ප්‍රායෝගිකව ඉටුකළ නොහැකි ජන සුභසාධනය හා සේවා සුභසාධනය අවම මට්ටමක පවතින බැවින් මෙම සමාජවාදී වනවාට වඩා ධනවාදී කෝණයකින් බලා පෝසතුන්ට මුදල් මැවීමට සකස් කළ අයවයක් ලෙස අර්ථකථනය කරන ලදී. එමෙන් පසුගිය අයවැය තුළ ගහ,මෝය,ඇළ පිළිබඳව මුදල් වෙන් කර නොමැති වීම් පිළිබඳ කණගාටුවෙන් වත්මන් ගරු සභාපතිතුමා එකල සංවාද කර ඇති නමුත් දුම්මලදෙනිය වැව මාස 06ක් තුල කිසිදු වෙනසක් සිදු නොවී ඇති බව පවසන ලදි. එමෙන්ම ප්‍රෙද්ශය තුල ළමා නිවාස හැ සමිති ඇති බැවින් ඒවාට යම්කිසි මුදලක් යොමු කිරීමටවත් අයවැයෙන් මුදල් යොමු කර නොමැති අතර ඡන්ද ලබා ගැනීමට නම් එම සමිති සමාගම් සමඟ එක්ව කටයුතු කල බව පවසන ලදි. එමෙන්ම ජනගහනය අඩු වීම රටේ විශාල ගැටලුවක් වන බැවින් ප්‍රදේශයක් ලෙස ගත් කල යම්කිසි අත් උදව්වක් රටට ලබා දිය යුතු බව පවසූ අතර මෙම අයවැය හුදෙක් ලියවිල්ලක් පමණක් බව ප්‍රකාශ කරමින් කතාව අවසන් කරන ලදි.

ගරු මන්ත්‍රිනී ඩී.කේ.ඩී.අයෝධා ගිත්මි මෙනවිය කතා කරමින්, වෙන්නප්පුව ප්‍රාදේශිය සභාවේ පහසුකම් සපිරි යහපාලිත පුරවරයක් යන දැක්ම යටතේ 2026 වර්ෂයේ සුභසාධක සේවා රැසක් සිදු කිරීමට කටයුතු සූදානම් කර ඇති අතර විශේෂයෙන් පුස්තකාල උපදේශන කමිටුයේ සහ මන්ත්‍රිමණ්ඩලයේ යෝජනාවන් මත වෙනදා සිදු කල දෙයට වඩා වෙනස් දෙයක් සිදු කිරීමට සභාවේ අනුමැතියට යටත්ව සැලසුම් කර ඇති අතර පුස්තකාල පාඨක සමාජයට පමණක් නොව අවට සිටින ජනතාවටද අවස්ථා සැතසෙන ආකාරයට පුස්තකාල අධ්‍යන වැඩසටහන් වෙනුවෙන් රු.500,000ක මුදලක් වෙන් කිරීමට සැලසුම් කර ඇති බව පවසන ලදි. එමගින් පුස්තකාල පාඨක සමාජය පමණක් නොව අවට ප්‍රජාවද ඉලක්ක වන බැවින් ඉලක්කගත ප්‍රජා සංවර්ධන වැඩසටහන් වෙන්නප්පු ප්‍රාදේශය සභාවේ විවිධ අංශවල ඇති කාර්ය සාධන ඇගයීම් ඇති අතර නිදසුනක් ලෙස වෙන්නප්පුව ප්‍රාදේශිය සභාවේ ගිණුම් අංශය තුල ඇති එක් කාර්ය සාධන ඇගයීමක් වන්නේ කාන්තාවන් මූලික කරගෙන කාන්තාවන්ට මූල්‍යකරණය පිළිබඳ අවස්ථා සලසා දීම බව පවසන ලදි. ඒ අනුව එක් පාඨක සමාජයක් තෝරාගෙන ඒ අවට ප්‍රජාව තොරා ගෙන කාන්තාවන් ඉලක්ක කරගෙන මූල්‍යකරණය පිළිබඳ වැඩසටහන් සිදු කිරීමට බලාපොරොත්තු වන බව පවසන ලදි. මෙමගින් කාන්තාවකට තමන්ගේම ස්වයං ව්‍යාපාරයක් සිදු කිරීමේදි තම ව්‍යාපාරය දියුණු කරගන්නා ආකාරය හා පහසුවෙන් හා නිවැරදිව ගිණුම් වාර්තාවක් සකසා ගන්නා ආකාරය පිළිබඳ මූල්‍යමය සාක්ෂරතාවයක් ලබා ගත හැකි බව පවසන ලදි. එමෙන්ම සාහිත්‍ය තරඟ සහ උත්සව සඳහා මෙවර රු.500,000ක් වෙන් කර ඇති අතර සාහිත්‍ය වැඩසටහන වෙනම පැවැත්වීමට සැලසුම් කර ඇති බව පවසන ලදි. එහි ප්‍රධාන අරමුණ වන්නේ පොත් ඇසුරු කරන ජනතවක් නිර්මාණය කල යුතු අතර මෙහි විශේෂත්වය වනුයේ පුස්තකාල උපදේශන කමිටුව මඟින් නිර්දේශ කරන පොත් 05ක් පමණක් මේ සඳහා යොදා ගැනීම බව පවසන ලදි. එමෙන්ම කාර්ය මණ්ඩලය සඳහා මෙවර අධ්‍යන චාරිකාවක් සඳහා මුදල් වෙන් කර ඇති අතර මෙහි විශේෂත්වය වනුයේ 2025 වසරේ පුස්තකාල කාර්ය මණ්ඩලය චාරිකාවක් රැගෙන ගොස් ඇත්තේ වැය ශිර්ෂය මාරු කර වුවත් මෙවර 2026 වැය ශිර්ෂ මාරු කිරීමට අවශ්‍ය නොවන අතර ඒ සඳහා වෙනම මුදල් වෙන් කිරීමක් සිදු කර ඇති බව පවසන ලදි. එමෙන්ම සාහිත්‍ය මාසය ඉලක්ක කර ගනිමින් තරග පැවැත්වීමට සැලසුම් කර ඇති අතර ඒ සඳහාත් පෙර පැවසූ පොත් 05 නිර්දේශ කර ඇති බව පවසන ලදි. එමගින් දිය හැකි උපරිම ත්‍යාග ප්‍රමාණය ලබා දීමට කටයුතු සිදු කරන බව පවසන ලදි. මෙහිදි වසරකටඩ පොත් 05ක් නිර්දේශ කරන අතර වසර 05ක් තුල පොත් 25ක් කියවා අවසන් වන අතර සුපෝෂිත ප්‍රජාවක් වසර 05 අවසන් වන විට නිර්මාණය වන බව පවසන ලදි. එමෙන්ම ඔවුන් විසින් නිර්මානය කිරන පොහොසත් රටේ ලස්සන ජීවිත ගත කිරීමට බලාපොරොත්තුවෙන් සිටින කුඩා දරුවන්ව දැනුම, ආකාල්ප හා කුසලතා වලින් පෝෂණය කර අනාගතයට ගැලපෙන දරුවෙකු නිර්මාණය කිරීමට පෙර පාසල් පද්ධතිය ශක්තිමත් කිරීමට අවශ්‍ය බව පවසන ලදි. එමෙන්ම 2025 වර්ෂයේදි පෙර පාසල් 04ක් ප්‍රතිසංස්කරණය කර ඇති අතර සෑම වසරකම පෙර පාසල් ප්‍රතිසංස්කරනය කිරීමට බලාපොරොත්තුවක් නොමැති අතර ප්‍රාදේශිය සභාව සතුව පවතින පෙර පාසල් 15

නවීකරණය කිරීමට සැලසුම් කර ඇති බව පවසන ලදි. ඒ සඳහා රු.1,500,000.00 වෙන් කර ඇති බව පවසන ලදි. එමෙන්ම පෙර පාසල් පාලිකා පුහුණු සඳහා මුදල් වෙන් කිරීමක් සිදු කර නොමැති බැවින් ඔවුන් සඳහා අනුග්‍රයක් ලැබෙන බව පවසන ලදි. එමෙන්ම පෙර පාසල් වෙනුවෙන් චාරිකාවක් යාමට සැලසුම් කර ඇති අතර එහි ඒකායන අරමුණ දරුවන්ට හොඳ අධ්‍යාපනයක් ලබා දීමට නම් ගුරුවරුන් හොඳ මානසික මට්ටමක සිටීමට අවශ්‍ය වාතාවරණය ලබා දීම බව පවසන ලදි. පෙර පාසල් අවසන් වැඩසටහන හා ක්‍රීඩා උත්සවය සඳහා රු.1,500,000.00 මුදලක් වෙන් කර ඇති අතර වෙනදට වඩා වියදම් අඩු කරමින් කටයුතු කිරීමට හැකි බව පවසන ලදි. එමෙන්ම අපට ඇති වැදගත්ම වත්කම වන ඇල්බට් ඇෆ් පීරිස් ක්‍රීඩාංගනය තුල විශාල තෙරපීමක් ඇති බැවින් මෙය අවම කිරීමට අවට ඇති ක්‍රීඩාංගන තෝරාගෙන ඒවා නඩත්තු කරමින් ක්‍රීඩකයින්ට භාවිතා කිරීමට හැකි වන අයුරින් සකසා දීමට හැකි  අතර ඒ සඳහාද රු.1,000,000ක මුදලක් වෙන් කර ඇති බව පවසන ලදි. එමෙන්ම වෙන්නප්පු පුරවරයේ ජාතික මට්ටමින් ජයග්‍රහණය කල විශාල ක්‍රීඩකයින් ප්‍රමාණයක් සිටින අතර ඔවුන්ට නිසි ඇගයීමක් ලබා දිය යුතු බව පවසන ලදි. එම නිසා ඔවුන් වෙනුවෙන් රු.500,000.00ක මුදලක් වෙන් කර ඇති බව පවසන ලදි. එමෙන්ම කාර්ය මණ්ඩලයේ සේවක මහතුන් අතරත් දක්ෂ ක්‍රීඩක ක්‍රීඩිකාවන් ඇති බැවින් ඔවුන් වෙනුවෙන් වොලිබෝල් තරඟාවලික් පැවැත්වීමට සැලසුම් කර ඇති අතර ඒ සඳහා රු.200,00.00ක මුදලක් වෙන් කර ඇති බව පවසන ලදි. එමෙනම් ප්‍රජා ශාලා ගරා වැටීම් පිළිබඳ යෝජනා ලැබී ඇති බැවින් හැම ප්‍රජා ශාලාවක්ම නොවුනත් හැම වසමකටම හොඳ ප්‍රජාශාලාවක් ලබා දී නඩත්තු කටයුතු කිරීමට රු.2,000,000.00 වෙන් කර ඇති අතර සමාජ සේවා වැඩසටහන් සඳහාද අවධානය යොමු කල අතර විශේෂයෙන් ආගමික වැඩසටහන්, නත්තල් වැඩසටහන් සහ වෙසක් වැඩසටහන් සඳහා රු.1,000,000.00ක මුදලක් වෙන් කර ඇති බව පවසන ලදි. එමෙන්ම ළමා හා කාන්තා අභිවෘද්ධි වැඩසටහන් සඳහා රු.400,000ක මුදලක්ද, කානතාවන්ගේ ස්වයං රැකියා උත්පාදන වැඩසටහන් සඳහා රු.200,000ක මුදලක්ද පියා නොමැති කාන්තා මුලික පවුල් සඳහා වැඩසටහන් පැවැත්වීමට මුදල් ගෙවීමක් කර ඇති අතර තරුණයක් සඳහා විශේෂ ව්‍යාපාරික අවස්ථා උදා කර දීමටද රු.200,000.00 මුදලක් වෙන් කර ඇති බව පවසන ලදි. විශේෂයෙන් ඉහත වැඩසටහන් සම්බන්ධයෙන් ජංගම සේවාවක් පැවැත්වීම සඳහා රු.300,000.00ක මුදලක් වෙන් කර ඇති බවද පවසන ලදි. එමෙන්ම පරිගණක ආයුර්වේද රෝහල සඳහා රු.500,000ක් වෙන් කර ඇති අතර බවද පවසන ලදි. එමෙන්ම මහයායවත්ත පුස්තකාලයේ ආරක්ෂයව සඳහා වැටක් සහ ගේට්ටු නිර්මාණය කිරීමට හා අලංකාර වටපිටාවක් සකස් කිරීමට රු2,000,000.00ක් වෙන් කර ඇති බවද පවසන ලදි. එමෙන්ම පුස්තකාල පද්ධතියේ පොත් යාවත්කාලින කිරීම වසරක් පාසා සිදු කරන අතර පෙර වසරට සාපේකෂව අලුතින් මිලදී ගැනීම වැඩි කිරීමක් හෝ අඩු කිරීමක් සිදු කර නොමැති අතර  වියදම් කප්පාදු කරන අවස්ථාවකදී පවා රු.4,000,000.00ක මුදලක් වෙන් කර ඇකි බව පවසන ලදි. ඒ අනුව පොහොසත් රටකත් ලස්සන ජීවිතයක් යන තේමාව පෙරදැරි කර ගනිමින් 2026 ජාතික ජන බලවේගයේ ප්‍රතිපත්ති ප්‍රකාශය මත පිහිටා ප්‍රදේශයේ ජනතාව ලබා දුන් බදු මුදල් වලට ලබා දෙන සේවාව ඉතා කාර්යක්ෂමව හා ඵලදායි ලෙස ඉටු කරමින් වයඹ අභිමානය ඉදිරියට රැගෙන යාමට සියලු දෙනාට හැකි වේවායි පතමින් කතාව අවසන් කරන ලදි.

ගරු මන්ත්‍රිනී අයි.නයෝමි රම්‍යලතා මිය කතා කරමින්, රු.454,646,300.00ක අපේක්ෂිත ආදායමක් තුලින් රු.454,598,210.00 වියදම සපුරාගනිමින් රු.48,090.00ක අතිරික්තයක් ලැබෙන පරිදි සකසන ලද මෙම අයවැය දකින්නන්ගේ නෙත් පින වූවත් අසන්නන්ගේ දෙසවන් සැනසුවත් රු.40,000,000.00ක පමණ වෙන්නප්පුව ජනතාවගේ ජීවිත ලස්සන කිරීමටවත් ඔවුන්ගේ පොදු අවශ්‍යතා සපුරා ගැනීමටවත් නොගැලපෙන අසාර්ථක අයවැයක් බව පවසන ලදි. පසුගිය සියලු මැතිවරණයන් හිදි කාන්තාවන් එක මිටට ගනිමින් වෙන්නප්පුව ආසනය තුලත් රට තුල පවා කතා කලත් කාන්තා සුභ සිද්ධිය උදෙසා වෙන් කර ඇත්තේ පුංචි මුදලක් වන බැවින් වෙන්නප්පුව ආසනයේ කාන්තාවන් මග හැරී ඇත්ද යන්න විමසන ලදි. මෙය සභාව නියෝජනය කරන 25%ක් වන කාන්තා මන්ත්‍රිවරියන් හට ලැජ්ජාවට කාරණයක් බව පවසන ලදි. 2018 වසරේ සිට 2023 වර්ෂය දක්වා සිටි මන්ත්‍රිවරියක් ලෙස පෙර අයවැය දැක ඇති අතර එම අයවැය දෙස බැලූ විට වෙන්නප්පුව ජනතාවගේ ජීවනාලිය නගා සිටුවීමට  වෙන් කලාවූ එම ප්‍රතිපාදන සංසන්දනය කල විට මෙවර බසුබෑමක් වී ඇති බව පවසන ලදි. එමෙන්ම මහයායවත්ත පුස්තකාලය එතුමියගේ මැදිහත්වීමෙන් ගොඩ නැගු කර්තව්‍යයක් බැවින් එය අගය කිරීම පිළිබඳව ගරු මන්ත්‍රිනී ඩී.කේ.ඩී.අයෝධා

ගිත්මි මෙනවියට ස්තූතිය පුද කල අතර ප්‍රදේශයේ ජනතාව විශාල පොත් සංඛ්‍යාවක් ලබා දුන් අතර පොත් මිලදී ගැනීමට අයවැය තුල විශාල මුදලක් වෙන් කර තිබෙන නමුත් ඊට අමතරව සිදු විය යුතු කටයුතු වෙනුවෙන් වෙන් කර ඇති මුදල් ප්‍රමාණවල අඩුවක් ඇති බව පවසන ලදි. එමෙන්ම කාන්තාවන්ට විවිධ වැඩසටහන් පැවැත්වීමට මුදල් වෙන් කර ඇති බව පැවසූ නමුත් ඒ සඳහා කාන්තාවන්ට සහභාගී වීමට තිබෙන අවකාශය අඩු බැවින් ග්‍රාමීය මට්ටමින් හා බිම් මට්ටමින් කාන්තාවන්ට නැගී සිටීමට ස්වංරැකියා ඉෂ්ඨ කර ගැනීමට වෙන් කර ඇති මුදල් ප්‍රමාණය වැඩි වුවා නම් සුදුසු බව පව පවසන ලදි. එමෙන්ම පසුගිය සභාව තුලින් විශාල වැඩ කොටසක් සිදු කල අතර කොවිඩ් වසංගතය හමුවේ ජනතාව එන්නත්කරණය කිරීම තුලින් එම රෝගයෙන් මුදවා ගැනීමට විශාල දායකත්වයක් සෞඛ්‍ය අංශයේ නිලධාරින් සම්බන්ධ කර ගනිමින් ප්‍රාදේශීය සභාව මගින ජනතාවට විශාල සේවයක් සපයමින් ඔවුන්ව ආරක්ෂා කල බව පවසන ලදි.
එමෙන්ම නියං කාලවලදි ජනතාවගේ ප්‍රශ්න විසඳීමට විශාල වැඩ ප්‍රමාණයක් සිදු කල අතර වෙන්නප්පුව ආසනය තුල ජීවත් වන ජනතාවට ප්‍රාදේශීය සභාව තුලින් උත්පාදිත ආදායමෙන් පමණක් සියලු අවශ්‍යතාවයන් සපුරා ගැනීමට අපහසු නිසා සභාවක් ලෙස පාලන තන්ත්‍රය දැනගත යුතු අතර මධ්‍යම ආණ්ඩුව හරහා ගෙන්වා ගත යුතු සියලු මුදල් ගෙන්වා ගැනීමට උත්සාහ කල යුතු බව පවසන ලදි. එම කර්තව්‍යද සමහර අවස්ථාවලදි ගිලිහි ගොස් ඇති බව පවසන ලදි. එමෙන්ම සමස්ත ශ්‍රී ලංකාව තුලින් ගොවියා පහතට වැටී අතර ගොවි ජීවිතය බිඳ වැටෙමින් පවතින අතර සභාවක් ලෙස කුමන කර්තව්‍ය කලත් මිනිසාගේ මූලික අවශ්‍යතාවය වන ආහාර අවශ්‍යතාවය සකස් කර ගැනීමට නම් ප්‍රදේශය තුල කෘෂිකර්මාන්තය නගා සිටුවීමට ගොවියාට සකස් කර දිය යුතු දේ වෙනුවෙන් වෙන් කර ඇත්තේ අඩු මුදල් ප්‍රතිපාදනයක් බව පවසන ලදි. එහෙත් පෙර සභාවල්වලදි ගොවියාට අතහිත දෙමින් දිය හැකි උපරිම ශක්තිය ලබා දෙමින් වෙන්නප්පුව ආසනය තුල සමස්ත කෘෂි නිෂ්පාදනය ඉහල නැංවීමට විශාල සේවයක් කල බව පවසන ලදි. එමෙන්ම පෙර පාසල් සම්බන්ධව ගරු මන්ත්‍රිනී ඩී.කේ.ඩී.අයෝධා ගිත්මි මෙනවිය විශාල සංඛ්‍යාත්මක ලේඛනයක් ඉදිරිපත් කල නමුත් ඊළඟ වසර වන විට ඇතුලත් වීමට සිටින ළමුන් ප්‍රමාණය කොපමණදැයි සොයා බලන ලෙස ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටින ලදි. දරුවන් රටේ අනාගතය වන අතර ඒවා රටේ ආයෝජන බව පවසන ලදි. නමුත් සුළු පිරිසකට විශාල මුදලක් වෙන් කරන මොහොතේ රටේ අනෙක් අංශ නගා සිටුවීමට වෙන් කිරීමට අවශ්‍ය මුදල් අතහැර දමමින් ඉහත කී දේවල් සඳහා මුදල් වෙන් කර ඇති බව පවසන ලදි. සුලු දරුවන් ප්‍රමාණයක් සිටින තැන් වලට ගුරුවරුන් වැඩි ප්‍රමාණයක් තබා ගනිමින් විශාල වැටුප් ප්‍රමාණයක් ගෙවමින් විශාල මුදල් නාස්තියක් සිදු කර ඇති අතර නිසි කළමනාකරණයක් නොමැතිව සකස් කල අවැයක් ලෙස 2026 අයවැය පෙන්වා දෙන ලදි. ආදායම් උත්පාදිත වැඩ සටහන් ලෙස අළුත් දේවල්, අළුත් දැක්මක් නොමැති බව පවසන ලදී. පෙර පැවති පාලන කාලයේදි දරුවන් පාසලට ඇතුලත් කිරීමේදී පදිංචිය තහවුරු කරන සිතියමක් ලබා ගැනීමට අවශ්‍ය වූ බැවින් එකල වෙනත් ආයතන වලින් එය ලබා ගත් නමුත් වෙන්නප්පු ප්‍රාදේශීය සභාවේ පුස්තකාලය තුලින් එම සිතියම ලබා දීමේ අවස්ථාව උදාකර දුන් අතර ආදායම් ශීර්ශයට විශාල මුදලක් එක් කිරීමට හැකි වූ බව පවසන ලදී, එවන් වූ වැඩ සටහන් නව ආණ්ඩු පක්ෂය විසින් හඳුනාගන නොමැති බව පවසන ලදී.එමෙන්ම ලමුන්ගේ සාහිත්‍ය දැනුම වර්ධනය කිරීමට අවශ්‍ය නමුත් එමගින් ආදායම් උත්පාදනයක් සිදු නොවන අතර අයවැයක් තුල කතා කිරීමේදී මීට වඩා කතා කිරීමට බොහොමයක් දේවල් ඇති බව පවසන ලදී. ප්‍රජාශාලා නඩත්තු කිරීමට මුදල් වෙන් කිරීම පිළිබඳ ගරු මන්ත්‍රිනී ඩී.කේ.ඩී.අයෝධා ගිත්මි මෙනවිය විසින් කරුණු ඉදිරිපත් කල නමුත් පෙර පාලන කාලය තුල සෑම වසරකටම ප්‍රජා ශාලාවක් ලැබෙන පරිදි කටයුතු කල නමුත් මෙවර අයවැය තුලින් විශාල වැඩ කොටසක් කිරීමට මුදල් නොමැති බව පෙනී යන බව පවසන ලදී. වෙන්නප්පු ආසනය තුල කාන්තා අභිවෘදිය වෙනුවෙන් මීට වඩා මුදල් ප්‍රමාණයක් වෙන් කලානම් සුදුසු බව පවසන ලදී. ඒ අනුව මෙම අයවැය අසාර්ථක අයවැයක් බව පවසන ලදී. එමෙන්ම පෙර පාසල් පාලිකාවන් අධ්‍යාන චාරිකාවක් රැගෙන යාම කිසිම ගැටළුවක් නොමැති නමුත් ඊට වඩා අයවැය තුලින් සපුරා ගතයුතු ඉලක්ක, අවශ්‍යතා තිබියදී ඒවා නොතකා අවශ්‍යතා යටපත් කරමින් අනවශ්‍ය අවශ්‍යතා ඉහලට නංවා ඇති අයවැයක් බව ප්‍රකාශ කරන ලදී. ආදායම් උත්පාදිත වැඩසටහන් ලෙස දරුවන් සඳහා දිවා සුරැකුම් මධ්‍යස්ථාන ස්ථාන ඉදිකර ඒ තුලින් යම් ආදායමක් සභාවට ලබා ගැනීමට තිබුනා යන යෝජනාව සිදුකරන ලදී. එමෙන්ම වර්ථමානය වන විට මිනිසුන් නිදන්ගත රෝග වලින් පෙලෙන අතර විශාල වශයෙන් ආයුර්වේද කරා ලඟාවන බව දක්නට ලැබෙන අතර බටහිර වෛද්‍යවරුන් සොයාගෙන යාමට මිනිසුන්ට

මුදල් නොමැති හෙයින් ජනතාව සොයන සහ ජනතාවට වාසිදායක වන ආයුර්වේද වෛද්‍ය ක්‍රමය මගින් මුදල් උත්පාදනය කිරීමට නම් ආයුර්වේද මධ්‍යස්ථාන සඳහා පහසුකම් සැපයීමට විශාල මුදලක් වැය වූවානම් මීට වඩා මෙම අයවැය අති සාර්ථක වන්නට තිබුනා යැයි පවසන ලදී.වෙන්නප්පුව ආසනයේ ජනතාවගේ බදු මුදල් වලින් ආදායම් සකස් කර ගන්නා බැවින් වෙන්නප්පුව ආසනේ ජනතාවගේ මූලික අවශ්‍යතා ඉටු නොවේනම් ජනතාව බලාපොරොත්තු වන දේ ඉශ්ඨ නොවේනම් වෙන්නප්පුව ආසනය තුල සකසන්නා වූ අයවැයේ ප්‍රතිඵලය කුමක්ද යන්න විමසන ලදී.මහපොළොවේ නෙළුම් මල් මෙන්ම කිඩාරන් මල්ද පිපෙන බැවින් පක්ෂයක් ලෙස ගත් කල පෙර කාලවලදී මෙන්ම වර්ථමානයේදීත් මත්ද්‍රව්‍ය උවදුර පවතින අතර එම කටයුතු සිදු කරන මිනිසුන්ගේ ආකල්ප මත එවන් දෑ සිදුවන බව පවසන ලදි. ඒ අනුව 2026 වසර තුල නිර්මාණය වූ අයවැය අති අසාර්ථක බව පවසනමින් කතාව අවස්න කරන ලදි.

ගරු මන්ත්‍රී කේ.බී.වරුණ පෙරේරා මහතා කතා කරමින්, විපක්ෂය විසින් ඉදිරිපත් කල සමහර අදහස් පිලිගත හැකි වුවත් පොහොසත් රටක් ලස්සන ජීවිතයක් යන තේමාව යටතේ නව ආණ්ඩුවක් පත් වී වසරක කාලයක් ගත වූ අතර ප්‍රාදේශීය සභාවක් ලෙස පත් වී මාස 06ක් පමණ කාලයක් ගත වී ඇති බැවින් එම කාලය තුල ගරු සභාපතිතුමා හැර අනෙක් ආණ්ඩු පක්ෂ මන්ත්‍රිවරුන් ආධුනික වන අතර සභා වාර කිහිපයක්ම නියෝජනය කල ජ්‍යෙෂ්ඨ මන්ත්‍රිවරුන්ද සිටින බව පවසන ලදි. එබැවින් සියලුම දරුවන්ට සාරවත්ව වැඩෙන්නට පුලුවන් සමාජයක් රටේ නිර්මාණය කිරීමට බලාපොරතේතු වන බව පවසන ලදි. ප්‍රාදේශිය සභාවට කල හැකි සීමාවක් ඇති අතර සමස්ථ රජය විසින් කරන සියලු කාර්යයන් ප්‍රාදේශිය සභාවට කල නොහැකි බව පවසන ලදි. සභාවක් තුල තිබෙන මුදල කලමනාකරණය කර ගනිමින් කටුයුතු කල යුතු අතර මධ්‍යම රජයෙන් හෝ පළාත් සභාව විසින් හෝ සභාවේ කටුයුතු වලට හෝ ප්‍රදේශයේ කටයුතු වලට මැදියත් වන ක්‍රමයක් ඇති අතර සෑම දෙයක්ම සභාව විසින්ම කල දේවල නොවන බව පවසන ලදි. එහෙත් සමහර ඉහත මන්ත්‍රිවරුන්ගේ අදහස් ප්‍රකාශ කිරීම් තුලින් ගම්‍ය වූයේ සෑම දෙයක්ම ප්‍රාදේශය සභාව තුලින් සිදු කල යුතු අතර එය කිරීමට මෙම අයවැය ප්‍රමාණවත් නොවන බවට ඇතැම් අය පැවසූ බව පවසන ලදි. අයවැයක් ගත් කල ශිර්ෂ වලින් ඉදිරිපත් කර ඇති දෙයට වඩා කල හැකි දේවල් තිබෙන නමුත් ඉදිරියේදි එම වැඩකටයුතු සිදු කරන බව පවසන ලදි. එමෙන්ම කලින් පාලනය කල කණ්ඩායම් රට හොඳින් පාලනය කලා නම් ජාතික ජන බලවේගයට අද වන විට බලයක් හිමි නොවන බව පවසන ලදි. ගරු මන්ත්‍රී කේ.වී.සුසන්ත පෙරේරා මහතා විසින් ජපතාවගේ සිතුම් පැතුම් පිලිබඳ හැඟීමක් නොමැති බවට ප්‍රකාශ කල නමුත් ජනතාවගේ සිතුම් පැතුම් ඇත්තේම වැරදි වන අතර කාලාන්තරයක් තිස්සේ ඔවුන් හුරු වී ඇති ආකාරයට බව පවසන ලදි. එමෙන්ම නීත්‍යානුකූල නොවන වෙනත් ක්‍රම වලින් මිනිසුන් දේවල් බලාපොරෝත්තු වන අතර නිවරදි ක්‍රමයක් තුල ගමන් කිරීමේදි එම මිනිසුන්ගේ අවශ්‍යතාවන් හදිසියේ ඉෂ්ඨ කිරීමට නොහැකි බව පවසන ලදි. එමෙන්ම මිනිසුන්ගේ සිතුම් පැතුම් හඳුනා නොගෙන කටයුතු කිරීම තුලින් අදාල නායක්යින්ව එලවා දැමු අතර ඒ හරහා ජාතික ජන බලවේගය බලයට පත් වූ බව පවසන ලදි. සභාව සතුව පවතින සීමිත සම්පත් උපයෝගි කර ගනිමින් කටයුතු කිරීමට සිදු වී ඇති අතර කොට්ඨාස 25ක් ඇති බැවින් එක් කොට්ඨාසයටකට පමණක් විශේෂ අවධානයක් ලබා දිය නොහැකි අතර සම්පත් ඌනතාවය තේරුම් ගනිමින් කටයුතු කල යුතු බව පවසන ලදි. එමෙන්ම ඉදිරියේදි එම ගැටලු මගහරවා ගනිමින් කටයුතු කිරීමට ඉදිරි සැලසුම් සිදු කර ඇති බැවින් මෙම අයවැය කිසිසේත්ම එකඟ විය නොහැකි අයවැයක් බව විපක්ෂයේ මන්ත්‍රිවරුන් හා මන්ත්‍රිවරියන් විසින් ඉදිරිපත්කල ප්‍රකාශයන් භාර ගත නොහැකි බව පවසන ලදි. ඒ අනුව සභාවක් ලෙස බලාපොරොත්තු වන්නේ ජනතාවගේ සිතුම් පැතුම් තේරුම් ගනිමින් ඒවාට අවශ්‍ය ආකාරයේ සේවාවක් සැපයීම වන අතර මෙම අයවැය හුදකලා අයවැයක් නොවන අතර සභාවට අවශ්‍ය සහයෝගය මධ්‍යම රජයෙන් ලැබෙන අතර ඉදිරියට යාම ගැයලුවක් නොමැති බව පවසමින් කතාව අවසන් කරන ලදි.

ගරු මන්ත්‍රී බී. ඒ.එස්. සාන්ත පෙරේරා මහතා කතා කරමින්, ප්‍රාදේශිය සභාව මේරි ලැරින් පෙරේරා මහත්මියගෙන් ආරම්භ වූ අතර එතුමිය රු.100,000ක් වැනි මුදලකින් ආරම්භ කල අතර වර්මානය වන විට කෝටි ගණනක් මුදලකට හිමිකම් කියන සභාවක් බවට වෙන්නප්පුව ප්‍රාදේහිය සභාව පත් වී ඇති බව පවසන ලදි. එමෙන්ම පෙර පැවත පාලන කාලයන් තුල වෙන්නප්පුව ප්‍රදේශයට විශාල සේවාවක් කල බව

ප්‍රකාශ කරන ලදි. එමෙන්ම අති ගරු පෙස්ටස් පෙරේරා මහතා වෙන්නප්පුව ප්‍රදේශය දියුණු කිරීමට ඉතා වෙහෙස වූ අතර අති ගරු පෙස්ටස් පෙරේරා මහතා, ලැරින් මහත්මිය සහ නිරෝෂන් පෙරේරා මහතාව එම මොහොතේ ගෞරවයෙන් සිහිපත් කරන ලදි. එමෙන්ම යහපාලන සමයේ නිරෝෂන් පෙරේරා මහතා විසින් මන්ත්‍රීවරුන්ට ප්‍රතිපාදන ලබා දුන් අතර එම මුදල් වලින් උදාසිරිගම කොට්ඨාසයේ නිවෙස් 31ක් සාදා දුන් බව පවසන ලදි. එමෙන්ම සියලු මාර්ග හා ඇළක් ප්‍රතිසංස්කරණය කල බව පවසන ලදි. එමෙන්ම දේශපාලන වශයෙන් වෙනස් වූවත් දැඩි තීරණ හා තීන්දු නොගෙන දේශපාලනය කල නොහැකි බව පවසන ලදි. වෙන්නප්පුව සිට කොළඹ දක්වා කි.මී.40ක පමණ දුරක් ඇති බැවින් යාපනයේ සිට මගීන් විශාල ප්‍රමාණයක් පැමිනෙන බැවින් කටුනායක් ගුවන්තොටුපල දක්වා කි.මී.25ක් ඇති බැවින් එම පුද්ලගයින් සඳහා නවාතැන් ගැනීමට ස්ථාන සාදා දීම තුලින් ආදායම් ලබා ගත හැකි බව යෝජනා කරන ලදි. එමෙන්ම ලුණුවිල ප්‍රදේශයේ අක්කර 20ක පමණ වසා දැමූ උළු මෝලක් ඇති අතර එය මිලදී ගැනීමෙන් වෙන්නප්පුව තුල ඇති විවිධ මධ්‍යස්ථාන එම ලුණුවිල ප්‍රදේශයට ගත හැකි අතර  එමගින් එක් කලාපයක් බවට පත් කර ගැනීමෙන් වෙන්නප්පුව නගරය තුල වැඩි ඉඩක් ඉතිරි කර ගැනීමට හැකි වන බව පවසමින් කතාව අවසන් කරන ලදි.

ගරු මන්ත්‍රී ඩී.මනෝජ් ඉන්දික මධුෂාන් පෙරේරා මහතා කතා කරමින්, පොහොසත් රටක් ලස්සන ජීවිතයක් තේමාව කර ගනිමින් සිදු කරන දේශපාලනය තුල 2026 මංගල අයවැය ඉදිරිපත් කිරීමට ලැබීම සහ එයි කථිකයෙක් ලෙස ඉදිරිපත් වීමට ලැබීම පළිබඳ සතුටු වන බව පවසන ලදි. කඩා වැටුනු රටක් කඩා වැටුනු සමාජයක් ගොඩනැගීමට විශාල සහෝදර සහෝරියන් ප්‍රමාණයක් සිටි අතර ඔවුන් සියලු දෙනාවම එම මොහොතේ සිහිපත් කරන ලදි. මෙම අයවැය විවාදයට පැමිණීමේදි කුමන ආකාරයේ සාධනීය ගැටලු වලට පිලිතුරු සැපයීමට සිදුවේද යන්න චකිතයක් තිබූ නමුත් මේ රටේ සහ මේ සමාජයේ සෑම ප්‍රශ්නයකටම මුල් වූ පුද්ගලයින් පිළිතුරු අසන විට ඉතා ලැජ්ජාවක් ඇති වූ බව පවසන ලදි. විපක්ෂයේ මන්ත්‍රීවරුන් විසින් සාධනීයව ආදායම් ඉලක්ක සඳහා අලුත් යෝජනා ඉදිරිපත් කරනු ඇතැයි සිතුවත් කිසිදු සාධනීය කරුණක් නොදුටු බව පවසන ලදි. එමෙන්ම මෙම අයවැය යෝධ සංවර්ධන අයවැයක් නොවන නමුත් කෙටි කාලයක් තුල ස්ථාවර වන අයවැයක් බව පෙන්වා දෙන ලදි. සභා ගර්භයේ සිටින ඇතැම් පුද්ගලයින් සමාජයේ විවිධ ස්ථානයන් තුල ආණ්ඩු පක්ෂයට මෙම ප්‍රාදේශයි සභාව තුල බලය පවත්වාගේන යාමට නොහැකි බව පවසා තිබූ නමුත් එම පුද්ගලයින්ටම 2026 අයවැය පිළිබඳ කතා කිරීමට ලැබීම දෛවයේ සරදමක් බව ප්‍රකාශ කරන ලදි. එමෙන්ම සිරිගම්පල ජනපදය පිළිබඳ කිරි එරුනු මන්ත්‍රීතුමාට ඒ පිළිබඳ පිළිතුරක් ලබා දීමට අවශ්‍ය බව පවසන ලදි. එ අවුය සිරිගම්පල ජනපදය තුල ජීවත් වන මිනිසුන් යම් යම් ආර්ථික මට්ටම්වල සිටියත් ඔවුන්ගේ ස්ව උත්සහයෙන් ඉදිරියට ගොස් ඇති බව පවසන ලදි. එමෙන්ම සිරිගම්පල ජනපදයට පැමිණ බලන ලෙස අභියෝග කරන ලදි. සිරිගම්පල ජනපදයේ ප්‍රධානම ගැටලුවක් වන්නේ ගංවතුර ගැටලුව වන අතර වසර ගණනාවක් ගියද එම ගැටලුවට නිසි පිලිතුරක් ලබා දීමට පෙර සිටි පාලකයින්ට නොහැකි වූ බව පවසන ලදි. එම සියලු ගැටලු වලට මේ වන විට පිලිතුරු සෙවීමට සිදු වී ඇති බව පවසන ලදි. පෙර පාලන කාලයන් තුල යම් සාධනීය සංවර්ධන ව්‍යාපෘති සිදු කර ඇති අතර ඒ පිලිපද කිසිදු කුහකත්වයක් නොමැති බව පවසන ලදි. විශේෂයෙන් කොම්පෝස්ට් කටයුතු සම්බන්ධයෙන් මිලියන 1.7ක් උපයා ඇති අතර 2026 වන විට ලක්ෂ 40ක් දක්වා විශාල ඉල්ක්කයක් කරා ගමන් කිරීමට බලාපොරොත්තු වන බව පවසන ලදි. එමෙන්ම පරිසර බලපත්‍ර ගාස්තු හරහා උපයා ගන්නා මුදල් වැඩි කර ගැනීමට බලාපොරොත්තු වන බව පවසන ලදි. එමෙන්ම ප්‍රාදේශිය සභාවක් ලෙස පැවති ප්‍රධානම ගැටලුව වූයේ ගෝගාතකාගාර ගැටලුව වන අතර එයට විසඳමක් සෙවීමට බලාපොරොත්තු වන බව පවසන ලදි. එමෙනම රටක පාලකයින් මිනිසුන් පිළිබඳ මෙන්ම සතුන් පිළිබඳවද සහකම්පාවක් තිබිය යුතු වන අතර මිනිසුන් විපක්ෂයේ මන්ත්‍රීවරුන්ව ප්‍රතික්ෂේප කලා සේම සුනඛයින්ට සිංහල භාෂාව හැකි වූවා නම් ඔවුන්ද විපක්ෂය ප්‍රතික්ෂේප කරන බව පවසන ලදි. එමෙන්ම ප්‍රාදේහිය සභා බල ප්‍රදේශය තුල කෙතරම් සුනඛ ලහනයක් සිටිනවාද යන්න නිවැරදි දත්තයක් නොමැති අතර ඉදිරියේදි ඒවාද විධිමත්ව නියාමනය කිරීමට බලාපොරොත්තු වන අතර පොදු මහ ජනතාවට සුනඛයින්ගෙන් සිදු වන හානි අවම කර ගනිමින් විධිමත්ව පාලනය කිරීමට බලාපොරෝත්තු වන බවද බවසන ලදි. එමෙන්ම කසල රැස් කරන සෞඛ්‍ය කම්කරුවන් අවම පහසුකම් යටතේ සේවය කරන අතර 2026 වසරේ ඔවුන් වෙනුවෙන් නිල ඇඳුමක් ලබා දී ගෞරවාන්විත ආකාරයෙන්

රැකියාව කිරීමට අවශය පසුබිම සැකසීමට බලාපොරොත්තු වන බව පවසන ලදි. එමෙන්ම කසල රැස් කරන ට්‍රැක්ටර් රථ වලට නලා සවි කර මිනිසුන්ට එය ඇසීමට සලස්වන බව පවසන ලදි. මිනිසුන්ගේ ගැටලු හඳුනා ගනිමින් විසඳුම් දීම බලධාරින්ගේ යුතුකම් වන බව පවසන ලදි. එමෙන්ම “සෙක්කුව ලගට වෙලා පුන්නාක්කු කාපු මිනිස්සු, අපි සෙක්කුව ලගට වෙලා චොක්ලට් එකක් කෑවම හිතන්නේ අපිත් පුන්නාක්කු කනවා කියලා” යනුවෙන් ප්‍රකාශයක් සිදු කල අතර එදින උදෑසන විපක්ෂයේ මන්ත්‍රීවරුන් සභාපතිතුමෙකුගේ මරණයක් සම්බන්ධයෙන් විරෝධතාවයක් එල කරනවා දුටු බව පැවසූ අතර ඒ පිළිබඳ දොස් නොකියන බවද පවසන ලදි. එමෙන්ම කිසිම මනුස්සයෙක් අකාලයේ මිය යාමට අවශ්‍ය නොවන නමුත් රතු පස් වල මිනිසුන් ජලය ඉල්ලා මරණයට පත් වෙද්දි මිනිසුන් උද්ගෝෂණය කරන විට මිනිසුන්ව මහ පාරේ වෙඩි තබා ඝාතනය කල මොහොතේ වචනයක්වත් කතා නොකල මිනිසුන් එදින විරෝධතිවයක් සිදු කිරීම පිළිබඳ කණගාටු වන බව පවසන ලදි. ඉන්පසු අතිගරු ජනාධිපති අනුර කුමාර දිසානායක මහතා මෙවර ඉදිරිපත් කල අයවැය කතාවේ ඡේදයක් ඉදිරිපත් කරන ලදි. “අතීත දරුවන්ගේ පරම්පරාවට මේ රට ඔවුන්ගේ නිවහන ලෙස සැබෑ ආඩම්බරයකින් කතා කරන්න බැරි වුනා. නමුත් අනාගත පරම්පරාව ඒ ඛේදවාචකයෙන් මුදා ගත යුතුයි. වඩා ලස්සන රටක් වෙනුවෙන් තමන්ගේ සෑම සිහිනයක්ම කැප කරමින් ඒ ලස්සන රට බිහි වන්නට පෙර මිය ගිය සෑම හදවතකම ප්‍රාර්ථනාව තිබුනේ මේ රට ලස්සන රටක් කරනවා දකින සිහිනයයි. අපි දෙවුර මතට ගෙන තිබෙන්නේ ඒ පවිත්‍ර මිනිසුන්ගේ මරණාසන්න ප්‍රාර්ථනාවන්. ඒ ප්‍රාර්ථනාවන් දේව වාක්‍ය තරම් උවමනාවකින් අපි ඉටු කරනාවා. අඳුරු වලාකුළු වලින් ඔබබට හිරු බබලන බවත් අඳුරු වලාකුළු පහව යන බවත් අපි විශ්වාස කරනවා. ඒ වගේම අන්ධකාරය මැද දීප්තිමත් රිදී රේඛාවන් නිශ්චිතවම පායන බවත් අපි විශ්වාස කරනවා. මේ අපි යන ගමනේදි සතුරන්ගේ වියරු කෑ ගැසීම් අපට නෑසෙන බවත් රටේ පුරවැසියන්ගේ අධිෂ්ඨානශීලි බලාපොරොත්තු සහගත දෑස් පමණක් අපට පෙනෙන බවත්” පවසමින් කතාව අවසන් කරන ලදි.

ගරු මන්ත්‍රිනී ජේ.ඒ.ඩී.ජසින්තා ඉන්ද්‍රානි මිය කතා කරමින්, ගරු මන්ත්‍රී ඩී.මනෝජ් ඉන්දික මධුෂාන් පෙරේරා මහතා විසින් බල්ලන්ට පුලුවන්කමක් තිබුනා න්ම විපක්ෂයේ මන්ත්‍රිවරුන්ව බල්ලොත් ප්‍රතික්ෂේප කරනවාය යනුවෙන් ප්‍රකාශයක් සිදු කල නමුත් ආණ්ඩු පක්ෂයද බල්ලෝ විසින් අවුරුදු ගණනාවක් ප්‍රතික්ෂේප කල බව පවසන ලදි. දේශපානයේදි කිසිදිනක ස්ථාවරත්වයක් නොමැති අතර එය වෙනස් වන බව පවසන ලදි. ආණ්ඩු පක්ෂය විසින් මිනිසුන්ව මුසා පවසා රවටා ගත් අතර පෙන්නු ප්‍රතිරූපය සම්පූර්ණයෙන්ම වෙනස් බව පවසන ලදී. එම නිසා එතුමා විසින් කළ කතාව ඉල්ලා අස්කර ගත යුතු අතර කිසිදු අයෙකුව බල්ලන් යනුවෙන් හැඳින්වීම නුසුදුසු බව පවසන ලදි. එමෙන්ම ආණ්ඩු පක්ෂය තුළ ගුරුවරුන්, ව්‍යාපාරිකයන් හා ඉංජිනේරුවරුන් සිටින බැවින් මීට වඩා හොඳ දැක්මක් සහිත අයවැයක් බලාපොරොත්තු වූ බව පවසන ලදී. සංසන්දනාත්මක බලන කල නව උත්පාදනයක් බලාපොරොත්තු විය හැක්කේ 2024-2025 අපේක්ෂිත ආදායම අඩුවෙන් බලාපොරොත්තු වන අයවැයක් වන බව පවසන ලදී. එමෙන්ම ප්‍රාදේශීය සභාව විසින් බල ප්‍රදේශයේ ජනතාව ආරක්ෂා කරගත්තු යුතු අතර වක්‍රාකාරයෙන් ජනතාව මත බදුබර පටවා ඇති අතර කුණු බද්ධ එයට නිදසුනක් ලෙස පෙන්වා දෙන ලදි. සුනඛයින් ලියාපදිංචිය සිදු කිරීම සුදුසු වුවත් එයට වඩා ඵලදායි වන්නේ අයාලේ යන සුනඛයෙන් පාලනය කිරීම සඳහා මුදලක් වෙන් කිරීම බව පවසන ලදී. එමෙන්ම සෞඛ්‍ය ආධාර පිළිබඳ අයවැයෙහි සඳහන් කර ඇති නමුත් මාතෘ හා ළමා යන කොටස සඳහා කිසිදු මුදලක් වෙන් කර නොමැති බව පවසන ලදී. කුමන රට සෑදීමටත් මූලික වන්නේ අනාගත පරම්පරාව වන බැවින්, අනාගත පරපුර නිරෝගී වීම වැදගත් බව පවසන ලදී. මාතෘත්වය යන මහා පදවිය ලෙස නිසි ලෙස රැකගැනීමට නොහැකි වුවහොත් හෙට දින උපදින දරුවා මල උපතක්, අඩුබර උපතක් හෝ ආබාධිත උපතක් විය හැකි බැවින් ගර්භනී දරුවන්ට නිසි පෝෂණය ලබාදීම වැදගත් බව පවසන ලදී. ලංකාවේ අඩුබර උපත් ප්‍රමාණයේ 14% ඉක්මවා ඇති අතර ආහාර උද්ධමන ඉහළ ගිය අතර ආහාර අනාරක්ෂිත භාවය ඉහළ ගොස් ඇති බව පවසන ලදී. නව ආණ්ඩුව බලයට පැමිණ වසරක් ගත වූ වුවත් බඩු මිල පහත දැමීමක් සිදුවී නොමැති බව පවසන ලදී. සෙන්දිරියාමුල්ල, කළුවච්චිමුල්ල, මහායායවත්ත හා ලූකස්වත්ත යන ප්‍රදේශවලින් ජීවත්වන අඩු ආදායම්ලාභී කිරිදෙන මව්වරුන් පිළිබඳ වැඩි අවධානයක් ලබාදීම කළ යුතු බව පවසන ලදී. 3%ක් පමණ ළදරු මරණ පළමු පැය 24 තුළ සිදුවන අතර එයට හේතුව වන්නේ නොමේරූ දරු උපත්, අඩු බර දරු උපත් වන බැවින් එයට හේතුවද මව්වරුන්ට නිසි

පෝෂණය නොමැති වීම බව පවසන ලදී. පුස්තකාල හා පෙර පාසල් සඳහා කොපමණ මුදලක් වෙන් කළත් ඒවාට යොමු කිරීමට නිරෝගී දරුවන් නොසිටියහොත් එයින් ඵලක් නොමැති බව පවසන ලදී. දරුවන් නිරෝගි නොවන්නේ නම් එය පිටුදැකීම ප්‍රාදේශීය සභාව හරහා සිදුකළ යුතු අතර මේ සඳහා කිසිදු මුදලක් අයවැය තුළ වෙන් කර නොමැති බව පවසන ලදී. එම නිසා මෙම ගැටලුව හඳුනාගෙන පෝෂණ ආහාර ලබාදීමේ වැඩපිළිවෙළක් හා විටමින් ඌනතා වලින් පෙළෙන ගර්භනී මව්වරුන් සහ කිරි දෙන මව්වරුන් වෛද්‍ය නිර්දේශයන් අනුව විනිවිද භාවයකින් යුතුව වෛද්‍යාධාර ලබාදීමේ වැඩසටහන් ආරම්භ කරන ලෙස යෝජනා කරන ලදී. එමෙන්ම දරුවන් බලාපොරොත්තුවෙන් සිටින නව යුවල් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම සුදුසු අතර පෝෂ්‍යදායී ආහාර රටාවකට ඔවුන්ව යොමු කිරීමේ ප්‍රායෝගික දැනුම ලබාදීමට සුදුසු වැඩසටහනක් සෑම මසකම පැවැත්වීම සුදුසු බව යෝජන කරන ලදී. එමෙන්ම දුප්පත් ගම්මාන වල ඇති සෞඛ්‍ය මධ්‍යස්ථාන ගරා වැටී ඇති අතර ඒවා ප්‍රතිසංස්කරණය කර අවශ්‍ය පහසුකම් ලබා දීම සුදුසු බව යෝජනා කල අතර ඒ සඳහා වැඩි මුදලක් වෙන් කරන ලෙස ඉල්ලමින් කතාව අවසන් කරන ලදී.

ගරු මන්ත්‍රී ආර්.එම්.ශ්‍යාම් පෙරේරා මහතා කතා කරමින්, අයවැය විවාදය තුල විවිද කතා වලට ඇහුන් කන් දුන් අතර මේ සෑම දෙයක්ම ජනතා මුදල් වන බව මතක තබා ගතයුතුය යන්න ප්‍රකාශ කරන ලදී.

තම තමන් දෙස ඇඟිල්ල දික් කර බැලූ විට කාන්තා සුභසාධනය වෙනුවෙන් තමන් කළේ කුමක්ද යන්න කල්පනා කර බලන ලෙස පවසන ලදී. එක් වරක් 1978 ව්‍යවස්ථාව සාදන විට ජේ.ආර්.ජයවර්ධන මහතා විසින් කළ ප්‍රකාශය ඉදිරිපත් කරන ලදී. එනම් “දුර කාලයකට පසු නැවත අවශ්‍ය නැති බවයි” එහෙත් හිටපු ගරු සභාපති තුමා නැවත පැමින සිටින අතර මාර්ග සංවර්ධනය වී නොමැති බව පවසන බැවින් ඒවා පවසන්නෙ රෙදි ඇතිවද යන්න විමසන ලදී. මෙය දෛවයේ සරදමක් වන අතර එළවා දැමුවා නොව එතුමාව පක්ෂයෙන්ම එළවා දැමූ බව පවසන ලදී. මීට සති දෙකකට පෙර සම්මන්ත්‍රණයකට සහභාගි වූ අතර එහිදී සුපිළිපන්භාවය පිළිබඳ පැහැදිලි කර අතර එහිදී තම තමන්ට අවංක වීම ප්‍රථමයෙන් සිදු කළ යුතු අතර මන්ත්‍රීවරුන් විසින් කෝටි ගණන් කියමින් හඩනගන්නේ ජනතාවගේ මුදල් බව පවසන ලදී. එමෙන්ම වරිපනම් මුදල් විනෝද බදු මුදල් හරියාකාරව පාලනය වනවාද යන්න සොයා බැලිමක් කවුරුන් විසින් හෝ සිදු නොකළ බව පවසන ලදී. 2022.3.31 දිනට වරිපනම් බදු හිගය අසූ රු.8,996,000.92 වන අතර එම හිගයෙන් වර්ෂයකට වැඩි, වර්ෂ 05ක අඩු මිලියන 14.98ක් ඇති බව පවසන ලදී. මේවා සොයා බැලුවා නම් අයවැයට සිදු වූයේ කුමක්ද යන්න වටහා ගත හැකි බව පවසන ලදී. ආදායම් ලබාගෙන අයවැය සකස් කර වියදම් පෙන්වා දුන්නත් ඒවා ඵලදායිතාවයකින් භාවිතා වූවාද යන ගැටලුව පැන නගින බව විගණන වාර්තාවේ දක්වා ඇති බව පවසන ලදී. අතිරික්ත සේවකයෙන් 66ක් ඇති බැවින් මධ්‍යම රජය හා පලාත් සභාවෙන් මෙම නාස්තිය වළක්වා ගැනීමට තම ආයතන විසින් වැටුප් ප්‍රතිපූර්ණය කිරීමට පවසා ඇති බව පවසන ලදී. එමෙන්ම වෙළඳපොල ගැටළුව තුල 2001 වර්ෂය සඳහා අයවීමට තිබූ හිඟ බදු මුදල රු.1,157,173.00 වූ අතර අයකර ගැනීම සඳහා 2003 වර්ෂයේ නඩුවක් ද ගොනුකර තිබූ නමුත් බදු දීමට අදාළව අත්සන් කර තිබූ බදු ගිවිසුම අවලංගු නොවන බවට තීන්දු කර වසර 16කට පසුව 2019 වසරේ නඩුව නිෂ්ප්‍රභා කල බව විගණන වාර්තාවේ සඳහන් වී ඇති බව පවසන ලදී. ඒ අනුව වසර 20ක් මුළුල්ලේ මෙය සිදුවූයේ කෙසේද සහ එකල සිටි සභාපතිවරුන් අකර්මණ්‍ය වී හෝ නිද්‍රාශීලී වී සිටියාද යන්න විමසන ලදී. පූර්ණ විගණනයකට පසුව විගණනය සම්බන්ධ ඉදිරි පියවර කුමක්ද යන්න සභාව දැනුවත් කරන ලෙස ලේකම්තුමාගෙන් ඉල්ලා සිටින ලදී. ප්‍රාදේශීය සභා පණතේ පිටු අංක 117 වගන්තිය 172ට අනුව සෑම ප්‍රාදේශ සභාවකම ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන වගන්තියට අදාල විය යුතු බව සඳහන්ව ඇති බව පවසන ලදී. “මම” නොව “අපි” යනුවෙන් සිතමින්, විපක්ෂයේ මන්ත්‍රීවරුන් සැබැවින්ම අයවැයට විරුද්ධ නම් කරුණු සහිතව එය පැහැදිලි කරන ලෙස ඉල්ලා සිටි අතර ඕපාදූප වලින් තොරව සාක්ෂි කරුණු හා සංඛ්‍යා ලේඛන දත්ත මත පදනම් ව ඉදිරිපත් කළ යුතු බව පවසන ලදී. එමෙන්ම ජනතාවගේ බදු මුදල් වලට වගකීමෙන් යුතුව සේවය කළ යුතුය යන පණිවිඩය ප්‍රකාශ කරමින් කතාව අවසන් කරන ලදී.

ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා කතා කරමින්, 1997 ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙක් ලෙස අඛණ්ඩව සිටීමට අවස්ථාව ලබා දුන් ජනතාවට ස්තූතිය පුද කරමින් කතාව ආරම්භ කරන ලදී. එම වසර 28ක කාලය තුල යම් දෙයක් කලා යැයි සිතන බව පවසන ලදී.අද එතුමා පෙනී සිටින්නේ ශ්‍රී ලංකා පොදුජන පෙරමුන නියෝජනය කරමින් බව පැවසූ අතර හිටපු ගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාව සහ වර්ථමාන නායක නාමල් රාජපක්ෂ මහතා, දිස්ත්‍රික් නායිකා චමරි පෙරේරා මැතිනිය සහ ආසන සංවිධායක ට්‍රෙවින් ප්‍රනාන්දු මහතාගේ නායකත්වය තුල විශ්වාසය තබමින් මන්ත්‍රී වරුන් 8 දෙනෙක් ගියවර ඡන්දයෙන් ජනතාව විසින් තෝරා පත්කර දුන් බව පවසන ලදී.ප්‍රාදේශීය සභා අයවැය පිළිබඳ කතා කිරීමට වැඩි යමක් නොමැති අතර එය එතුමන්ලාගේ ක්‍රමවේදයට අනුවම සිදු වී ඇති බව පවසන ලදී.අපේක්ෂිත ආදායම ලස්සනට මවා පැවත් එම අපේක්ෂිත ආදායම උත්පාධිත ආදායම බවට පත් කර ගැනීම සභාපති වරයෙකුගේ දක්ෂතාවය බව පවසන ලදී.පසුගිය පාලන කාලය තුල එම අපේක්ෂිත ආදායම උත්පාධිත ආදායම බවට පත් කිරීමට උත්සාහ කලත් එකල පැවති ස්වාභාවික විපත් හා ජනඅරගල හේතුවෙන් එය කිරීමට නොහැකි වූ බව පවසන ලදී. පෙර පැවති පාලන කාලයෙන් පසු වර්ථමාන ආන්ඩු පක්ෂයට භාර දුන්නේ දුප්පත් නගරයක් නොවන අතර අළුතින් පොහොසත් කිරීමට හා ලස්සන කිරීමට දෙයක් වෙන්නප්පුව නගරය තුල නොමැති බව පවසන ලදී.එමෙන්ම වෙන්නප්පුව යනු පුංචි පාර්ලිමේන්තුවක් වන අතර එය වැඩි දියුනු කිරීමර අවශ්‍ය ශක්තිය ගරු සභාපති තුමාට ලැබේවායි ප්‍රාර්තනා කරන ලදී. ගරු සභාපති තුමාගේ අයවැය ප්‍රකාශය තුල අපේක්ෂිත ආදායම උත්පාධිත ආදායම් බවට පත් කරගන්නා බවට ක්‍රමවේදයන් අයවැය තුල සඳහන් කර නොමැති බැවින් විශ්ව කර්මයක් සිදු කරන්නට යනවාද යන්න විමසන ලදී.මෙහිදී 40% ක වැටුප් ප්‍රතිපූර්ණයක් කරන්නේ කෙසේද යන්න ඉදිරියේදී අභියෝගයක් පැමිනෙන අතර එයට මුහුණ දෙන ආකාරය කුමක්ද යන්න අයවැය ප්‍රකාශයෙහි දක්වා නොමැති බව පවසන ලදී. 2024 වර්ශයේ උසාවි දඩ සත්‍ය ආදායම මිලියන 51ක් වන නමුත් 2026 වර්ශයේ උසාවි දඩ වශයෙන් පෙන්න්වා ඇත්තේ මිලියන 70ක් වන අතර වර්තමාන නෛතික තත්වයන් තුල දඩ මුදල් අඩුවන බැවින් එම මුදල් ප්‍රතිපූර්ණය කරන්නේ කෙසේද යන වග පෙන්වා දී නොමැති බව පවසන ලදී. එමෙන්ම මුද්දර ගාස්තු පෙර වර්ෂයේ සත්‍ය ආදායම් ලෙස ලබා ඇත්තේ මිලියන 46ක් වන අතර අපේක්ෂිත ආදායම මිලියන190 සිට 200ක් පෙන්වා දී ඇති බව පවසන ලදී. ඒ අනුව රට හුන්වත් වීම කෙරෙහි ප්‍රාදේශිය සභාව හුන්වත් වීම බලපාන අතර 2015.01.08 වන දින මේ රටේ හැරවුම් ලක්ෂ්‍යක් වූ අතර එම දිනයේ මහින්ද රාජපක්ෂ ජනතාව රටේ ජනතාව පරාජයට පත් කල මොහොතේ ශ්‍රී ලංකාව හුන්වත් වී නොතිබුනු අතර 2019.11.26 ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා නැවත රට භාර ගනිද්දි වසර 05 තුල රට හුන්වත් කලේ ඔවුන්ද යන වග සභාවෙන් විමසන ලදී. එකල ව්‍යාවස්ථාදායක සභාවේ වත්මන් ගරු ජනාධිති අනුර කුමාර දිසානායක මහතා ඇතුළු කණ්ඩායම සිටි අතර යහපාලනය යනුවෙන් පාලනයක් ඇත කර පාස්කු ප්‍රහාරයක් ඇති කර ආසියාවේ හුන්වත්ම රට බවට පත් කල බව පවසන ලදී. 2020.05.20 කොරෝනා වසංගතය නිසා රට වැසීමට සිදු වූ අතර රට පාලනය කිරීමට හැකි වූයේ මාස 04ක් වැනි කාලයක් වූ අතර එම මොහොතේ ජනතාවගේ ජීවිත ආරක්ෂා කරනවාද නැතහොත් රටේ ආර්ථිකය ආරක්ෂා කරනවාද යන්න තෝරා ගැනීමට සිදු වූ අතර රටේ ජනතාව අංක 01 සහ ආර්ථිකය 02 ලෙස සිතමින් කටයුතු කල බව පවසන ලදී. එම නිසා දකුණු ආසියාවේ ජීවිත හොඳම ආකාරයෙන් බේරා ගත් රට ලෙස හැඳුන්වූ බව පවසන ලදී. ඒ අනුව මෙම හේතුන් නිසා ඩොලර් සංචිතය අඩු වූයේ ඉහත හෙතුව නිසා බව පවසන ලදී. ඒ අනුව ආණ්ඩු පක්ෂය විසින් පවසන ලදි බොරු අද වන විට එකින් එක වත්මන් රජය විසින්ම නිවැරදි කර දෙන බව පවසන ලදී. පළමු බොරුව ඩොලර් පිළිබඳ පැවසූ දෙය වන අතර දෙවන බොරුව විවි රොකට්ටුව වන බව පවසන ලදී. එමෙන්ම මීළඟ බොරුව වන්නේ ඇවන්ගාර්ඩ් නඩුව වන බව පැවසූ අතර ලැජ්ජා විය යුත්තේ ආණ්ඩු පක්ෂය විසින්ම වන බව පවසන ලදී. 2025 ජනතාව විසින් ගත් වැරදි තීරණය නිසා රට අගාධයකට ගිය අතර එම අගාධයෙන් ගොඩ ඒමට තවමත් පුලුවන් වී නොමැති බව පවසන ලදී. 2015 ආරම්භ කල පෝට් සිටි ව්‍යාපෘතිය එපා කියමින් ඇමරිකාවට ගොස් මෙම ව්‍යාපෘතිය නැවත භාර ගන්නා ලෙස ඉල්ලුවත් ඇමරිකාව එය භාර නොගත් අතර නැවත චීනයට ගිය අතර ව්‍යාපෘතිය භාර ගන්නේ නම් ඩොලර් විශාල ප්‍රමාණයක් ඉල්ලා සිටි අතර තවත් අක්කර 100ක් හා හෙක්ටයාර් 33ක් ලබා දුන් බව පවසන ලදී. එහෙත් තවමත් පෝට් සිටි ව්‍යාපෘතිය අවසන් කිරීමට නොහැකි වී ඇති අතර 2015 මෙම වැඩකටයුතු සිදු කරමින් ගියා නම් මෙ වන විට එම වැඩ අවසන් කර සර්වසම්පූර්ණ වන බව පවසන ලදී. එමෙන්ම මේ වන විට විදේශ ණය ගෙවා අවසන් කර නොමැති අතර විදුලි බිල අඩු කරන බවට පවසුවත් එයද සිදු කර

නොමැති බව පවසන ලදි. තැන් තැන් වලට විසිරි ඇති මුදල් එක් රැස් කර ගත්තා නම් රේඛීය අමාත්‍යාංශ වලින් මුදල ලබා ගත හැකි නමුත් මේ වන විට සිදු වන්නේ අපේ මුදල් අමාත්‍යාංශය වෙත ලබා ගැනීම බව පවසන ලදි. එහෙත් පැවති පාලන කාලයන් තුල යුද්ධ වලට පවා මුහුණ දෙමින් රේඛිය අමාත්‍යාංශ වලින් ප්‍රාදේශිය සභාවන් වෙත මුදල් ලබා ගත් බව පවසන ලදි. එම මුදල මගින් විශාල ව්‍යාපෘති සිදු කල අතර මාර්ග විශාල ප්‍රමාණයක් සංවර්ධනය කල අතර වයික්කාල කොට්ඨාසයේ සංවර්ධනය කිරීමට ඇත්තේ තවත් එක් මාර්ගයක් හෝ මාර්ග දෙකක් වැනි කුඩා ප්‍රමාණයක් වන බව පවසන ලදි. එමෙන්ම "ගහලා එලෙව්වා" යන කතාව තුච්ඡ කතාවක් වන අතර මෙය ප්‍රජාතන්ත්‍රවාදි රටක් වන බැවින් කිසිදු අයෙකුට නීතිය අතට ගත නොහැකි බව පවසන ලදි.

සෝෂාව

ගරු මන්ත්‍රී ජේ.එම්.ජනක චමින්ද ජයසේකර මහතා කතා කරමින්, 2025 ජාතික අයවැය ඉදිරිපත් කිරීමේදී අසාර්ථක අයවැයක් ලෙස ප්‍රකාශ කලද වර්තමානයේ දෙවන අයවැය ඉදිරිපත් කල විට ''කට බොරු කීවත් දිව බොරු කියන්නේ නෑ'' යන කතාවට ආර්ථික විද්‍යාවේ මහාචාර්ය වන හර්ශද සිල්වා මහතා විසින් එය හොඳ අයවැයක් බවට භාරගත් බව පවසන ලදී. එමෙන්ම මාස 05කට පසු 2026 අයවැය ඉදිරිපත් කල මොහොතේ විපක්ෂය එය අසාර්ථක කෝණයකින් බලා ඇති බව පවසන ලදී. රට බාර ගනිද්දී ආණ්ඩු පක්ෂයේ මූලික සංකල්පය වූයේ පොහොසත් රටක් ලස්සන ජීවිතයක් යන තේමාව වූ අතර දවසින් දවස වැඩ කටයුතු කරගෙන යාමේදී හිමි වූයේ හොඳ රටක් නොවන අතර එයට වගකිව යුත්තේ අනුර කුමාර දිසානායක මයා ඇතුළු කණ්ඩායම බව ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා විසින් පැවසූ බව පවසන ලදී. සමගි ජන බලවේගයේ මන්ත්‍රීවරු මෙන්ම එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුන් මහ සභාව තුල සිටින බැවින් ඔවුන්ගේ පාලකයන් විසින්ද රට භාරගෙන කරගෙන ගිය අතර ඔවුන්ව මගහැරුනාද යන්න විමසන ලදී. එමෙන්ම සියළු දෙනාටම නිදහසේ ජීවත් වීමට අයිතිය ඇති බව ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා පැවසුවත් අරලියගහ මංදිරයේ සිට සංවිධානය කරමින් නිදහසේ ගෙන ගිය අරගලයට පහර දෙමින් පහර කෑවේ කවුරුන්ද යන්න අමතක වී ඇති බව පවසන ලදී. එමගින් ලැබුනු වැරදි පරමාදර්ශ ඉදිරියට ගිය බව පැවසූ අතර නව ආණ්ඩු පක්ෂයේ ඇතැම් මන්ත්‍රීවරුන් පෙර පැවති පක්ෂ වල සාමාජිකයින් වී සිටි අතර සිදු වූ දේවල් සියසින් දුටු පසු වංචා දූශණය නොමැති පාලනයක් කරා ගමන් කිරීමට ජාතික ජන බලවේගයට සම්බන්ද වූ බව පවසන ලදී. ගරු මන්ත්‍රී කේ.වී.සුසන්ත පෙරේරා මහතා විසින් එකල සියළු මාර්ග සංවර්ධනය කලා යැයි පැවසූවත් දංකොටුව කර්මාන්තපුරයට ඇතුලුවන ප්‍රධාන මාර්ගයක් බොරළු දමා කිසිඳු සංවර්ධනයක් නොකල නමුත් නව ආන්ඩුව බලයට පත් වී මාස 05ක් ඇතුලත එම මාර්ගය බොරළු දමා සංවර්ධනය කලා පමණක් නොව ග්‍රාමීය ආර්ථික වැඩසටහන් යටතේ එම මාර්ගය වෙනුවෙන් මිලියන 14ක් වෙන් කර ඇති බව පවසන ලදී. එමෙන්ම ගොඩ්ෆ්‍රි ප්‍රනාන්දු මහතා වෙනුවෙන් උතුරු ඇටියාවල මාර්ගය නම් කර ඇති අතර එම මාර්ගය වර්ෂා කාලවලදී වැසි ජලයෙන් යටවන බැවින් එම මහතාගේ පුතුණුවන් විසින් එම මාර්ගය කොන්ක්‍රීට් දමා සංවර්ධනය කරන ලෙස ඉල්ලා ඇති අතර මීටර් 75ක් පමණ මේ වන විට කොන්ක්‍රීට් දැමීමට හැකි වී ඇති බව පවසන ලදී. එමෙන්ම ඉදිරියේදී ප්‍රාදේශීය සභාව සතු ප්‍රදේශ වැඩිදියුණු කිරීමට බලාපොරොත්තු වන බව අතර කසල රැස් කිරීමේ දී අයකරන ගාස්තුව පිළිබඳ විවිධ කතාවන් සිදුකළ නමුත් එම මුදල් රැස් කිරීම සිදුවන්නේ වරිපනම් කලාපයෙන් පිට කසල රැස් කරන නිවස් වලින් වන බව පවසන ලදී. එම නිවෙස් වලට මාසයකට දවස් 05ක් කසල ට්‍රැක්ටරය යන බැවින් මාසයකට රු.200 බැගින් අය කරන අතර එවැනි මුදලක් ගෙවීමට නොහැකි පිරිස්, සංවර්ධිතයි යැයි පැවසූ වෙන්නප්පු නගරය තුළ සිටිය හැකිද යන්න විමසන ලදී. නිදහස් පරිසරවේදියෙක් ලෙස පරිසර සංවිධාන ගණනාවක සේවය කරන අතර ජෛව විවිධත්වය පාලනය යනුවෙන් ලෝකයේ සිද්ධාන්තයක් ඇති අතර නිදසුනක් ලෙස ශ්‍රී ලංකාවේ මොණරගහනය වැඩි වී ඇති අතර අදාල ආයතන විසින්ම එම සතුන් වෙඩි තබා ඉවත් කරන අතර රටේ සංස්කෘතිය නිසා ඒ පිළිබඳ ජනතාවට නිරාවරණය නොකරන බව පවසන ලදී. ඒ අනුව දුම්මලදෙනිය කසල අංගනය අසල සුනඛයෙන් විශාල ප්‍රමාණයක් සිටින බැවින් ව්‍යාධිකරණය කිරීම කිසිදු ඵලක් නොමැති වී ඇති බැවින් එම සුනඛ ගැටලුව පාලනය කිරීමට නම් නිසි ක්‍රියාමාර්ගයක් අනුගමනය කල යුතු බව පවසන ලදි. එමෙන්ම විදුලි බිල සම්බන්ධයෙන් ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා විසින් ප්‍රකාශ කල

නමුත් නව ආණ්ඩුව පාලනයට පැමිණි පසු විදුලි බිල මෙන්ම ඉන්ධන බිලද යම්තාක් දුරට අඩු කල බව පවසන ලදි. ඒ අනුව පියවරෙන් පියවර ඉදිරියට යමින් රටේ ජනතාවට පහසුකම් සැලසීමට කටයුතු සිදු කරන බව පවසමින් කතාව අවසන් කරන ලදි.

ගරු මන්ත්‍රී එල්.සුසන්ත ශ්‍රීනාත් ප්‍රනාන්දු මහතා කතා කරමින්,1994 වර්ෂයේ දේශපාලන ගමන ආරම්භ කර අතර වසර ගණනාවක් විපක්ෂ මන්ත්‍රීවරයකු ලෙස සේවය කර සමගි ජන බලවේගයේ කණ්ඩායම් නායක ලෙස කටයුතු කිරීමට හැකි වූ බව පවසන ලදී. ගරු සභාපතිතුමා විසින් ලබා දුන් අයවැය කෙටුම්පත කිසිදු පැහැදිලිභාවයක් නොමැති අතර එම කඩදාසි ජනතාවගේ බදු මුදලින් ලබාගන්නා බැවින් නිසි ආකාරයට අය විවාදය පැවැත්විය හැකි ආකාරයන් ඒවා විපක්ෂ මන්ත්‍රීවරුන්ට ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටින ලදී. වෙනදා මහසභා පවත්වන ආකාරයට අයවැය පැවැත්විය නොහැකි අතර එම මෙහොතේ ලබා දුන් අයවැය සම්බන්ධ වාර්තා හරිහැටි අධ්‍යනය කිරීමට කාලයක් නොතිබුණු බව පවසන ලදී. මෙලෙස සිදු කළේ විපක්ෂයේ මන්ත්‍රීවරුනව අපහසුතාවයට පත් කිරීම විය හැකි බව පවසන ලදී. පෙර කාලවලදී අයවැය පණිවිඩය හා අයවැය කෙටුම්පත ඉදිරිපත් කළේ කෙසේද යන්න අධ්‍යයනය කර බලන ලෙස ගරු සභාපතිතුමාට පවසන ලදී. ආණ්ඩු පක්ෂය කිසිදු අර්ථයකින් හා ගරුත්වයකින් තොරව අයවැයට පැමිණ ඇති බව පැවසූ අතර ඉදිරියේදීවත් මෙලෙස විපක්ෂය අපහසුතාවයට පත් නොකරන ලෙස ඉල්ලා සිටින ලදී. 2015 වර්ෂයේ නඩත්තු හා අලුත්වැඩියා සඳහා රු.31,500,000ක් වෙන්කර ඇති අතර 2026 තුළ රු.30,500,000.00 වෙන්කර ඇති අතර වෙනස ලක්ෂ 35ක් වන බව පවසන ලදී. ඒ අනුව ලේකම්තුමා විසින් ඉදිරිපත් කළ අයවැයට වඩා වැඩි වී ඇත්තේ රු.150,000.00ක් බව පවසන ලදී. මෙලෙස වසර 04 සිදු කලත් විපක්ෂය එකල සිදු කල සේවාවන් වලට ළඟා වීමටත් නොහැකි බව පවසන ලදී. එමෙන්ම නිරෝෂන් පෙරේරා මහතාගේ පාලන කාලයේ මාර්ගය 1950 ක් සංවර්ධනය කළ අතර අතීතයේ පෙස්ටස් පෙරේරා මහතා විසින් ඉදිකළ දංකොටුව පොළ කෝටි 5.5 ප්‍රාග්ධන ආධාර ලබා ගනිමින් එය නිර්මාණය කළ බව පවසන ලදී. එමෙන්ම අද වන විට කසල රැගෙන යන ට්‍රැක්ටර් රථ අතීතයේදී නිරෝෂන් පෙරේරා මැතිතුමා මැදිහත් වී ලබාගත් බව පවසන ලදී. අතීතයේ පැවැති අයවැයට වඩා වර්තමාන අයවැය තුළ උත්පාදිත ආදායම වැඩි දියුණු කළ යුතු අතර ජනතාවට කසළ රැස් කිරීම, පෙර පාසල්, පුස්තකාල, හා පොළවල් නඩත්තු කිරීමට මුදල් සොයා ගත යුතු අතර ඒ සඳහා මුදල් වෙන් වී ඇති බවක් නොපෙනෙන බව පවසන ලදී. එමෙන්ම 2025 අයවැය තුළත් වෙළඳපොළ නඩත්තු එනම් මාළු කඩ වීදි ආලෝකකරණය ආදිය වෙනුවෙන් ලක්ෂ 47ක් වෙන් කර ඇති නමුත් 2026 වර්ෂය සඳහා වෙන්කර ඇත්තේ ලක්‍ෂ 24ක් බව පවසන ලදී. ඒ අනුව මේ පිළිබඳව දැකගත හැක්කේ දෙසැම්බර් 31 වන විට බව පවසන ලදී. දිනක් පැවති කාරක සභාවක් තුළ වෙනම පත්කර නියෝජිතයෙක් විසින් නිලධාරින් හොරු සේ සලකමින් ඔවුන්ගෙන් ප්‍රශ්න ඇසූ බව පවසන ලදි. එහිදි ඉදිරිපත් කල කරුණු වලට අනුව වසර අවසන් වන මොහොතේදි කම්මල්පත්තුව ප්‍රදේශයෙන් අය වී ඇති වරිපනම් මුදල් ප්‍රමාණය 22%ක් වන අතර අනෙක් ප්‍රදේශවලින් බවා කර්මාන්ත වලින් ලැබෙන ආදායමද අඩු වී ඇති බව පවසන ලදි. ඒ අනුව අප ප්‍රදේශයේ පමනක් නොව රටක් ලෙස ගත් කලද එදා 5.6% ක් තිබු ආර්ථික සංවර්ධන වේගය අද වන විට 4.9%ක් දක්වා පහල ගොස් ඇති බව පවසන ලදි. මෙලෙස ජන ජීවිතයේ ආදායම අඩු වීම තුලින් මිනිසුන්ට ජීවත් වී මට ඇති ආදායමද අඩු වන බව පවසන ලදි. ඒ අනුව මේ මොහොතේ රැස් කල නොහැකි වරිපනම් මුදල් ඉදිරියේදි රැස් කරනුයේ කෙසේද යන්න ගැටලුවක් ඇති බව පවසන ලදි. එමෙන්ම සුභසාධන කටයුතු සඳහා 2025 වර්ෂයේ අයවැය තුල රු.12,400,000.00ක් වෙන් කර ඇති නමුත් 2026 අයවැය තුල ඒ සඳහා වෙන කර ඇත්තේ රු.6,050,000.00ක් වන අතර ලක්ෂ 63.5ක වෙනසක් ඇති බව පවසන ලදි. පසුගිය කාලයේදි දරුවන් සඳහා පොත් රුපියල් ලක්ෂ 100ක් වැය කරමින් බෙදා දුන් අතර මෙවර එවන් දෑ දැකීමට නොමැති බව පවසන ලදි. එමෙන්ම එඑකල ජනතාවට බඩු මලු හා සහනාධාර ලබා දුන් නමුත් මෙවර එවැනි කිසිදු දෙයක් දක්නට නොමැති බව පවසන ලදි. එමෙන්ම ආණ්ඩු පක්ෂයේ කේමාව යටතේ ජීවත් වීමට සියලු දෙනාම කැමති නමුත් ඒ සඳහා රට ගමන් කරන බවක් නොපෙනෙන බව පවසන ලදි. වෙන්නප්පු නගරය තුල විශාල සංවර්ධනයක් හිටපු පාලකයින් විසින් සිදු කර ඇති අතර 2026 අයවැය තුල ප්‍රාග්ධන ආධාර කිසිවක් නොමැති බව පවසන ලදි. පසුගිය පාලන කාලය තුල රනිල් වික්‍රමසිංහ මහතා විසින් වත්කම් බැරකම් ප්‍රකාශ

ගෙන ඒමට අණ දුන් අතර ආණ්ඩු පක්ෂයේ පක්ෂයේ අයටත් ඒවා ලබා දීමට සිදු වූ බැවින් කෝටි ගණන් වත්කම් ඒ තුලින් එළිදරව් වූ බව පවසන ලදි. එමෙන්ම තොරතුරු ගෙන ඒමේ පනත ගෙන ඒම තුල ඕනෑම දෙයක් සම්බන්ධයෙන් ආයතනය තුල තොරතුරු ලබා ගත හැකි අතර ඒ සෑම දෙයක්ම එතුමන්ලාගේ රජය මඟින් සිදු කල දේවල් බව පවසන ලදි. එමෙන්ම සිරිගම්පල ජනපදයට ගරු පෙස්ටස් පෙරේරා මැතිතුමා විසින් ඉඩම් බෙදා දුන් අතර ගෙවල් 4000ක්ද බෙදා දුන් බව පවසන ලදි. එමෙන්ම හෙක්ටර් අප්පුහාමි මැතිතුමා විසින් ලක්ෂ 20ක් ලබා දෙමින් මාර්ග සංවර්ධනය කල බව පවසන ලදි. එමෙන්ම අමාත්‍යාංශ මඟින් ප්‍රාග්ධන ආධාර ලබා ගත් අතර එවන් දෙයක් මෙවර අයවැය තුල දක්නට නොලැබුනු බව පවසන ලදි. ඒ අනුව විපක්ෂයක් ලෙස 2026 අයවැයට විරුද්ධ බව පවසනමින් කතාව අවසන් කරන ලදි.

ගරු මන්ත්‍රී ඒ.ඒ.වොහාන් සංදීප් මහතා කතා කරමින්, 2026 අයවැය මෙය ඉතාමත් අභියෝගමත් අයවැයක් වන අතර ප්‍රධාන වශයෙන් මීට හේතු වන්නේ ඔවුන්ට ලැබෙන ප්‍රතිලාභ වල කප්පාදුවක් සිදුව ඇති බවත් රජයෙන් ලැබෙන වැටුප් ප්‍රතිපූර්ණය පිළිබඳ සලකා බැලීමේදී 2025 වර්ෂයට සාපේක්ෂව 2026 වර්ෂයේ මිලියන 50ක් පමණ කප්පාදුවක් සිදුවන අතර උසාවි දඩ මිලියන 40ක් පමණ කප්පාදුවක්ද සිදු වී තිබීම බව පවසන ලදි. සම්පූර්ණ ලෙස ගත් කල මිලියන 90ක පමණ පාඩුවක් සිදු වී ඇති නමුත් 2026 අයවැය පරතරය මිලියන 30ක් බව පවසන ලදි. මෙසේ වීම සඳහා වියදම් අඩු කර ගත්තා යැයි උපකල්පනය කර ගත හැකි අතර එමගින් මිලියන 30ක් ආවරණය කර ඉතිරි මිලයන 60 කෙසේ ගලපා ඇත්ද යන්න විස්තර කරන ලදි. 2026 වර්ෂයේදී මුද්දර ගාස්තු කෝටියකින් වැඩි විය හැකි බව පුරෝකථනය කර ඇති අතර තවමත් සභාව වෙත ලැබෙන්නේ 2024 වර්ෂයේ උසාවි දඩ වන අතර එම වසරේ දඩ එම වසර තුලම ලබා දීමට කටයුතු සූදානම් කර ඇති බැවින් 2024, 2025 හා 2026 යන වර්ෂ තුනේම මුද්දර ගාස්තු ලබා ගැනීමට හැකි බව පවසන ලදි. එවිට මිලියන 10ක් ලබා ගැනීමට හැකි වේ යැයි සිතිය හැකි අතර ඉඩම් බදු දීම සඳහා 1% අය කිරීම මගින් ලක්ෂ 36ක් ලබා ගැනීමට හැකි බව විෂය නිලධාරින් විසින් හඳුනාගෙන ඇති බව පවසන ලදි. පුරෝකතනයට වඩා අඩු අගයක් අයවැයට ඇතුලත් කර අැති බව දැනගත් අතර කඩ කුලි අය කර ගැනීමේදී නව තක්සේරුව අනුව ආදායම් වැඩි විය හැකි බව පුරෝකථනය කර ඇති බව පවසන ලදි. එය කෝටි 03ක් වැනි ප්‍රමාණයක් විය හැකි අතර මෙලෙස වැටුප් ප්‍රතිපූර්ණ හා උසාවි දඩ කප්පාදුවක් හා පාඩු සහිත ඉදිරියට යන සභාවක් ලෙස මෙසේ අභියෝගයකට මුහුණ පෑමට සිදු වී ඇති බව පවසන ලදි. එනම් 2025 වර්ෂයේදී 20%ක්ද, 2026 වර්ෂයේදී 40%ක්ද, 2027 වර්සයේ 60%ක්ද, 2028 වර්ෂයේ 80%ක්ද, 2029 වර්ෂයේදී 100%ක්ද, ලෙස වැටුප් ප්‍රතිපූර්ණය කප්පාදු වන බව පැවසූ අතර මෙලෙස අවසාන වර්ෂය වන විට අපගේ ඉලකක්ය වන්නේ සභාවේ සේවය කරන සියලුම සේවක මහත්ම මහත්මින්ගේ සම්පූර්ණ වැටුප් සභාව විසින් දැරිය යුතු බවයි යනුවෙන් ප්‍රකාශ කරන ලදි. අපේ රටේ ජාතික අයවැය යටතේද වැඩිපුර මුදලක් වෙන් කර ඇත්තේ ණය පොළි ගෙවීම සඳහා වන අතර මීළඟ වැඩිම වියදම වැටුප් ගෙවීම සඳහා බව පවසන ලදි. මෙම ක්‍රමය අවම කර ගැනීමට නැවත ණය නොගැනීමට හා පොළී නොගෙවීම සඳහා මෙම ක්‍රමය පරිවර්තනය කිරීමට රජය විසින් කටයුතු ආරම්භ කර ඇති බැවින් මේ සඳහා අපටද වගකීමක් දැරීමට සිදු වන බව පවසන ලදි. තවද කසල සඳහා ජනපද වලින් විශාල මුදලක් අය කිරීමට උත්සාහ කරන බව පවසා සිටියත් එය එසේ නොවන බවත් බල ප්‍රදේශයෙන් පිටත සිටින පවුල් කීපයක් මුදල් ගෙවා කසල ලබා දීමට කැමැත්ත එල කර සිටින අතර ඒ අයගෙන් රු.200 බැගින් අය කර ගත් විට රු.7,200,000.00ක් පමණ ආදායමත් ලැබෙන නමුත් ලක්ෂ 44ක් එයට ඇතුලත් කර ඇත්තේ අවමය සැපකීමෙන් බව පවසන ලදි. කසල සඳහා ලැබෙන මුදලින 50%ක ප්‍රමාණයක් සභා සේවක මහත්ම මහත්මින් වෙත බෙදා දීමට වෙන් කර ඇති අතර දංකොටුව ආයුර්වේදයෙන් මසකට රෝගීන් 12,000ක් පමණ ප්‍රතිකාර ලබා ගෙන ඇති අතර ඉන් 1%ක් මුදල් ගෙවා පංචකර්ම සිදු කර ගත හොත් ඒ සඳහා වෙන් කර ඇති මුදලද බලා ගැනීමට හැකි වන බව පවසන ලදි. තවද ආදායම් උත්පාදන ක්‍රම රාශියක් ආණ්ඩඅ පක්ෂය විසින් සැලසුම් කර ඇති අතර මෙම අපේක්ෂිත ආදායමට වඩා වැඩි ආදායමක් ගෙන ඒමට හැකියාවක් ලැබෙන බව විශවාසයෙන් යුතුව පවසන ලදි. එසේ ලැබෙන සෑම මුදලක්ම ප්‍රාග්ධන වියදම් සඳහා යෙදවීමට අදහස් කර ඇති අතර 2026 අයවැය සර්ව සම්පූර්ණ ප්‍රායෝගික අයවැයක් හා අභියෝගාත්මක අයවැයක් වන අතර සියලු සැලසුම් ක්‍රියාත්මක කර අනාගත පරම්පරාවට හොඳ ප්‍රාදේශිය සභාවක් දායාද කිරීමට සියලු දෙනාට ශක්තිය ධෛර්යය ප්‍රාර්ථනා කරමින් කථාව අවසන් කරන ලදි.

සියලු වාද විවාද අවසන් වූ පසු ගරු සභාපතිතුමා පවසා සිටියේ අයවැය සම්බන්ධයෙන් වාද විවාද රැසක් සිදු කල අතර බොහෝ මන්ත්‍රිවරු කතා කල කරුණු පළාත් පාලන පණතට අදාල නොවන බැවින් අයවැයෙන් පිටත කරුණු කාරණා ඉදිරිපත් කල අතර ඉදිරියේදි එය නිවැරදි විය යුතු බව බවයි. එමෙන්ම විපක්ෂයේ සෑම කතාවක් තුලම ආණඩු පක්ෂය විසින් බොරු පවසනවාය යන්න ඉස්මතු කිරීමට මහත් පරිශ්‍රමයක් දැරූ අතර නව ආණ්ඩුවට පෙර සිටි පාලකයින් විසින් ලබා දුන්න් පොහොසත් රටක් බව පෙන්වීමට විපක්ෂයේ මන්ත්‍රිවරුන් අයවැය විවාදය තුල පෙන්වීමට උත්සාහ කල බව පවසන ලදි. පොදුජන පෙරමුණ විසින් රනිල් වික්‍රමසිංහ මහතාව ජනාධිපති අසුනේ තැබුවාට පසු ලෝකයාට පැවුසුවේ මෙය බංකොලොත් රටක් බව රනිල් වික්‍රමසිංහ මහතා විසින් නිල වශයෙන් ප්‍රකාශ කල බව පවසන ලදි. එවන් රටක් භාර ගෙන මේ වන විට ගොඩනගමින් යන බව පවසන ලදි. පළාත් පාලන ආයතනවල වියදම් පියවීම සම්බන්ධයෙන් ගරු ජනාධිපතුතමා ඉදිරිපත් කල අයවැය ලේඛනයට අනුව "පළාත් පාලන ආයතන ස්වාධින බලතල සහිත ආයතනයන් වූ නමුත් වැටුප් ගෙවීමට පවා මහා භාණ්ඩාගාරයේ යැපෙන තත්ත්වයකට පත්කර තිබෙනවා. මහ භාණ්ඩාගාරයෙන් වැටුල් ගෙවීම සඳහා ප්‍රතිපාදන ලබා දීමේදි ඇස්තමේනතුවෙන් 20% හා 40% යන ප්‍රතිශතයන් අඩු කර ප්‍රතිපාදන ලබා දීමේ පවතින ක්‍රමය වෙනුවට නව ක්‍රමයක් හඳුන්වා දීමට යෝජනා කරනවා. ඒ අනුව රාජ්‍ය පරිපාන, පළාති සභා හා පළාත් පාලන අමාත්‍යාංශය මඟින් මෑතකදි සිදු කරන ලද අධ්‍යනය පදනම් කරගෙන පළාති පාලන ආයතනවල ආදායම් හා සත්‍ය වියදම් සැලකිල්ලට ගිනිමින් එක් එක් පළාත් පාලන ආයතන සඳහා රජයේ දායකත්වය ලබා දෙන විධිමත් ක්‍රමවේදයක් ආරම්භ කිරීමට යෝජනා කරනවා. එසේ කටයුතු කිරීමේදි යම් පළාත් පාලන ආයතනයක අයවැය හිඟයක් ඇති වුවහොත් එය පියවීම සඳහා මූලධන වියදම් වෙනුවෙන් ප්‍රතිපාදන ලබාදෙනවා. 2026 අයවැය මගින් පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීම. පළාත් පාලන ආයතනවල යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සහ ආදායම් උත්පාදන වැඩසටහන සඳහා රුපියල් මිලියන 2,500ක් වෙන කර තිබෙනවා." යනුවෙන් ප්‍රකාශ කරන ලදි. ඒ අනුව ගරු සභාපතිතිමු ඉදිරිපත් කල අයවැය ප්‍රකාශය තුල රජය විසින් මේ වන විට යන්ත්‍රෝපකරණ ලැයිස්තුව ලබාගෙන ඇති බව සඳහන් කර තිබූ අතර ගරු ජනාධිපතිතුමා විසින් ඉදිරිපත් කර ඇති අයවැය ප්‍රකාශය තුල ඇති කරුණ එයට සහතිකයක් වන බව පවසන ලදි. ඒ අනුව පළාත් පාලන ආයතනයක් ලෙස රජය විසින් ලබා දිය හැකි සියලුම පහසුකම් ලබා දී ඇති අතර ඔවුන් තනි වී නොමැති බව ගරු සභාපතිතුමා විසින් පවසන ලදි. එමෙන්ම කාර්යමණ්ඩලය සමඟ එක්ව අභියෝගාත්මක අයවැයක් සකස් කල අතර එම අභීයෝගය අනිවාර්යෙන්ම ජයලන්නා බව පවසන ලදි. එමෙන්ම මිලියන 454 සත්‍ය වාර්තාව ලෙස මීලඟ වසරේ දෙන විට මිලියන 500කට ලගා විය හැකි බව පවසන ලදි. ආණඩු පක්ෂය බලයට පැමිණ තවම මාස 05ක් පමණ වන අතර දූර්වල ආණඩුවක් ලෙස නම් කිරීමට විපකෂයේ මන්ත්‍රිවරුන් උත්සාහ කල නමුත් එය නිවැරදි නොවන බව සියලු දේ තුලින් සනාථ වී අවසන් බව පවසන ලදි. එමෙන්ම ඉදිරියේදි වෙන්නප්පුව ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ ජනතාවට මන්ත්‍රිවරුන් ලෙස සේවය කිරීමට අවශ්‍ය සහයෝගය ලබා දීමට සූදානම් බව පැවසූ අතර අයවය සම්බන්ධයෙන් කුමන මතයක් දැරුවත් සදාචාරාත්මක සහ සදාචාරයක් සහිත දේශපාලන ව්‍යාපාරයක් ලෙස මන්ත්‍රිවරුන් විසින් ගෙන එන යෝජනා ජනතාව වෙනුවෙන් ඉටුකරන බව පවසමින් අයවැය කෙටුම්පත සම්බනධයෙන් ඡන්ද විමසීමක් සිදු කරන ලදි. ඒ අනුව 2026 අයවැයට පක්ෂව ගරු සභාපති ටී.බී.ඩී.ඇන්ටනි කුමාර් මහතා, ගරු උප සභාපති එස්.ඒ.ඩී.ලාල් ප්‍රියන්ත සියඹලාපිටිය මයා, ගරු මන්ත්‍රී කේ.ඩිලාන් මලිත් බ්‍රවුන්සන් ප්‍රනාන්දු මයා, ගරු මන්ත්‍රී කේ.බී.වරුණ පෙරේරා මයා, ගරු මන්ත්‍රී ඒ.ඒ. විමුත් සුසන්ත අප්පුහාමි මයා, ගරු මන්ත්‍රී ඩී.මනෝජ් ඉන්දික මධුෂාන් පෙරේරා මයා, ගරු මන්ත්‍රිනී වයි.ටෙක්ලා ජයම්පති විජේසේකර මිය, ගරු මන්ත්‍රී සී.ජූඩ්. ප්‍රියදර්ශන ප්‍රනාන්දු මයා , ගරු මන්ත්‍රී අයි.පී. ප්‍රගීත් ධර්මජීව මයා, ගරු මන්ත්‍රී ජී.එම්.සඳුන් මධුමාල් ගම්පහ මයා, ගරු මන්ත්‍රී ආර්.එම්.අජිත් උදයසිරි රණතුංග මයා, ගරු මන්ත්‍රී කේ.එල්.සමන් රෝහිත මයා, ගරු මන්ත්‍රිනී එල්.ජයංගා රුවනාරි ප්‍රනාන්දු මිය, ගරු මන්ත්‍රිනී පී.කේ.හසංකා සෙව්වන්දි දයාරත්න මිය, ගරු මන්ත්‍රී එම්.සුරංගා රනිල් ක්‍රිෂාන්ත ප්‍රනාන්දු මයා, ගරු මන්ත්‍රී ජගත් කීර්ති කුමාර අබේරත්න මයා, ගරු මන්ත්‍රිනී ඒ.එම්.මනෝරි එරන්දති මිය, ගරු මන්ත්‍රී ජේ.එම්.ජනක චමින්ද ජයසේකර මයා, ගරු මන්ත්‍රී කේ.අජිත් නිශාන්ත ප්‍රනාන්දු මයා, ගරු මන්ත්‍රී ඒ.ඒ.චොහාන් සන්දීප් මයා, ගරු මන්ත්‍රී කේ.එල්.ඩී.ජී.සංජය අප්පුහාමි මයා, ගරු මන්ත්‍රිනී ඩී.කේ.ඩී.අයෝධා ගිත්මි මෙනවිය, ගරු මන්ත්‍රී ඒ.එච්.ගාමිණී රෙක්ස් ප්‍රනාන්දු මයා, ගරු මන්ත්‍රී ඩබ්.දිනේෂ් සංජීව ප්‍රනාන්දු මයා සහ ගරු මන්ත්‍රී ආර්.එම්.ශ්‍යාම් පෙරේරා මයා

ඡන්දය ප්‍රකාශ කල අතර, ගරු මන්ත්‍රී ඩබ්.ඇලේක්ස් නිශාන්ත ප්‍රනාන්දු මයා, ගරු මන්ත්‍රී එල්.සුසන්ත ශ්‍රීනාත් ප්‍රනාන්දු මයා, ගරු මන්ත්‍රී කේ.වී.සුසන්ත පෙරේරා මයා, ගරු මන්ත්‍රී බී.ඒ.එස්. සාන්ත පෙරේරා මයා, ගරු මන්ත්‍රී ආර්.පී.අකිල ශිරංග රාජපක්ෂ මයා, ගරු මන්ත්‍රී ඩබ්.ඒ.ආර්.ෂවීන් ප්‍රනාන්දු මයා, ගරු මන්ත්‍රිනී අයි.නයෝමි රම්‍යලතා මිය, ගරු මන්ත්‍රිනී ජේ.කේ.දීපා මේරි අයිරාංගනී පෙරේරා මිය, ගරු මන්ත්‍රී ජී.ලලිත් ඔස්කා පෙරේරා මයා, ගරු මන්ත්‍රී ඩී.මලිත් සමීර පෙරේරා මයා, ගරු මන්ත්‍රී ජේ.පී.උපාලි සඳසිරි මයා, ගරු මන්ත්‍රී එස්.ඒ.අජිත් අමරජීව මයා, ගරු මන්ත්‍රිනී කේ.ඒ.ඩී.ශ්‍රීමාලි ඉන්ග්‍රීට් මිය, ගරු මන්ත්‍රිනී ජේ.ඒ.ඩී.ජසින්තා ඉන්ද්‍රානි මිය, ගරු මන්ත්‍රිනී ආර්.පී.මෙලනි චතුරිකා රන්තිලක මිය, ගරු මන්ත්‍රී සුධීර ප්‍රදීප් රණසිංහ මයා, ගරු මන්ත්‍රී එස්.ඒ.දීපාල් මයා, ගරු මන්ත්‍රී එම්.පී.බ්‍රයන් පෙරේරා මයා සහ ගරු මන්ත්‍රී ඩබ්.විමලසිරි පෙරේරා මයා සභා ගර්භයේ නොසිටින ලදි. ඒ අනුව සභාවේ රැඳි සිටි සියලුම දෙනාගේ එකඟතාවයෙන් 2026 අයවැය ඒකමතිකව සම්මත විය.

**5. කාරක සභා වාර්තා සලකා බැලීම.**

a) 2025.10.16 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා වාර්ථාව සලකා බැලූ අතර අදහස් ඉදිරිපත් කිරීමක් සිදු නොවීය.

b) 2025.10.21 දින පැවති කාර්මික සේවා කාරක සභා වාර්ථාව සලකා බැලූ අතර අදහස් ඉදිරිපත් කිරීමක් සිදු නොවීය.

c) 2025.10.16 දින පැවති පරිසර සහ මහජන සෞඛ්‍ය පහසුකම් පිළිබඳ කාරක සභා වාර්ථාව සලකා බැලූ අතර අදහස් ඉදිරිපත් කිරීමක් සිදු නොවීය.

d) 2025.10.22 දින පැවති ප්‍රජා සංවර්ධනය පිළිබඳ කාරක සභා වාර්ථාව සලකා බැලූ අතර අදහස් ඉදිරිපත් කිරීමක් සිදු නොවීය.

e) 2025.10.24 දින පැවති පොදු පහසුකම් සංවර්ධන හා ආපදා කළමනාකරණ කාරක සභා වාර්ථාව සලකා බැලූ අතර අදහස් ඉදිරිපත් කිරීමක් සිදු නොවීය.

f) 2025.10.07, 2025.10.14, 2025.10.23 හා 2025.10.28 දින පැවති ටෙන්ඩර් කමිටුව

ගරු මන්ත්‍රිනී අයි.නයෝමි රම්‍යලතා මිය කතා කරමින්, ටෙන්ඩර් කමිටුව පිළිබඳ ගැටලුව මුල සිටම පැවතුනු බැවින් උප සභාපතිතුමිගෙ අවශ්‍යතාවය යනුවෙන් මේසයක් මිලදී ගැනීමක් සඳහන් වී ඇති බව වාර්තාවේ සඳහන් වී ඇති අතර එහි ගැටලුවක් නොමැති බව පවසූ අතර මේ වන තුරු සිටි උප සභාපතිවරුන් සඳහා ආසනයක් වෙන් වී නොතිබුනේද? නැතහොත් මෙය අලුතින් ඇති වූ අවශ්‍යතාවයක්ද යනුවෙන් ප්‍රශ්න කිරිමට විපක්ෂයේ කිසිදු අයෙක් ටෙන්ඩර් මණ්ඩලයේ නොසිටි අතර විපක්ෂයේ නියෝජනයක් ටෙන්ඩර් මණ්ඩලයේ තිබුනේ නම් මෙවැනි ප්‍රශ්නයක් ඇසීමට ඉඩ තිබෙනු ඇතැයි පවසන ලදි. ඒ අනුව විපක්ෂයේ සාමාජිකයන් ටෙන්ඩර් මණ්ඩලයේ සිට යුතුයි යන හේතුවට ඉහත කරුණ එකතු කල බව පවසන ලදි.

එමෙන්ම ඉඩම් වෙන්දේසි කිරීමේ ආකෘතියෙහි ලබා ගන්නාගේ නම හා වෙන්දේසි මුදල ඇතුලත් කර ඇති අතර අවම තක්සේරු මුදලද ආකෘතියට ඇතුලත් කල යුතු බව පවසන ලදි.

ගරු සභාපතිතුමා කතා කරමින්, ටෙන්ඩර් මණ්ඩලයෙ වාර්තාව තාක්ෂණික ඇගයීම් කමිටුවට යොමු කර ඇති අතර දැනට ඇති උපසම්පාදන ක්‍රියාවලියට අදාලව සම්පූර්න කල යුතු නව මාර්ගෝපදේශයේ නීති රීති දැඩිව ඇති බැවින් තාක්ෂණික ඇගයම් කමිටුවට නම් කිරීමෙදිත් සමහර පිරිවිතර වලට අදාලව නිලධාරින නොමැති වුවත් ඒවාට අදාල කමිටු පත් කිරීමට සූදානම් කර ඇති අතර ඒ සඳහා දැනුම ඇති

අයව පත් කිරීමට අවශ්‍ය කටයුතු මේ වන විට සූදානම් කර ඇති බව පවසන ලදි. ඒ අනුව සෑම දෙයක්ම තාක්ෂණික ඇගයීම් කමිටුව හරහා සිදු කරන අතර ටෙන්ඩර් කමිටුව නියෝජනය නොකලත් ඕනෑම අවස්ථාවක ප්‍රශ්න කිරීමේ අවස්ථාව ඕනෑම අයෙකුට හිමි බව පවසන ලදි. එමෙන්ම ඉහත ප්‍රශ්න කිරීම් සිදු කිරීම වෙනුවෙන් ගරු මන්ත්‍රිනී අයි.නයෝමි රම්‍යලතා මියට ස්තුති කරන ලදි.

ඉන්පසු ගරු මන්ත්‍රී එම්.පී.බ්‍රයන් පෙරේරා මහතා විසින් එතුමා ඉදිරිපත් කල යෝජනාව සභාවට ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටින ලදි.

එනම් වෙන්නප්පුව ප්‍රාදේශිය සභාව මඟින් ඉදිරි වර්ෂයේදි පක්ෂ විපක්ෂ භේදයකින් තොරව සෑම මන්ත්‍රිවරයෙක් හා මන්ත්‍රිවරියක් සඳහා වර්ප්‍රසිද ලබා දීම පිළිබඳව ගරු මන්ත්‍රී එම්.පී.බ්‍රයන් පෙරේරා මහතා විසින් යෝජනාවක් ඉදිරිපත් කරන ලදි.

ගරු සභාපතිතුමා පවසා සිටියේ මෙවැනි යෝජනාවක් ලබා දීම සුදුසු නොවන අතර පක්ෂ විපක්ෂ යනුවෙන් භේදයක් නොමැති බැවින් විශේෂ වරප්‍රසාද කිසිදු අයෙකුට හිමි නොවන අතර සියලු දෙනාම සම වරප්‍රසාද හිමි වන බව පවසන ලදි. එම නිසා ගරු මන්ත්‍රී එම්.පී.බ්‍රයන් පෙරේරා මහතා විසින් ඉදිරිපත් කල යෝජනාව සභාගත නොකල බව පවසන ලදි.

ගරු මන්ත්‍රී එම්.පී.බ්‍රයන් පෙරේරා මහතා පවසා සිටියේ ඇතැම් දේවල් විපක්ෂ මන්ත්‍රිවරුන් ලෙස ඔවුන්ට නොලැබෙන අතර දිනක් එතුමා කුරුණෑගල ගොස් සිටින මොහොතක පෙර දිනකදි ඉල්ලා සිටි බැකෝයන්ත්‍රය එතුමා නැති මොහොතේ ලබා දී ඇති බව පවසන ලදි. මෙලෙස එතුමා වර්තමානයේ ඉල්ලා සිටින්නේ 2022 වර්ෂයේ වත්මන් ගරු සභාපතිතුමා එකල මන්ත්‍රිවරයෙකු ලෙස සිටි කාලයේදි ඉල්ලා සිටි දේවල්ම වන අතර වෙනසසකට ඇත්තේ ගරු සභාපතිතුමා විසින් එකල වාචිකට ඉල්ලා ඇති දේ ගරු මන්ත්‍රී එම්.පී.බ්‍රයන් පෙරේරා මහතා විසින් ලිඛිතව ලබා දීම බව පවසන ලදි.

ගරු සභාපතිතුමා පවසා සිටියේ 2022 වර්ෂයේදි තමා මන්ත්‍රිවරයෙකු ලෙස සිටි කාලයේදි වරප්‍රසාද නොතිබුනු නමුත් වර්තමානයේ සියලුම මන්ත්‍රිවරුන්ට සම වර්ප්‍රසාද හිමි බවයි.

ගරු උප සභාපති එස්.ඒ.ඩී.ලාල් ප්‍රියන්ත සියඹලාපිටිය මහතා කතා කරමින්, ප්‍රාදේශිය සභාව සතුව ඇත්තේ යන්ත්‍රෝපකරණ සීමිත ප්‍රමාණයක් වන බැවින් එක් එක් මන්ත්‍රිවරුන්ට යන්ත්‍රෝපකරණ ලබා නොදෙන අතර ඒවා කොට්ඨාස මට්ටමින ලබ් දෙන බව පවසන ලදි. ඒ අනුව ගරු මන්ත්‍රී එම්.පී.බ්‍රයන් පෙරේරා මහතාගේ ඉල්ලීම මත ගලයාය ජනපදයේ කාණුව පිරිපහදු කිරීමට බැකෝයන්ත්‍රය ලබා දුන් නමුත් එතුමා එම මොහොතේ නොසිටි බව පවසන ලදි. නමුත් යන්ත්‍රෝපකරණ ලබා දිය හැකි දිනයක් ඇති බැවින් ඉල්ලු සැනින් ඒවා ලබා දිය නොහැකි අතර යන්ත්‍රෝපකරන ලබා දීමට සකසා ඇති ලැයිස්තුව අනුව ඒවා ලබා දෙන බව පවසන ලදි.

එවිට ගරු මන්ත්‍රී එස්.ඒ.අජිත් අමරජීව මහතා විමසා සිටියේ වසර 04 සම්පූර්ණ වීමට ප්‍රථම යන්ත්‍රෝපකරණ ඔවුන්ට ලබා දෙනවාද යන්නයි.

ගරු උප සභාපති එස්.ඒ.ඩී.ලාල් ප්‍රියන්ත සියඹලාපිටිය මහතා පවසි සිටියේ ගරු මන්ත්‍රී එස්.ඒ.අජිත් අමරජීව මහතා විසින් ඉල්ලා සිටි ආකාරයට අදාල කටයුතු සිදු කර දුන බවයි. එහෙත් ගරු මන්ත්‍රී එස්.ඒ.අජිත් අමරජීව මහතා පවසා සිටියේ අදාල කටයුත්ත තවම සිදු නොවී ඇති බවයි.

ගරු මන්ත්‍රී ඩබ්.විමලසිරි පෙරේරා මහතා යෝජනා කර සිටියේ යන්ත්‍රෝපකරණ ලබා දීමේ ලැයිස්තුව වට්ස්ඇප් හරහා සියලු දෙනාට ලබා දීමට කටයුතු කරන ලෙසයි.

එහෙත් ගරු සභාපතිතුමා පවසා සිටියේ එහි ප්‍රායෝගික ගැටලු ඇති බවයි. එනම් පන්සල්වල කඨින පිංකම්, දේවස්ථානවල මංගල්‍ය සහ තවත් අවස්ථාවල යන්ත්‍රෝපකරණ අබලන් වීම හේතුවෙන් මාසිකව ලේඛනයක් පවත්වාගෙන යාම අසීරු බව පවසන ලදි.

ගරු මන්ත්‍රී ආර්.පී.අකිල ශිරංග රාජපක්ෂ මහතා පවසා සිටියේ සභාව සතු යන්ත්‍රෝපකරණ පොදු වැඩවලට යන අතරතුර පෞද්ගලික වැඩවලටද යොදා ගන්නා බවයි. එනම් කටුකෙන්ද කොට්ඨාසයේ මහත්මයෙකුගේ නිවසට යන මාර්ගයේ ප්‍රාදේශීය සභාව සතු බැකෝයන්ත්‍රය මඟින් කපා ඇති අතර එය කුමන පදනම මත සිදු වූයේද යන්න නොදන්නා බව පවසන ලදි.

ගරු මන්ත්‍රිනී ඒ.එම්.මනෝරි එරන්දති මිය පවසා සිටියේ එම මාර්ගය එක් නිවසකට පමණක් ගමන් කරන මාර්ගයක් නොවන අතර තවත් ඉඩම් වලට ගමන් කරන පොදු මාර්ගයක් වන බව ප්‍රකාශ කරන ලදි.
ගරු මන්ත්‍රී ආර්.පී.අකිල ශිරංග රාජපක්ෂ මහතා පවසා සිටියේ එම මාර්ගය ඔස්සේ ගමන් කරන ඉඩම් එම පුද්ගලයාට අයිති ඉඩම් වන බවත් රජයට ගෙවිය යුතු බදු මුදල් පවා නොගෙවමින් ඉඩම් ලබා ගත් බවයි. ඒ අනුව එම මාර්ගය පෞද්ලික මාර්ලයක් බව නැවත පවසන ලදි.

ඝෝෂාව

ගරු මන්ත්‍රී එම්.පී.බ්‍රයන් පෙරේරා මහතා පවසා සිටියේ යන්ත්‍රෝපකරණ සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාව බොරුවක් කරනවා හෝ අයවැය බොරුවක් විය හැකි බවයි.

## 6. ආදායම්/වියදම් වාර්තා හා වෙනත් වාර්තා සලකා බැලීම

1) 2025 සැප්තැම්බර් මස වියදම් වාර්තාව සලකා බැලූ අතර අදහස් ඉදිරිපත් කිරීමක් සිදු නොවීය.
2) 2025 සැප්තැම්බර් මස ආදායම් වාර්තාව සලකා බැලූ අතර අදහස් ඉදිරිපත් කිරීමක් සිදු නොවීය.
3) සැප්තැම්බර් මස විදුලි පහන් නඩත්තුවට අදාල ප්‍රගති වාර්තාව සලකා බැලූ අතර අදහස් ඉදිරිපත් කිරීමක් සිදු නොවීය.
4) සැප්තැම්බර් මස වාහන ධාවනයට අදාල වාර්තාව සලකා බැලූ අතර අදහස් ඉදිරිපත් කිරීමක් සිදු නොවීය

## 7. වෙනත් කරුණු

<u>ගරු මන්ත්‍රී එම්.පී.බ්‍රයන් පෙරේරා මහතා</u>

i. 1988 ප්‍රාදේශීය සභා රීති යටතේ මහ සභාව පවත්වා ගෙන යාමට කටයුතු කිරීම සම්බන්ධව අදහස් ඉදිරිපත් කිරීම.

- ගරු මන්ත්‍රී එම්.පී.බ්‍රයන් පෙරේරා මහතා කතා කරමින්, සභා රීති කිසිදු අයෙකුට ඉගැනවීමට අරමුණක් නොමැති අතර තමා විසින්ම අධ්‍යනය කරනු ලබන්නේ හේතු 05ක් පදනම් කරගෙන බව පවසන ලදි. එනම් 1988 ජනවාරි 13 වන දිනඅ අංක 48 (16) දරණ අති විශේෂ ලැසට් පත්‍රයෙහි ඒවා ඇති අතර එය රටේ නීතිමය අවස්ථාවක් බව පවසන ලදි. ඒ අනුව රටේ නීති පිලිපැදිය යුතුය යන්න ප්‍රකාශ කල අතර "අපි පිස්සෝ නෙමෙයි" යනුවෙන් ප්‍රකාශ කරන ලදි. එමෙන්ම මිනිසුන් සිතන ආකාරය වෙනස් වන

නමුත් රීති මඟින් සිදු කරනුයේ සියලු දෙනාවම එකම තලයකට ගෙන ඒම බව පවසන ලදි. පෙර කාලයේදි පැවති රීති පවත්වාගෙන යාමට වත්මන් ගරු සභාපතිතුමා බොහෝ වෙහෙස වී ඇති අතර ඒ වෙනුවෙන් එතුමාට ස්තූතිය පුද කරන ලදි. ඒ අනුව පෙර සභාවල්වල මෙම රීති පවත්වාගෙන ගිය නිසා අද වන විට සභාව තුල කතා කිරීමට අවස්ථාව රැදි ඇති බව පවසන ලදි. එමෙන්ම යම්කිසි පෙත්සමක්,ලිපියක් යොමු කිරීමට අවස්ථාව ඇති අතර එය එම මොහොතේ කාරක සභා වලට යොමු කිරීමට කටයුතු කිරීම තුලින් වාසියක් ඇති වන බව පැහැදිලි කරන ලදි. අනාගතයේදි නව මන්ත්‍රිවරුන් හට අතීතයේ මන්ත්‍රිවරුන් විසින් මෙලෙස රීති පිලිබඳ කතා කර ඇති බවත් එම කටයුතු සිදු කර ඇති බවත් සහ ඒ සඳහා එකල ගරු සභාපතිතුමා විසින් ඒ සඳහා ඉඩ දී ඇති බවත් දැනගන්නට ලැබෙනු ඇතැයි පවසන ලදි.

ii. පොදු පහසුකම් සංවර්ධන හා ආපදා කළමනාකරණ කාරක සභාව ප්‍රයෝජනවත් සහ කාර්යක්ෂමව පවත්වාගෙන ගැනීම සම්බන්ධව.

- ගරු මන්ත්‍රී එම්.පී.බ්‍රයන් පෙරේරා මහතා කතා කරමින්, පොදු පහසුකම් යටතේ විශාල වපසරියක් ඇති අතර වෙළඳපොළ ගත් කල මස් වෙළඳසැල් හා මාළු වෙළඳසැල් පිළිබඳ නිරීක්ෂණය කර වාර්තාවල් ලබා දිය යුතු අතර වීදි ආලෝකකරණය හා පානීය ජලය ආදි වශයෙන් විශාල මූලාශ්‍රයක් ඇති බව පවසන ලදි. මේ සියලු දේ සිදු කරගෙන යාමේදි විශාල වැඩකටයුත්තක් ඇති බව පවසන ලදි. මේවා සිදු කරගෙන යාමේදි අදාල වාර්තාවල් ගරු සභාපතිතුමාට යොමු කල යුතු අතර ඉදිරියට කල යුතු දෑ පෙල ගැස්වීමට ඇති අතර සැලසුමක් නොමැතිව ඉහත කටයුතු සිදු කල නොහැකි අතර එම සැතසුම් ක්‍රියාත්මක කරනුයේ ඉදිරි වසර 04න් පසුව නම් ආණ්ඩු පක්ෂයට එයට ඉඩක් නැති වන්නට තිබෙනු ඇතැයි පවසන ලදි. එම නිසා මේ සියල්ල හඳුනා ගනිමින් එකින් එක අධ්‍යයනය කරමින් කටයුතු කල යුතු අතර නිදසුනක් ලෙස ගරු මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.ෂවීන් ප්‍රනාන්දු මහතාට පසුව ගරු මන්ත්‍රී එම්.පී.බ්‍රයන් පෙරේරා මහතාට ලබා දෙන බව පැවසුවහොත් එය එසේ සිදු කල යුතු අතර අදාල ලැයිස්තු එක් එක් අයගේ සාක්කු තුල තබාගෙන කටයුතු කිරීම සුදුසු නොවන බව පවසන ලදි. ඒ අනුව එතුමා පවසා සිටියේ පොදු පහසුකම් කාරක සභාව තුල නිවැරදි අයුරින් කටයුතු සිදු වන්නට අවශ්‍ය අතර එහි අරමුණ තමාට ලකුණක් ලබා ගැනීමටවත් මීලඟ වාරයේදි ඡන්ද ලබා ගැනීමටවත් නොවන බවයි. එමෙන්ම පොදු පහසුකම් සංවර්ධන හා ආපදා කළමනාකරණ කාරක සභා සභාපතිතුමා අවංක පුද්ගලයෙක වන අතර මෙම පැහැදිලි කිරීම සිදු කලේ නිවැරදි සැලැස්මකට අනුව කටයුතු කිරීමට වන බව පවසන ලදි. එමෙන්ම පක්ෂ විපක්ෂ භේදයකින් තොරව ඉල්ලන දෑ ලබා දෙන ලෙස ඉල්ලා සිටි අතර සමහර අවස්ථාවල කොට්ඨාස භාර මන්ත්‍රිවරයා නොදන්නා දේ අනෙක් මන්ත්‍රිවරයා දැන සිටීමටත් පුලුවන් බැවින් සිමුහිකව කටුයුතු කිරීමට එමඟින් පුළුවන් වන පව පවසන ලදි.

<u>ගරු මන්ත්‍රිනී ජේ.කේ.දීපා මේරි අයිරාංගනී පෙරේරා මිය</u>

- ගරු මන්ත්‍රිනී ජේ.කේ.දීපා මේරි අයිරාංගනී පෙරේරා මිය කතා කරමින්, ක්‍රීඩා අමාත්‍යාංශයේ මැදිහත්වීම මත ගිවිසුම්ගත වීමෙන් පසු ලක්ෂ 44ක් ලබා දුන් අතර එම යෝජනාව ප්‍රදීපා ක්‍රීඩාංගනය සංවර්ධනය සඳහා පැමිණි අතර හිටපු සභාපතිතුමා මැදිහත් වී ක්‍රීඩා සමාජයේ යෝජනාව මත ක්‍රීඩාංගනයේ වැට සෑදීමට ආරම්භ කල බව පවසන ලදි. එහි කාල වකවානුව තුල කොරෝනා වසංගතය පැමිණි බැවින් කාන්තාවන් විසින් යිටපු ගරු සභාපතිතුමාට ඇවිදින මංතීරුව සාදා දෙන ලෙස ඉල්ලා සිටින ලදි. ඉන්පසු වැට සකසන අතරතුර ඇවිදින මංතීරුව සෑදීමට ලිපි ලබා දුන් බැවින් ගමේ ජනතාවගේ මැදිහත් වීම මත එම මංතීරුව ඉදි කිරීමට හැකි වූ බව පවසන ලදි. ඒ අනුව හිටපු ගරු සභාපති කේ.වී.සුසන්ත පෙරේරා මහතා විසින් මුල් ගල තබන මොහොතේ සොලා ලයිට් සවි කර කැටගල් අල්ලා මංතීරුව සාදන බවට කාන්තා පක්ෂය ගෙන්වා යෝජනාවක් ඉදිරිපත් කල බව පවසන ලදි. එහෙත් හිටපු වැඩ අධිකාරි අසේල මහතාගෙන් මේ පිළිබඳ විමසීමේදි කුරුණෑගලින් එවූ චක්‍රලේඛයට අනුව කැටගල් ඇල්ලීමට අවසර නොමැති අතර මුහුදු වැලි දමා සකස් කර දීමට හැකි බවට ප්‍රකාශ කල බව එතුමිය පවසන ලදි. එහෙත්

එල්ලේ ක්‍රීඩකයින්ගේ ගැටලු නිසා එම මංතීරුව දිගටම ඉදි කිරීමට නොහැකි වූ බව පවසන ලදි. ඉන්පසු කොරෝනා වසංගතය පැමැණි බැවින් එම මංතීරුව ප්‍රයෝජනයට ගැනීම අඩු වූ බැවින් එහි කැළැ වන්නට පටන් ගත් අතර දෙවරක් පමණ එය ශුද්ධ පවිත්‍ර කල බව පවසන ලදි. මේ සියලු දෙයින් පසු මෙම ක්‍රීඩාංගනයට වෙන් කල මුදල් අවභාවිතා කල බවට එතුමියට චෝදනා කර ඇති අතර එකල එම කොන්ත්‍රාත්තුව සිදු කරනු ලැබුවේ පොන්නම්පෙරුම සප්ලයර්ස් විසින් වන අතර එයට අදාල ලිපි ගොනුව තාක්ෂණික අංශය සතුව පවතින බව පවසන ලදි. එමෙන්ම පුත්තලම දිස්ත්‍රික්කයේ ක්‍රිඩා අමාත්‍යාංශයේ සභාපතිවරයා සහ ප්‍රදීපා ක්‍රීඩා පිටියේ ක්‍රිඩා සමාජයේ රුවන් මහතාව ගෙන්වා ඉහත මුදල ගමෙන් පිටට යාමට ඉඩ නොදී කොට්ඨාසයට යමක් කල යුතු බව එතුමිය ඔවුන්ට ප්‍රකාශ කල බව පවසන ලදි. ඒ මත පදනම් වී ඉහත වැඩකටයුතු ආරම්භ කල බව පැවසූ අතර එම මංතීරුව ඉදි කරනු ලැබුවේ ගමේ ජනතාවගේ ඉල්ලීම මත බව නැවත ප්‍රකාශ කරන ලදි.

ඉන් පසු සියලු දෙනාටම ස්තූතිය පළ කරමින් ගරු සභාපතිතුමා විසින් ප.ව 4.00ට පමණ මහ සභාවේ වැඩ කටයුතු අවසන් කරන ලදි.

ටී.බී.ඩී ඇන්ටනි කුමාර්
සභාපති,
වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව.